# දෙසතිය

පුවත් සඟරාව
2026 මැයි

## ලොව සසැලේ
## රට නොසැලේ



# පිටබැද්දර ජලකඳ





මෙතෙක් ශ්‍රී ලංකාවෙන් හමු වූ විශාලතම ජල මූලාශ්‍රය පිටබැද්දර ප්‍රදේශයෙන් සොයා ගැනීමට ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලය සමත් වී තිබෙනවා. ඒ, මාතර දිස්ත්‍රික්කයේ පිටබැද්දර පොලිසිය අසල නළ ළිඳක් කැණීමේදී.

මේ භූගත ජල මූලාශ්‍රය විනාඩියකට ජලය ලීටර් 10,000ක්, එනම් ඝන මීටර් 10ක ජල ප්‍රවාහයක් ලබා දෙනවා. මෙතෙක් ශ්‍රී ලංකාවේ හමු වී තිබූ විශාලතම ජල මූලාශ්‍රය වූයේ මඩු ප්‍රදේශයේ. එය ලබා දෙන්නේ විනාඩියකට ලීටර් 7000ක ජල ප්‍රවාහයක්. 90%ක් රටවල් භූගත ජලය පාවිච්චි කරන අතර ඒවා පිරිසිදු කර පානීය ජලය වශයෙන් ලබා දෙනවා.

මේ පිටබැද්දර භූගත ජල මූලාශ්‍රයෙන් පිටබැද්දර, මොරවක අවට ප්‍රදේශවලට මෙන් ම ජල හිඟය පවතින වෙනත් ප්‍රදේශවලට ද ජලය ලබාදීමයි ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලයේ බලාපොරොත්තුව.

**ඩබ්ලිව්. එම්. ශාන්තප්‍රිය**

# දෙසතිය
පුවත් සඟරාව

වෙළුම 48, කලාපය 05,
2026 මැයි

**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,**
163, කිරුළපන ඇවනිව්,
පොල්හේන්ගොඩ, කොළඹ 05.

**සංස්කරණ මණ්ඩලය**
දු. අ. 011 - 2513757 / 0112 - 513153
Email - desathiya@gmail.com
බෙදාහැරීම - ප්‍රකාශන කාර්යාංශය
දු. අ. 011 - 2512759

උපදේශක සංස්කාරක
**එච්. එස්. කේ. ජේ. බණ්ඩාර**
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

අංශ ප්‍රධානී - දෙසතිය
**ඩබ්. එම්. ශාන්තප්‍රිය**

සංස්කාරක
**මාලා මල්කාන්ති පරණගමගේ**

රූ රටා සංස්කාරක
**සංජීව පෙත්තාවඩු**

විශේෂාංග ලේඛක
**රංගිකා අබේසේකර**

ඡායාරූප
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඡායාරූප අංශය**

මුද්‍රණය
**ආර්. එස්. ප්‍රින්ටෙක් (පුද්) සමාගම**
නො. 765/2, වඩුවේගම පාර, මල්වාන

ප්‍රකාශනය හා බෙදාහැරීම
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**

**හිතවත් පාඨකයිනි,**
48 වසරක් ඔබ වෙත දැනුම ලබාදුන් 'දෙසතිය' පුවත් සඟරාව වෙත පාඨක ඔබගේ අදහස් කෙටියෙන් ලියා තැපැල් ලිපිනයට හෝ විද්‍යුත් තැපැල් ලිපිනයට හෝ යොමු කරන්න
**සංස්කාරක**

මෙහි පළ වන ඇතැම් ඡායාරූප අන්තර්ජාලයෙන් ලබාගත් ඒවා වන අතර ඒවායේ අයිතිය මුල් හිමිකරු සතු යි.

## කවරයේ කතාව




21 ලොව සසැලේ රට නොසැලේ



16 කලාපීය යුද්ධයේ ගෝලීය අර්බුදය



03 නවතින්න හිතෙන නැවතුම්පොළ



36 අතීතකාමියෙකුගේ සෙලෝලයිඩ් කැරැල්ල



14 පවිටු දම් දුරලා ගිය සාම චාරිකා
ඒහිපස්සිකෝ




40 බලය පරයන ජවය

# දෙසතිය
පුවත් සඟරාව


## නිදහසේ භාෂණය හා ප්‍රකාශනය

ලෝක ජනමාධ්‍ය නිදහස් දිනය (World Press Freedom Day) සෑම වසරක ම මැයි මස 03 දිනට යෙදී තිබෙනවා. 1993 මැයි 03 දින සිට සැමරෙන එහි මෙවර (2026) තේමාව ලෙස ගැනෙනනේ 'Shaping a Future at Peace: Promoting Press Freedom for Human Rights, Development and Security යන්න.

මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ 19 වැනි වගන්තියේ මානව හිමිකමක් ලෙස අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස තහවුරු කර තිබෙනවා මෙන් ම එය මෙරට මූලික නීතිය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 වැනි වගන්තියෙන් ආවරණය කර තිබෙනවා. එහෙත් එම නිදහස භුක්ති විඳිය හැක්කේ යම් යම් සීමා යටතේ. තමන් කැමති ඕනෑ ම දෙයක් ඕනෑ ම ආකාරයට ප්‍රකාශ කිරීමට හැකියාවක් නැහැ. විශේෂයෙන් ජනමාධ්‍යවේදීන් සහ ජනමාධ්‍ය ආයතන සිදු කරන එම භාෂණය හා ප්‍රකාශනය අන් අයගේ අයහපතට හෝ නිදහස නැති කිරීමට හෝ අපහසුතාවට පත් කිරීමට හෝ හේතුවක් නොවිය යුතුවා මෙන් ම ජනමාධ්‍ය ආචාරධර්ම අනුගමනය කිරීම ද මෙහිදී ඉතා වැදගත්.

එම තත්ත්වයෙන් බැහැර වන විට මාධ්‍ය නිදහස යන්න සෘජු ව ම රටේ පාලනයට සම්බන්ධ තීරණාත්මක සාධකයක්. ඒ නිසා ම බොහෝ රටවල මාධ්‍යවේදීන් පාලනයට අභියෝගයක් වන අවස්ථාවල ඔවුන් ඝාතනය කිරීම මෙන් ම මාධ්‍ය ආයතනවලට පහරදීම් ද වාර්තා වූ අවස්ථා බහුල ව අසන්නට, දකින්නට ලැබෙනවා. ගෙවුණු සමයේ ශ්‍රී ලංකාවේ ද එවැනි දරුණු සිද්ධි වාර්තා වුණා.

රටවල මාධ්‍ය නිදහස පිළිබඳ වාර්තා තක්සේරු මත දේශ සීමා රහිත වාර්තාකරුවන්ගේ (Reporters Without Borders) සංවිධානය 2001 වසරේ සිට හඳුන්වා දී තිබෙන ලෝක මාධ්‍ය නිදහස පිළිබඳ දර්ශකය (World Press Freedom Index) පෙන්වා දෙන ආකාරය අනුව රටක මාධ්‍ය නිදහස පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම පහසු වෙනවා.

මෙහිදී ගෝලීය තත්ත්වය විමසා බලන විට එම සංවිධානය අනාවරණය කරන්නේ 2002 වසරේදී ලෝක ජනගහනයෙන් 20%ක් ජීවත් වූයේ මාධ්‍ය නිදහසේ තත්ත්වය 'යහපත්' ලෙස වර්ගීකරණය කරන ලද රටක බව. එනම් ශක්තිමත් මාධ්‍ය නිදහස් පරිසරයක්, ශක්තිමත් නීතිමය සහ ආයතනික ආරක්ෂාවක් එහි තිබුණු බව සඳහන්. එහෙත් වසර 25කට පසු මේ කාණ්ඩයට අයත් රටක ජීවත් වන්නේ ලෝක ජනගහනයෙන් 1%කටත් වඩා අඩු පිරිසක් බව ද ඔවුන් පෙන්වා දෙනවා.

රටවල් 180ක් අතුරින් මෙවර (2026) එම දර්ශකයේ ශ්‍රී ලංකාව පසු වන්නේ 134 වැනි ස්ථානයේ. ඒ, 2025 වසරේ සිටි 139 වැනි ස්ථානයෙන් ස්ථාන 05ක් ඉහළට එමින්. මෙය සාධනීය තත්ත්වයක්. පසුගිය සමයේ මාධ්‍යවේදීන්ට මුහුණදීමට සිදු වූ තර්ජන, පැහැර ගැනීම්, ඝාතන හමුවේ ඔවුන්ට යුක්තිය ඉටු කිරීමට රජය ගත් සුබවාදී පියවර මෙන් ම එවැනි සිදුවීම් අලුතෙන් වාර්තා නොවන තත්ත්වයෙන් රට පාලනය කිරීම මේ පසුබිම ළඟා කර ගැනීමට ඉවහල් වූවාට කිසිදු සැකයක් නැහැ. වරදකරුවන් නීතිය ඉදිරියට ගෙන ඒමට ගෙන ඇති ක්‍රියාමාර්ග එහිදී කැපී පෙනෙනවා. වඩාත් ගුණාත්මක සහ යාවත්කාලීන ජාතික මාධ්‍ය ප්‍රතිපත්තියක් සැකසීම ඔස්සේ මාධ්‍ය වෘත්තිකයන්ගේ වෘත්තීය නිපුණත්වය ඇති කිරීමට, මාධ්‍ය ක්ෂේත්‍රයේ ස්වයං නියාමනයක් ඇති කිරීමෙන් මාධ්‍ය නිදහස සඳහා සුරක්ෂිත පරිසරයක් ගොඩනැඟීමට මේ වන විට ගෙන ඇති ප්‍රවේශය මෙහිදී පැසසිය යුතු තත්ත්වයක්.

ලෝක ජනමාධ්‍ය නිදහස් දිනය සමරන මොහොතේ ඒ පිළිබඳ පෘථුල විමසුමක යෙදීම වැදගත් වන්නේ ඉදිරියේදී ලෝක මාධ්‍ය නිදහස පිළිබඳ දර්ශකයේ තවත් ඉහළට ගමන් කරමින් මෙරට මාධ්‍ය නිදහස තහවුරු කර ගත හැකි පරිසරයක් ඇති කර ගැනීමට ගන්නා වෑයම ක්‍රියාවට නැංවීම කඩිනම් කළ යුතු නිසා.

මාලා මල්කාන්ති ජයරත්නමෙගේ
- සංස්කාරක -


දෙසතිය

සඟරා ලැබිය යුතු නම හා ලිපිනය (ඉංග්‍රීසි භාෂාවෙන්)

Name ..........

Address ..........

ID Number .......... Tel / Mobile ..........

Signature .......... Date ..........

දෙසතිය සඟරා දායකත්වය

වාර්ෂික දායකත්වය රු. 1920.00

අර්ධ වාර්ෂික දායකත්වය රු. 960.00

**මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ මුදල් තැන්පත් කිරීමේදී**

'රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ, ගිණුම් අංක 11910010902 6220 -මහජන බැංකුව, නාරාහේන්පිට' ගිණුමට මුදල් තැන්පත් කර ඔබගේ ගෙවීම තහවුරු කිරීමට අදාළ බැංකු බැරපත හා සඟරා දායකත්ව කූපන්පත 0707444138 අංකයට Whatsapp කරන්න. (Remarks/Decription යන ස්ථානයේ 'Desathiya' ලෙස සටහන් කරන්න)

**මුදල් ඇණවුම් එවීමේදී**

'රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ' නමට ලියා ගෙවන තැපැල් කාර්යාලය 'කම්කරු මහලේකම් කාර්යාලය, නාරාහේන්පිට' ලෙස යොමු කර රජයේ ප්‍රකාශන කාර්යාංශය, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, අංක 163, පොල්හේන්ගොඩ, කොළඹ 05 යන ලිපිනයට එවන්න. අංකය සහ දිනය සහිත චෙක්පත් ද 'රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ' නමට ලියා මෙම ලිපිනයට යොමු කරන්න. විමසීම් - 0112512759

# නවතින්න හිතෙන නැවතුම්පොළ

පසිඳු මිහිරාන් රැටියල

විධිමත් පොදු ප්‍රවාහන සේවයක් යනු සංවර්ධනය වන රටකට අත්‍යවශ්‍ය අංගයක්. පිටකොටුව මධ්‍යම බස් නැවතුම්පොළ මෙරට මගී ප්‍රවාහන බස් සේවාවේ හදවත බඳු ස්ථානයක් වුවත් එය කාලයට අනුව නවීකරණය නොවීමෙන් මගී ජනතාව පමණක් නොව එහි සේවකයන් පවා මුහුණ දුන්නේ අනේකවිධ ගැටලු රාශියකට. වත්මන් ආණ්ඩුව මේ තත්ත්වය මැනවින් වටහාගෙන ඇති සෙයක් දක්නට ලැබුණේ නොබෝදා (2026 අප්‍රේල් 09) පිටකොටුව මධ්‍යම බස් නැවතුම්පොළ පරිවර්තනීය ලෙස නවීකරණය කරමින්, විධිමත් පහසුකම් සහිත ව විවෘත කිරීමත් සමඟ.

මෙහි නවීකරණය සිදු වුණේ ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන්, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ශ්‍රම දායකත්වයෙන් 'ක්ලීන් ශ්‍රී ලංකා' ජාතික වැඩසටහනේ ව්‍යාපෘතියක් ලෙස. පෞද්ගලික අංශය, ගෘහ නිර්මාණ ශිල්පීන්, නියෝ ඉංජිනියරින් සංවිධානය, කොළඹ නගර සභාව, ජල සම්පාදන මණ්ඩලය ඇතුළු ආයතන ගණනාවක් ද මේ කාර්යයට දායක වුණා. මෙහිදී බස් රථ නැවතුම් පර්යන්තය සංවර්ධනය කර විවෘත කෙරුණේ බිම් මහල බස් නැවතුම් අංගණය ලෙසත් දෙවැනි මහල රියැදුරු සහ කොන්දොස්තර විවේකාගාර ලෙසත් තෙවැනි මහල පරිපාලන සහ මෙහෙයුම් මධ්‍යස්ථාන ලෙසත් නවීකරණය කරමින්.

මෙහිදී අවිධිමත් ව පැවැති වැසිකිළි පද්ධති, පානීය ජල පද්ධති ඇතුළු සනීපාරක්ෂක පහසුකම්, ලංගම රියැදුරන් සහ රිය සහායකවරුන්ගේ නවාතැන් පහසුකම්, මගීන් වෙනුවෙන් සනීපාරක්ෂක පහසුකම් ඇතුළු සියල්ල විධිමත් ආකාරයෙන් නැවත ගොඩනඟා තිබෙනවා.

කොටුව දුම්රිය ස්ථානයේ නවීකරණය අවසන් කිරීමෙන් පසු බැස්ටියන් මාවත, කොටුව දුම්රිය ස්ථානය සහ මධ්‍යම බස් නැවතුම්පොළ එකිනෙක සම්බන්ධ කිරීමයි රජයේ ඊළඟ සැලසුම. මගී ජනතාවගේ පහසුව උදෙසා එය ගුවන් පාලම් මගින් එකිනෙක සම්බන්ධ කිරීමත් එම සැලසුමට අයත්. ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහනේ මෙහෙයුම් නිලධාරි, ජනාධිපති අතිරේක ලේකම් එස්. පී. සී. සුගීෂ්වරට අනුව මෙය රුපියල් මිලියන දහසක් පමණ වැය වන කටයුත්තක් වුවත් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ශ්‍රම දායකත්වය නිසා එය නවීකරණයට වැය වී ඇත්තේ රුපියල් මිලියන 425ක්.

ජනාධිපති අතිරේක ලේකම් එස්. පී. සී. සුගීෂ්වර පවසන පරිදි පිටකොටුව මධ්‍යම බස් නැවතුම්පොළෙහි නවීකරණයට පෙර තිබී ඇත්තේ සුළු වැස්සකින් වුව වැසි ජලයෙන් උතුරා යන තත්ත්වයක්. මෙහි වැසිකිළි භාවිත කළ නොහැකි තරම් ජරාජීර්ණ ව පැවති අතර තිබී ඇත්තේ වැසි ජලය කාන්දු වන පානීය ජල පද්ධතියක්. රාත්‍රියේ අඳුරු ස්ථානවල විවිධ දුරාචාර සිදු ව ඇත්තා සේ ම මෙහි අවිධිමත් ලෙස ඉදි කෙරුණු කඩසාප්පු සහ අනවසර ඉදි කිරීම් නිසා පැවැතියේ ඉතා අප්‍රසන්න ස්වභාවයක්.

මෙහි බස් නැවතුම්පොළ වසා ගනිමින් ඉදි කර තිබූ අනවසර කඩ සාප්පු ඉන් ඉවත් කර ඇත්තේ නගර සභාව සමඟ සාකච්ඡා කරමින්. නගර සභාවේ නියෝගවලට අවනත වෙමින් කඩසාප්පු අයිතිකරුවන් කිසිදු විරෝධයකින් තොර ව ඉවත් ව තිබෙනවා. එයින් ගම්‍ය වන්නේ ඔවුන්ට ද තිබෙන පවතින ක්‍රමයේ වෙනස් වීමේ අවශ්‍යතාව.

අදහස් දක්වන ජනාධිපති අතිරේක ලේකම් එස්. පී. සී. සුගීෂ්වර; "දුර පළාත්වල සිට බස්රථ ධාවනය කරන රියැදුරන් සහ රිය සහායකයන් මෙහි පැමිණි විට



භාවිත කළ විවේකාගාර තිබුණේ අපායක ස්වරූපයෙන්. කාඩ්බෝඩ් සහ පැලට්වලින් වෙන් කරගත් කුඩා කාමර මුලුවල ගුළි වෙමින් ඔවුන් විවේක ගෙන තිබුණා. මෙය මදුරුවන්ගේ සහ මකුණන්ගේ රජදහනක්. විදුලි පංකාවක් නැති ව දහවල් අතිශය උණුසුම් කාලගුණයේ පවා දහදිය දමමින් ඔවුන් ගත කළේ ඉතා පීඩාකාරී දිවියක්. ඔවුන් ඊළඟ ගමන් වාරය වෙනුවෙන් නිසි නින්දක්, විවේකයක් නොමැති ව මෙහි විවේක ගෙන තිබුණා. මේ තත්ත්වය වෙනස් කර නවීන පහසුකම් යටතේ විවේකාගාර අලුත්වැඩියා කර, වෙන් කරන ලද කාමර ඉදි කර, ඒවාට විදුලි පංකා සහ වායුසමීකරණ යන්ත්‍ර පවා සවි කර සේවකයන්ගේ සුව පහසුව ඇති කළා. මෙහි වැසිකිළි 3කින් යුත් අව්ධිමත් වැසිකිළි පද්ධතිය ඉවත් කර ඉතා උසස් මට්ටමේ වැසිකිළි පද්ධතියක් නිමවා තිබෙනවා. මගී වැසිකිළි සංකීර්ණයත් නවීකරණය කළා ආබාධිත ප්‍රජාවට පවා භාවිත කළ හැකි ආකාරයෙන්. නාන කාමර සමූහයට උසස් තත්ත්වයේ හොඳම උපාංග භාවිත කර තිබෙනවා.”

මේ බස් රථ නැවතුම් පර්යන්තයේ නවීන තාක්ෂණය අනුව ඉදි කර ඇති මෙහෙයුම් මැදිරිය පැය 24 ම ක්‍රියාත්මකයි. කාර්ය මණ්ඩලය වෙනුවෙන් කාර්යාල ඉදි කර ඇත්තේ ද විධිමත් පහසුකම් සහිත ව. මෙහි වෙළෙඳසැල් 20ක් සඳහා ඉඩ පහසුකම් තිබෙන අතර ඒවා වෙළෙඳුන්ට ලබා දෙන්නේ ටෙන්ඩර් කැඳවීමකින් බවයි ජනාධිපති අතිරේක ලේකම් එස්.පී. සී. සුගීෂ්වරගේ අවධාරණය.

නවීකරණය වූ පිටකොටුව මධ්‍යම බස් නැවතුම්පොළ විවෘත කිරීමෙන් පසුව තවත් කණ්ඩායමක් මෙය නඩත්තුව සඳහා මෙහි රැඳී සිටිනවා. මේ භූමියේ අයිතිය සහ නඩත්තුව භාර ව ඇත්තේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට. ඔවුන් මෙහි ආරක්ෂාව සහ නඩත්තුව පිළිබඳ නිතර ම දැඩි අවධානයෙන් පසු වෙනවා. නවීකරණයෙන් පසු මෙහි රැඳී සිටීම සීමා වන්නේ බස් මගීන්ට සහ එහි සේවකයන්ට. කිසිදු යාචකයෙකුට, අනවසර වෙළෙන්දන්ට මෙහි නැවතී සිටීමට අවසර නැහැ.

නවීකරණවල දෙවැනි අදියර වන බස් රථ සේවා සහ නඩත්තු කිරීමේ අංගණයේ කාර්ය සිදු වෙමින් පවතින අතර එය නිමා කිරීමට අපේක්ෂා කරන්නේ මැයි මස අගභාගයේදී. පිටකොටුවේ සිට ධාවනය වන සෑම බස් රථයක් ම දෝෂ රහිත ව ධාවනය කරවීමයි එහි අරමුණ.

# සුරකිමු

සිහිනුවණින් යුතු පරිභෝජනයයි සුරක්ෂිත අනාගතයක පදනම වන්නේ. මෙය ඕනෑ ම ස්වාභාවික සම්පතකට හෝ කෘත්‍රිම නිෂ්පාදනයකට හෝ අදාළ කර ගත යුතු අගනා අදහසක්.

‘පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්’ දැක්ම පෙරදැරි ව ක්‍රියාත්මක වන Clean Sri Lanka යටතේ ජනාධිපති ලේකම් කාර්යාලයේ මෙහෙයවීමෙන්, බලශක්ති අමාත්‍යාංශයේ සහයෝගය ඇති ව දියත් කෙරෙන ‘සුරකිමු ලංකා - එකතු වෙමු - එළිය දෙමු’ ජාතික වැඩසටහනේ ප්‍රමුඛ අපේක්ෂාවක් වන්නේ ‘කාර්යක්ෂම බලශක්ති පරිභෝජනය’ සඳහා ජාතිය හුරු කරවීම. ඒ සඳහා උක්ත අදහස ජනගත කිරීම වැදගත්.

දෛනික ව නිෂ්පාදනය කර ජාතික විදුලි බල පද්ධතියට එකතු කෙරෙන විදුලිය බලශක්ති ප්‍රමාණය නාස්ති වීම අවම කර සැලකිය යුතු ඉතිරියක් තබා ගැනීමටයි මෙහිදී රජයේ ඉලක්කය. ඒ, අනවශ්‍ය විදුලි පහන් නිවා දැමීම; ප.ව. 6.30 - රාත්‍රි 10.30 කාල සීමාවේ (Peak Demand Hours) සිදු වන අත්‍යවශ්‍ය නොවන විදුලි පරිභෝජනය අඩු කිරීම; වායුසමන යන්ත්‍රවල උෂ්ණත්වය අවම සීමාවක තබා ගැනීම; ඇඳුම් මැදීමේ වාර ගණන අඩු කිරීම සහ දහවල් කාලයේ ඇඳුම් මැදීම; විදුලි වාහනවල බැටරි ආරෝපණය දහවල් කාලයේදී සිදු කිරීම; විදුලිය නාස්ති කරන උපකරණවලින් විදුලිය පිරිමසින උපකරණවලට මාරු වීම; වැඩි විදුලි බලයක් අවශ්‍ය වන උපකරණ භාවිතය අවම කිරීම යනාදී ක්‍රියාකාරකම් ඇසුරින්.

බලශක්තිය අරපිරිමැස්මෙන් පරිහරණය කර ඊට දායක වීම සඳහා ජනතාව දිරිගැන්වීමේ අරමුණින් මේ වැඩසටහන මාර්තු මස 29 දින නිල වශයෙන් ආරම්භ වුණා. බලශක්තිය නිසි ලෙස කළමනාකරණය කරගන්නා ප්‍රජාවක් බිහි කිරීමත් මෙහි මූලික අරමුණක්.

මෙය ක්‍රියාත්මක කිරීමේදී මැදපෙරදිග කලාපයේ පවතින යුදමය වාතාවරණයත් ජනතාවගේ පරිභෝජන රටාවල වෙනස් වීමත් හේතුවෙන් මෙරට බලශක්ති සහ ඉන්ධන සැපයුමට එල්ල විය හැකි බාධා මෙන් ම ‘එල්නිනෝ’ වැනි කාලගුණික තත්ත්ව පිළිබඳ අනාවැකි ද සැලකිල්ලට ගැනුණා. එහෙත් මෙය දිගුකාලින ව හා ස්ථාවර ව ක්‍රියාත්මක කර රටේ බලශක්තිය වෙනුවෙන් වැය වන අනවශ්‍ය පිරිවැය සහ ක්ෂය වන ස්වාභාවික සම්පත් සංරක්ෂණය කර ගැනීමට ද ඉවහල් කර ගත හැකි වැඩසටහනක්. ඊට සෘජු ව ම සහභාගි කර ගන්නා මූලික පාර්ශ්ව වන්නේ පොදු මහජනතාව (පාසල් ප්‍රජාව ද සමඟ), පෞද්ගලික අංශය, රාජ්‍ය අංශය යන කණ්ඩායම් (4P – Public, Private, People Partnership).

බලශක්තිය යනු අනාගත පරපුරට ද අයිති පොදු සම්පතක් බැවින් ‘සුරකිමු ලංකා’ වැඩසටහනෙන් සිහිකල්පනාවෙන් යුත් පරිභෝජනය (Mindful Consumption) පිළිබඳ හැඟීම ප්‍රවර්ධනය කිරීමට උත්සාහ කරන බව ක්ලීන් ශ්‍රී ලංකා ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ (සුරකිමු ලංකා වැඩසටහන) දුලිප් සොමිරත්න පවසනවා. ඔහු පවසන පරිදි බලශක්ති අර්බුදයට විසඳුම ඇත්තේ ඉල්ලුමට අනුව සැපයුම වැඩි කිරීමේ පමණක් නොව ඉල්ලුම බුද්ධිමත් ව කළමනාකරණය කිරීමේත්. ඒ වෙනුවෙන් ‘සුරකිමු ලංකා’ වැඩසටහන සැලසුම් කළ බවත් එය කෙටිකාලීන, මධ්‍යකාලීන සහ දිගුකාලීන වශයෙන් පියවර තුනකින් ක්‍රියාත්මක කෙරෙන බවත් පවසන ඔහුː “අධික විදුලිය පරිභෝජනයක් අවශ්‍ය වන ක්‍රියාකාරකම් උපරිම ඉල්ලුම් කාල පරාසයෙන් බාහිර ව අනෙකුත් කාල පරාසවල (දහවල් කාලය බඳු) සිදු කිරීම සඳහා පාරිභෝගිකයන් දිරිමත් කිරීමයි මෙහිදී කෙටිකාලීන ව සිදු වන්නේ. මධ්‍යකාලීන සහ දිගුකාලීන වශයෙන් ශ්‍රී ලංකාවේ ‘තිරසර බලශක්ති සංරක්ෂණ සංස්කෘතිය’ ඇති කිරීම සඳහා දහවල් කාලයේ නිෂ්පාදනය කෙරෙන සූර්ය බලශක්තිය රාත්‍රි කාලයේ පරිභෝජනය පිණිස ගබඩා කිරීමේ (Battery Storage) පහසුකම් වර්ධනය කිරීමටත් පියවර ගන්නවා. සෑම ක්ෂේත්‍රයක ම බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ නැංවීම, බලශක්ති

**නුවන් කුමාර කටුගම්පල**

නාස්තිය සහ අත්‍යවශ්‍ය භාවිතය අතර වෙනස හඳුනා ගැනීමට අවශ්‍ය දැනුම සමාජගත කිරීම, එමගින් 'බලශක්ති සුරක්ෂිත ජාතිය' නිර්මාණය කිරීම වෙනුවෙනුත් අප ක්‍රියාත්මක වනවා."

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ (SLSEA) සභාපති මහාචාර්ය ටී.එම්. විජේන්ද්‍ර ජයලත් බණ්ඩාර පවසන්නේ රට බලශක්ති අර්බුදයකට නොයාම, බලශක්තිය අප ම උත්පාදනය කර ගැනීම හෙවත් බලශක්ති ස්වාධීනත්වය ඇති කර ගැනීම, නිපදවන බලශක්තිය අපතේ යාම වැළැක්වීම සඳහා බලශක්ති කළමනාකරණය, බලශක්ති උත්පාදනයට වැය වන පිරිවැය අඩු කර ගැනීම යන අපේක්ෂා පෙරදැරි ව තම ආයතනය 'සුරකිමු ලංකා' වැඩසටහනට සක්‍රිය ලෙස දායක වන බව.

අදහස් දක්වන ඔහු: කෙටි, මධ්‍ය සහ දිගු යන තුන් කාලීන බලශක්ති කළමණාකරණයට සැකසූ මේ වැඩසටහනේ කෙටිකාලීන සැලසුම් ක්‍රියාත්මක කිරීම නිසා පසුගිය දින කිහිපයේ පමණක් දිනකට බලශක්ති පරිභෝජනය ගි.වො. පැය 60 සිට 54 දක්වා එනම් ගි.වො. පැය 6කින් පමණ අඩු වී තිබෙනවා. එය විශාල ජයග්‍රහණයක්. මේ ඉතිරි වන විදුලිබල ප්‍රමාණය ඩීසල් බලාගාරවලින් නිෂ්පාදනය කරන්න සිදු වුණානම් ඒකකයකට රු. 120ක් පමණ වැය වනවා. ගි.වො. පැය 6ක් යනු ඒකක මිලියන 6ක් පමණ. ඒ අනුව දවසක ඉතිරියේ සාමාන්‍ය අගය රු. මිලියන 720ක් පමණ. ඒ ප්‍රමාණය නිපදවූවානම් එම පිරිවැය පියවා ගැනීම සඳහා විදුලි බිල තවදුරටත් ඉහළ දැමීමට සිදු වීම, අඛණ්ඩ විදුලි සැපයුම සහතික කිරීමට නොහැකි වීම, ඩීසල් විදුලිබල උත්පාදනය අවම මට්ටමක පවත්වා ගැනීමේ උත්සාහය ව්‍යර්ථ වීම වන්නට තිබුණා. එසේ වූවානම් එයින් අපහසුතාවට පත් වන්නේ රජය පමණක් නොව මහජනතාවත්. මේ දිනවල ජල විදුලිය නිෂ්පාදනයක් වූ අවම මට්ටමක පැවතියත් දහවලට සූර්ය බලයෙන් ඉහළ විදුලිය නිෂ්පාදනය වෙනවා. රාත්‍රි කාලයේ විදුලිය පරිභෝජනය අවම කරගත්තේ නැතිනම් ඩීසල් බලාගාරවලින් විදුලිය උත්පාදනය වැඩි කිරීමට සිදු වීමෙන් අධික පිරිවැයක් දැරීමටයි සිදු වන්නේ. ජනතා සහයෝගය නිසා මේ ගැටලුව කෙටිකාලීන ව බොහෝදුරට සමනය කර ගත හැකි වුණා."

විදුලිය පරිභෝජනය සම්බන්ධයෙන් රාජ්‍ය ආයතනවලට අදාළ නීති, රීති, රෙගුලාසි සැකසීමත් පෞද්ගලික ආයතන සහ පොදු ජනතාව දැනුවත් කිරීමෙන් විදුලිය අපතේ යාම වළක්වා ගැනීමත් සුනිත්‍ය බලශක්ති අධිකාරියේ කාර්යභාරයක්. එයින් නිවසට ඉතිරි වන මුදල නිසා මහජනයාට අත්වන්නේ වාසියක්. රජයට විදුලිය නිෂ්පාදන පිරිවැය ඉතිරි වීම නිසා විදේශ විනිමය සංචිත ඉතිරි වීමෙන් රටේ ආර්ථිකයට අත්වන්නේ ද වාසියක්.

රාජ්‍ය ආයතනවල බලශක්ති සුරක්ෂිතතාව වෙනුවෙන් ද මෙහිදී ක්‍රියාමාර්ග රැසක් ගෙන තිබෙනවා. රජයේ කාර්යාලවල හැකි සෑම විට ම සහ වැඩකරන දිනවල රාජකාරි අවසන් කිරීමට පැයකට පෙර වායුසමන යන්ත්‍ර ක්‍රියා විරහිත කර තැබීම, විදුලිපංකා සහ විදුලි පහන් භාවිතය අවම කිරීම, අත්‍යවශ්‍ය රාජකාරි සඳහා පමණක් වාහන ධාවනය කරවීම, අධික විදුලිය සහ ඉන්ධන පරිභෝජනයක් අවශ්‍ය වන උත්සව සහ සම්භාෂණ පැවැත්වීම කල් තැබීම, හැකි සෑම විට ම නිවසේ සිට රාජකාරි ඉටු කිරීමේ ක්‍රමවේදය අනුගමනය කිරීම, ආයතන ප්‍රධානින්ගේ අභිමතය පරිදි අවම සේවක සංඛ්‍යාවක් කාර්යාලවල සේවයට කැඳවීම සහ නිවසේ සිට රාජකාරි ඉටු කිරීමට සැලැස්වීම වැනි උපක්‍රමයි මෙහිදී අනුගමනය කෙරුණේ. කෙටිකාලීන බලශක්ති කළමනාකරණ ක්‍රියාවලිය සාර්ථක නිසා මේ අතරින් ඇතැම් ඒවා මේ වන විට නැවත සාමාන්‍ය තත්ත්වයට පත් ව තිබෙනවා.

මුද්‍රිත මාධ්‍ය, ශ්‍රව්‍ය-දෘශ්‍ය විද්‍යුත් මාධ්‍ය, නව සමාජ මාධ්‍ය, පෝස්ටර් සහ දැන්වීම් පුවරු, ප්‍රාදේශීය වශයෙන් ජනතාව එක්රැස් කර දැනුවත් කරවීම් ඇතුළු ප්‍රචාරණ වැඩසටහන් ක්‍රියාත්මක කරවීම, ඉන්ධන සඳහා QR කේතය හඳුන්වා දීම, ඒ ඒ වාහන වර්ගය අනුව ලබාදෙන ඉන්ධන ප්‍රමාණය කෙටි කලකට සීමා කිරීම, වාහනවල ලියාපදිංචි අංකයේ අවසාන ඉලක්කමට අදාළ ව ඔත්තේ දින සහ ඉරට්ටේ දිනවල ඉන්ධන ලබා ගැනීමට අවකාශ සැලැස්වීම, අනීතික ලෙස අනවසරයෙන් වැඩිපුර ඉන්ධන සංචිත ළඟ තබා ගන්නන් සොයා බලා වැටලීම් සිදු කර නීතියෙන් දඬුවම් ලබා දීම වැනි ක්‍රියාමාර්ග ගැනුණේ බලශක්ති සුරක්ෂිතතාව උදෙසා මෙන් ම ඒ පිළිබඳ මහජනතාවගේ ආකල්ප දියුණු කිරීමට.

බලශක්ති සංරක්ෂණ සංස්කෘතිය පාසල් පද්ධතියට හඳුන්වා දීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය ද මේ වැඩසටහනට හවුල්කාරිත්වය දැක්වූවා. රජයේ පාසල්, රජයේ අනුමත පෞද්ගලික පාසල් සහ පිරිවෙන් ද ආවරණය වන පරිදි වැඩසටහනකුයි, මේ යටතේ ක්‍රියාත්මක වන්නේ. අප්‍රේල් 09 දින කොට්ටාව ධර්මපාල විද්‍යාලයෙන් ඇරඹී මේ වැඩසටහනේ අපේක්ෂාව සිසුවා මූලික කරගනිමින් සිදු කරන නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ඔස්සේ සිසුන් තුළ බලශක්තිය සුරක්ෂිත කිරීමේ අගය පිළිබඳ ආකල්පමය වෙනසක් ඇති කිරීම. දරුවන්ගෙන් මේ පණිවිඩය දෙමාපියන්ටත් සමාජයටත්



බෙදී යාමට සැලැස්වීම, පාසල් පද්ධතියේ බලශක්ති සුරක්ෂිතතාව සහ පාරිසරික තිරසරභාවය වර්ධනය කිරීම ද මේ වැඩසටහනේ අපේක්ෂා.

ශ්‍රී ලංකාවේ බලශක්ති උත්පාදනය සඳහා භාවිත කරන මූලාශ්‍ර, දවසේ විදුලි ඉල්ලුම අධික කාල වේලාවේ විදුලිය ඉතිරි කරගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය සහ විදුලි කාර්යක්ෂමතාවකින් යුක්ත විද්‍යුත් උපකරණ තෝරා ගන්නා ආකාරය පිළිබඳ සිසුන්ගේ දැනුම වර්ධනය කිරීමට වැඩමුළු පැවැත්වීම ද මේ යටතේ සිදු වෙනවා. අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තිය අධ්‍යාපන අමාත්‍යාංශය මේ සඳහා වන උපදෙස් අඩංගු චක්‍රලේඛයක් ද නිකුත් කර තිබෙන්නේ 2026-04-06 දාතමින් යුතු ව.

බලශක්ති සංරක්ෂණය සම්බන්ධ ව සිසුන්ගේ අදහස් ඉදිරිපත් කිරීම සඳහා 'තත්පර හැටේ අදහස' (60 Second Ideas) ලෙස උදෑසන රැස්වීමේදී සිසුන්ට කතා කිරීමට අවස්ථාව ලබාදීම මෙන් ම සුදුසු සම්පත්දායකයෙකු යොදාගෙන දරුවන් දැනුවත් කිරීම සඳහා දේශන පැවැත්වීම; විදුලිය සහ ජලය අවහිරතා සඳහා පෙර සූදානමක් පවත්වා ගැනීම; භාවිත නොකරන අවස්ථාවල විදුලි පහන් සහ විදුලි පංකා ඇතුළු විදුලි උපකරණ නිවා දැමීම; රාත්‍රි 7.00ට නිවසේ වැඩිපුර දැල්වෙන එක් බල්බයක් හෝ නිවා දැමීම; රාත්‍රි 7.00-10.00 අතර ශීතකරණයේ විදුලිය විසන්ධි කර ක්‍රියා විරහිත කර තැබීම; භාවිත නොවන විදුලි උපකරණ පේනුවලින් ඉවත් කර තැබීම; හැකි සෑම විට ම ස්වාභාවික ආලෝකය (හිරුඑළිය) භාවිත කිරීමට උනන්දු කිරීම; බලශක්ති සුරැකුම් වැට නමින් ප්‍රදර්ශන පුවරුවක් ආරම්භ කර සිසුන්ගේ චිත්‍ර, රචනා, පෝස්ටර් වැනි නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ප්‍රදර්ශනයට ඉඩ සැලැස්වීම; නාට්‍යානුසාරයෙන් මේ පිළිබඳ නිර්මාණ ඉදිරිපත් කිරීමට පෙලඹවීම; බලශක්තිය ඉතිරි කිරීමේ වැදගත්කම පිළිබඳ 'ගෙදරට ලිපියක්' මැයෙන් ලිපි සකස් කරවා සිසුන් අතින් නිවෙස්වලට යවා දෙමාපියන් දැනුවත් කරවීම; මෙබඳු ක්‍රියාකාරකම්වලට සහභාගි වන දරුවන් පාසල් මට්ටමේ බලශක්ති සංරක්ෂණ නියෝජිතයන් (Agents) ලෙස නම් කර වගකීම් පැවරීම; බලශක්ති ලොග් සටහන් පොතක් (දින පොතක්) ඇරඹීම ඇතුළු විවිධ ක්‍රියාකාරකම් හඳුන්වා දී තිබෙන්නේ මේ චක්‍රලේඛය යටතේ. කේවල සහ කණ්ඩායම් වශයෙන් නව නිර්මාණාත්මක බලශක්ති සංරක්ෂණ ව්‍යාපෘති සකස් කිරීමට සිසුන්ට අනුබල දීම සහ ඒ සඳහා ඉදිරිපත් වන ප්‍රශස්ත යෝජනා කමිටුවකින් පරීක්ෂා කර ක්‍රියාවට නැංවීමට උනන්දු කරවීම සඳහා ද අදාළ චක්‍රලේඛයෙන් උපදෙස් ලබා දී තිබෙනවා.


අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (විෂය සමගාමී) උදාරා ටී. දික්කුඹුර පවසන්නේ චක්‍රලේඛයට අනුව ක්‍රියාත්මක වීම සඳහා පාසල්, පිරිවෙන්, රජයේ අනුමත පෞද්ගලික පාසල් සඳහා පාසල් මට්ටමින් සහ පන්ති මට්ටමින් ක්‍රියාත්මක කළ යුතු වැඩපිළිවෙළට අවශ්‍ය උපදෙස් නිකුත් කර ඒවා අධීක්ෂණය කෙරෙමින් පවතින බව. එසේ ම ක්ලීන් ශ්‍රී ලංකා ලේකම් කාර්යාලයෙන් සංවිධාන කළ මාර්ගගත දැනුවත් කිරීමේ වැඩසටහනටත් සමාජ මාධ්‍ය ඔස්සේ සිදු කළ ප්‍රචාරක වැඩපිළිවෙළටත් විදුහල්පතිවරුන් සම්බන්ධ කරවා එමගින් දරුවන් වෙත අදාළ යාවත්කාලින වන තොරතුරු සහ දැනුවත් කිරීම් හුවමාරු වන වැඩපිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කරන බවත් ඇය ප්‍රකාශ කරන්නේ පාසල් බලශක්ති සමාජ වැඩසටහනට ද දරුවන් සහභාගි වන බව පවසමින්.



මැදපෙරදිග යුදමය
වාතාවරණය යටතේ
ඉන්ධන ලැබීම අර්බුදයකට
ලක්වීමෙනුත් දැඩි උණුසුම්
කාලගුණික තත්ත්වය මත
ජල විදුලිය නිෂ්පාදනය
අඩාල වීමෙනුත් ජනිත වූ
පීඩාකාරී තත්ත්වය පහ ව
ගොස් යථාකාලයේ සියල්ල
සාමාන්‍ය තත්තවයට පත්වනු
ඇති. එහෙත් 'සුරකිමු ලංකා'
වැඩසටහන තවදුරටත්
අඛණ්ඩ ව ක්‍රියාත්මක කරවීමයි
වඩාත් ඵලදායී වන්නේ.

බලශක්ති අර්බුදයට විකල්පයක් ලෙස පුනර්ජනනීය බලශක්තිය භාවිතයට ගැනීම ප්‍රවර්ධනය කෙරෙමින් පවතින කාල වකවානුවක ගෝලීය යුද වාතාවරණය සහ කාලගුණික දේශගුණික බලපෑම් ද හේතුවෙන් පැන නැගුණු බලශක්ති ගැටලුවට පිළියම් වශයෙන් යොදා ගන්නා 'සුරකිමු ලංකා' වැඩසටහන යටතේ වන කෙටිකාලීන ක්‍රියාකාරකම්වල කාලෝචිත බව සහ සාධනීය ප්‍රතිඵල ළඟා කර ගැනීමේ හැකියාව පිළිබඳ විශ්ලේෂණාත්මක ව සලකා බලා මධ්‍යකාලීන සහ දිගුකාලීන වැඩසටහන් ක්‍රියාවට නැංවීමේදී ප්‍රායෝගිකත්වයට වඩාත් නැඹුරු කරවීමයි සුදුසු වන්නේ.

මැදපෙරදිග යුදමය වාතාවරණය යටතේ ඉන්ධන ලැබීම අර්බුදයකට ලක්වීමෙනුත් දැඩි උණුසුම් කාලගුණික තත්ත්වය මත ජල විදුලිය නිෂ්පාදනය අඩාල වීමෙනුත් ජනිත වූ පීඩාකාරී තත්ත්වය පහ ව ගොස් යථාකාලයේ සියල්ල සාමාන්‍ය තත්ත්වයට පත්වනු ඇති. එහෙත් 'සුරකිමු ලංකා' වැඩසටහන තවදුරටත් අඛණ්ඩ ව ක්‍රියාත්මක කරවීමයි වඩාත් ඵලදායී වන්නේ. බලශක්ති නිෂ්පාදන පිරිවැයෙන් සැලකිය යුතු කොටසක් රජයට ඉතිරි කර ගත හැකි වීමත් රාජ්‍ය සහ පෞද්ගලික ආයතනවල දෛනික ව ඉන්ධනවලට සහ විදුලි බලයට වැය වන මුදල අවම මට්ටමක පවත්වා ගත හැකි වීමත් මහජනතාවට පුද්ගලික ව වැය වන මාසික විදුලිය බිල්පත සහ ඉන්ධන පරිභෝජන පිරිවැය ද අවම කර ගැනීමට හැකි වීමත් මගින් ජාතික ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් ලබාදීමට හැකිවීම පිණිස වන ආකල්පමය වෙනස අත්දකින තෙක් මේ ක්‍රියාන්විතය අඛණ්ඩ ව කරගෙන යාම වැදගත්. මෙය සමස්ත ජාතිය වෙනුවෙන් පිළියෙල කළ අනාගත ආයෝජනයක් ද කාර්යක්ෂම සම්පත් පරිභෝජන උපක්‍රමයක් ද ජාතික ඉලක්ක සපුරා ගැනීම සඳහා ආකල්පමය වෙනස්කම් සහිත පුරවැසියන් ගොඩනැගීමට අවස්ථාවක් ද බවටයි පත් කර ගත යුත්තේ.



# ලාංකික සමාජයේ හෘදය සාක්ෂිය

ධනුෂ්ක හර්ෂණ වික්‍රමරත්න

සාමාන්‍ය ජන ජීවිතය ගැඹුරු දේශපාලන න්‍යාය මත වෙහෙසෙන්නේ නැහැ. ජන ජීවිතය වෙහෙසෙන්නේ භාවිතය සහ අත්දැකීම් මත. ශ්‍රී ලංකාවේ පැවති වසර 133ක ඉංග්‍රීසි පාලන සමයේ අපේ මුතුන් මිත්තන්ගේ දේශපාලන විඥානය යටත්විජිත පාලන අත්දැකීම් මත සැකසුණක්. ඔවුන් අත්දුටුවේ වී හා හේන් ගොවිතැනට එරෙහි ව කෝපි, තේ, රබර්, පොල් වැනි ආර්ථික බෝග වගාවල ආක්‍රමණය සිදු වන ආකාරය. මංමාවත් පවා නොමැති හුදෙකලා ගැමි දිවිය ආක්‍රමණය කරමින් මංමාවත්, දුම්රිය මං හා කෝපි, තේ කර්මාන්ත ශාලා ඉදිවන ආකාරය. සරල පරිභෝජන භාණ්ඩ වෙනුවට අලෙවිය සඳහා ම භාණ්ඩ නිපදවීම ආරම්භ වූ බව. සරල ගැමි පරිභෝජන භාණ්ඩ හුවමාරු පොළ ම යටත්විජිතවාදී වෙළෙඳපොළ ආර්ථිකයක් වන ආකාරය. පුද්ගලික ඉඩම් හිමිකමෙන් තොර බිම් වගාව වෙනුවට පුද්ගලික ඉඩම් අයිතිය සතු මහා වාණිජ ඉඩම් ආක්‍රමණය. අවසන සරල ගැමි රාජකාරි ශ්‍රම සම්බන්ධතාව වැටුප් ශ්‍රමික තත්ත්වයට වෙනස් වීම ඔවුන් අත්දුටුවා. මුලදී විරෝධය හා ප්‍රතික්ෂේපය ද පසුව නව තත්ත්වය ඉරණම සේ සලකා එයට අනුගත වීම ද සිදු වුණා. රජවරු, දිසාවේලා වෙනුවට කොමිස්කාර, කොන්ත්‍රාත්කාර නව සිටුවරුන් ඔවුන් අත්දකින්නට වුණා. අමුඩ ලේන්සුව කරට එද්දී සරම ඉණට ආවත් රජුට, රජුගේ නිලධාරියාට තිබූ බිය ම සිටුවරයාට සහ වෙළෙන්දාට දක්වන්නට වුණා. පෙර දේශීය පාලකයාගේ ස්ථානය නව සුදු පාලකයාට ලැබෙද්දී ඒරොප්පේ රජ්ජුරුවන්ගේ බලය පෙන්වන සුදු සහ සුදු ගැති කළු නිලධාරින්ට යටත් වන්නටයි සිදු වුණේ.

දේශීය පාලක පංතිය අතට බලය දෙමින් ඉංග්‍රීසීන් උපාමාරු කර නිදහස නම් ඉලව්වක් ද වෙස්මිනිස්ටර් ක්‍රමය නම් පාලන වියගහක් ද ලාංකික ජනතා උරමත තැබුණා. එය තට්ටුමාරු දේශපාලනය නම් දෙමෝලේ කෙටීම නිසා ජනතාවට අවසන හිමි වුණේ බංකොලොත් රාජ්‍යයක්. අවසන අතිශය බලවත් රජු වෙනුවට ඒරෝප්පේ රජුගේ යටත්විජිත කස පහර ද ඉන්පසු දේශීය පාලක මඩු වලිග පහර ද ජනතාවට උරුම වුණා. වසර දෙදහස් ගණනක රජකු යටතේ යටහත් වීමත් වසර 133ක් තිස්සේ ඒරොප්පේ රජකුට, රැජිනියකට යටත් වීමත් අවසන දේශීය වලව් ප්‍රමුඛ ප්‍රභූ පාලනයකට දශක හතකට වැඩි කලක් යටත්වීමත් හේතුවෙන් ජනතාව ලබා ගත්තේ ජනතා මුදලින් අනාදිමත් කාලයක් යැපුණ පීඩක ප්‍රභූ පාලනයත් ණය ගැති එහෙත් ණය ගෙවාගත නොහැකි ජාතියකුත් පමණයි. දශක හතරකට අධික මෑත දේශපාලනයේ මෙරට ප්‍රභූ වරප්‍රසාද වඩවාගත් එහෙත් පාදඩ දේශපාලන කඩාපැනීම සහ නරුම සිතක් සහිත දේශපාලන සංස්කෘතිය ජනතාව භෞතික ව ද ආධ්‍යාත්මික ව ද තලා පෙළා භීතියට පත් කළා.

මේ දූපතේ දේශපාලන විද්‍යා ඉතිහාස පාඩම එබඳුයි. ඒ නිසා ජනතාව නිරන්තර ආණ්ඩු සැක කරනවා. ප්‍රභූ පාලනයට එරෙහි ව 'ජනතා පාලනය' යන්න දන්නේ නැහැ. මේ සමාජ විඥානය පරගැති දේශීය පාලකයන් මනා ලෙස හසුරුවා තිබෙනවා. රටේ නායකයා අප්පච්චි, මහරජ්ජුරුවෝ කළේ ජනතාව නොව එම පාලකයන්. ජනතාව එම තත්ත්වය ඉතිහාස අත්දැකීම් මත ගළපා පිළිගත්තා පමණයි. වත්මන් විපක්ෂය මේ මොහොතේ යොදා ගන්නේ ද වසර 200කට ආසන්න, ජනතාව තුළ පාලකයා යන පොදු සංකල්පය කෙරෙහි වන බිය හා සැකය.

පවතින ආණ්ඩුව නියෝජනය කරන දේශපාලන ව්‍යාපාරය ජනතාවට 'සිස්ටම් චේන්ජ්' ගැන කතා කළේ බොහෝ කල් සිට. ඒ සඳහා තම සමාජ දෘෂ්ටිය මත පිහිටා ප්‍රධාන තේමා හා ක්ෂේත්‍ර 10ක් ඔස්සේ දිවෙන ප්‍රතිපත්ති මාලාවක් ජනතාවට ඉදිරිපත් කළා. ජනතාව මැතිවරණ ප්‍රතිඵල දෙකකින් එය අනුමත කළා. ප්‍රභූ පංතියට එරෙහි ජනතා දේශපාලනයකට වඩා ජනතාව අවධානය යොමු කළේ හොරකම, වංචාව, දූෂණය සහ වරප්‍රසාදලාභී

දේශපාලන ක්‍රමය වෙනස් කිරීම ගැන. ජාතික ජන  බලවේගයට ද සිදුවූයේ එම පහසු උදාහරණයෙන් 'සිස්ටම් චේන්ජ්' පහදන්නට.

සැබැවින් ම ජාතික ජන බලවේගය සමාජ පරිවර්තනය යන පුළුල් අරුත තම ප්‍රතිපත්ති ලෙස ජනතාවගේ කැමැත්තට යොමුකොට ඒ මත පිහිටා ක්ලීන් ශ්‍රී ලංකා, ග්‍රාමීය දුප්පත්කම නැති කිරීම සහ ඩිජිටල්කරණය යනුවෙන් ප්‍රධාන ක්‍රියාකාරී සැලසුම් 03ක් ඉදිරිපත් කර තිබෙනවා. ක්ලීන් ශ්‍රී ලංකා මෙහි මූලට ම ගැනෙන්නේ සිස්ටම් චේන්ජ්හිදී මිනිසාගේ භෞතික පරිසරයේ සිට ආධ්‍යාත්මික ජීවිතය දක්වා පවිත්‍ර වීම වැදගත් නිසා. මෙය හුදු ක්‍රියාවලියක් පමණක් නොව සමාජ පරිවර්තනයට සාපේක්ෂ ව ඉදිරියට යන මෙහෙයුමක්. ක්ලීන් ශ්‍රී ලංකා මෙහෙයුමේ පදනම් වන ප්‍රධාන කලුනු තුන අතර 'පිරිසිදු දේශපාලන සංස්කෘතිය' යන්න වංචා දූෂණ නොමැති හොරුන්ට දඬුවම් දෙන හා ආණ්ඩුව ආදර්ශමත් ලෙස කටයුතු කරන රට ම එක් ව දූෂණයට හොරකමට එරෙහි නව සංස්කෘතියක් ඉල්ලා සිටීමක්. එහි දේශපාලඥයාගේ වරප්‍රසාද හා වරදාන කපාහැරීම ද නීතියේ ආධිපත්‍යය සැමට සමාන ව ක්‍රියාත්මක කිරීම ද වගකීම් සහගත සහ ආදර්ශමත් දේශපාලන නායකත්වයක් ගොඩනැඟීම ද ඊට අයත්. ජනතා කැමැත්ත ද එය වෙනවා. බලාපොරොත්තු සුන් වෙන විපක්ෂය ජනතාවගේ මේ කැමැත්ත සහ මාලිමාවේ වුවමනාව එකිනෙක මත හප්පන්නටයි වෙර දරන්නේ.

'බාල ගල් අඟුරු' වංචාව යන විපක්ෂයේ සාවද්‍ය ප්‍රකාශනය විසින් උත්සාහ කරන්නට වෙර දරනු ලබන්නේ ද එය. ගල් අඟුරු ගෙන්වීමේ ක්‍රියාවලියේ ප්‍රසම්පාදනයේ දෝෂ නැහැ. එය විශ්වාසභංගයේදී හෝ ඔප්පු කර නැහැ. ඇමතිවරයා සොරකමක්, වංචාවක් කළා යැයි තර්කානුකූල ව ඔප්පුකොට ද නැහැ. මේ ක්‍රියාවලියේදී ගල් අඟුරු සමාගම ලබාගත් අනියම් ලාභයක් ද නැහැ. එම සමාගම තැන්පත් කළ මුදලින් මෙහි පාඩුව පියවා ගත හැකියි. ඒ නිසා එම ක්‍රියාවලියේදී ජනතාව මත අමතර බරක් වැටෙන්නේ ද නැහැ. එහෙත් අතාර්කික ව හෝ විපක්ෂය පුන පුනා චෝදනා කරද්දී ජනතාවට වගවීම සලකා ආණ්ඩුවට නිහඬ ව සිටිය නොහැකියි. එබැවින් ආණ්ඩුව නිවැරැදි තීරණය ගත්තා. හිටපු බලශක්ති ඇමති ජයකොඩි කෙරෙහි විශ්වාසය ආණ්ඩුව තුළ තිබුණත් ජනතා විශ්වාසය හා විනිවිදභාවය සලකා ජනාධිපති කොමිසමට ඉඩ දී ඔහු ඉල්ලා අස්වුණා. ශ්‍රී ලංකාවේ ඉහළ ම අධිකරණ තුන නියෝජනය වන පරිදි සක්‍රිය සේවයේ නියුතු විනිසුරන් තිදෙනෙකුගෙන් සමන්විත ජනාධිපති කොමිසමක් පත් කෙරුණා. මේ කොමිසම ශ්‍රී ලංකාවේ සමස්ත ගල් අඟුරු ගෙන්වීමට අදාළ ලෙස පරීක්ෂණ පවත්වන්නට බලය සහිත එකක් වීම යන්න උසුළු විසුළුවට ලක් කිරීම විපක්ෂයේ වැඩක්. රටේ පැවැති සහ පවතින විශාලතම ටෙන්ඩරය මෙය බැවින් එහි සුලමුල ආරම්භයේ සිට පරීක්ෂාවට ලක්විය යුතුයි. නැතිනම් ගල් අඟුරු ක්‍රියාවලිය කඩින්කඩ විභාග කිරීමට නැවත නැවතත් කොමිසම් දැමිය යුතු වනු ඇති. එය විහිළුවක්. මාස හයකදී වසර ගණනාවක සමස්ත ක්‍රියාවලිය එක් ව පරීක්ෂාකොට දූෂණයක් වේනම් අදාළ සියල්ලන්ට ම දඬුවම් කිරීමයි ජනතා කැමැත්ත ද වන්නේ. අලාබයක් වීනම් එකල අදාළ බලධරයාගෙන් එය අයකරගෙන පොදු ජනතාවට සාධාරණය කිරීමයි එහි අරමුණ.

ක්ලීන් ශ්‍රී ලංකා යනු වත්මන් ජනතා පාලනයේ ජනතා වුවමනාව. අනෙක් අතට ජනතාව ඉල්ලා සිටින ක්‍රමවේදයේ වෙනසේ හෘදය සාක්ෂිය. භෞතික පරිසරයෙන් ඇරැඹී සමාජයේ වෙන් වෙන් පුද්ගලයා ලෙස සම්පූර්ණ කරගන්නා ආධ්‍යාත්මික පවිත්‍රත්වය මෙහි ඉහළ එක් අවස්ථාවක් වුවත් පරිවර්තිත නව සමාජයේ, සමාජ හෘදය සාක්ෂිය ක්ලීන් ශ්‍රී ලංකා බවට පත් වන මොහොතයි මෙහි පරිපූර්ණ සමාජ ජයග්‍රහණය. එනම් පක්ෂ, පාට, ආගම්, කුලමල හා ප්‍රාදේශීය යන සියලු පටු බෙදුම් රේඛා බොඳ වී ප්‍රභූ සහ නිර්ප්‍රභූ වශයෙන් සමාජ බෙදුම් රේඛාව නිවැරැදි කරමින්, එහි සාතිශය බහුතරය වැඩකරන පංතිය වෙමින්, ඉතා කුඩා සුළුතර අලස ප්‍රභූ පංතිය හැකිළී යමින් සමාජ ප්‍රගමනය වෙනුවෙන් කැපවෙන 'සමස්ත මානව වර්ගයා' යන සාමූහික පොදු ගුණය වෙත යන තෙක් ක්ලීන් ශ්‍රී ලංකා නමින් හෝ වෙන නමකින් හෝ සමාජ ආධ්‍යාත්මික පවිත්‍රකරණය පවතිනු ඇති.

මේ සියල්ල යළි සලකා බලනවිට ක්ලීන් ශ්‍රී ලංකා යනු ජනතා අත්දැකීම විසින් ඉල්ලා සිටින ලද වැඩ පිළිවෙළක්. සමාජ සංවර්ධනය න්‍යායට අනුව සකස් කළ ජාතික ජන බලවේගයේ ක්‍රියාකාරී සැලැස්මේ අංගයක්. මෙය සාපේක්ෂ ව බලන්නේනම් ජනතා කැමැත්ත හා පාලනයේ ප්‍රතිපත්තිය එකට එක්වන මොහොත. එනම් ක්ලීන් ශ්‍රී ලංකා යනු වත්මන් ජනතා පාලනයේ ජනතා වුවමනාව. අනෙක් අතට ජනතාව ඉල්ලා සිටින ක්‍රමවේදයේ වෙනසේ හෘදය සාක්ෂිය. භෞතික පරිසරයෙන් ඇරැඹී සමාජයේ වෙන් වෙන් පුද්ගලයා ලෙස සම්පූර්ණ කරගන්නා ආධ්‍යාත්මික පවිත්‍රත්වය මෙහි ඉහළ එක් අවස්ථාවක් වුවත් පරිවර්තිත නව සමාජයේ, සමාජ හෘදය සාක්ෂිය ක්ලීන් ශ්‍රී ලංකා බවට පත් වන මොහොතයි මෙහි පරිපූර්ණ සමාජ ජයග්‍රහණය. එනම් පක්ෂ, පාට, ආගම්, කුලමල හා ප්‍රාදේශීය යන සියලු පටු බෙදුම් රේඛා බොඳ වී ප්‍රභූ සහ නිර්ප්‍රභූ වශයෙන් සමාජ බෙදුම් රේඛාව නිවැරැදි කරමින්, එහි සාතිශය බහුතරය වැඩකරන පංතිය වෙමින්, ඉතා කුඩා සුළුතර අලස ප්‍රභූ පංතිය හැකිළී යමින් සමාජ ප්‍රගමනය වෙනුවෙන් කැපවෙන 'සමස්ත මානව වර්ගයා' යන සාමූහික පොදු ගුණය වෙත යන තෙක් ක්ලීන් ශ්‍රී ලංකා නමින් හෝ වෙන නමකින් හෝ සමාජ ආධ්‍යාත්මික පවිත්‍රකරණය පවතිනු ඇති.

ශ්‍රී ලංකාව ලෙස අද අප සිටින්නේ එහි ආරම්භක අවධියේ. දැන් එය සාමූහික පුරුද්ද දක්වා යා යුතු ජනතා පාලනයක කැමැත්තක්. එය පුළුල් සමාජ සංස්කෘතියක් වන්නේ ජනතා පාලනය යන්න සැබවින් ම ජනතාව සතුවෙමින් එය පොදු සාමූහික ගුණයක් වන තරමට. ජනතාවට පාලන බලය පුළුල් ලෙස දිය යුතු වෙනවා. එය පුරුදු පුහුණු කළ යුතුයි. ප්‍රායෝගික අත්දැකීම් ලෙස ම ජනතා බලය භුක්ති විඳින ජනතා පාලනයකදී එය යළි කිසිදාක ජනතාව අත්හරින්නේ නැහැ. පාලකයන් ලෙසින් ද ජනතාව තනි පුද්ගලයන් ලෙසින් ද දූෂණයේ ගොදුරු බවට පත්වීම සමාජ හෘද සාක්ෂියේ පවිත්‍රත්වය විසින් පරාජය කරනු ලබන සමාජයක් කරා යාම ක්ලීන් ශ්‍රී ලංකා වන බැවින් ක්ලීන් ශ්‍රී ලංකා යනු ලංකික සමාජයේ හෘදය සාක්ෂිය.



# මැයි රතේ අයිතිය ?

ධනුෂ්ක හර්ෂන වික්‍රමරත්න

මැයි මාසයේ 01 දිනට ජාත්‍යන්තර කම්කරු දිනය යෙදෙන්නේ 1890 මැයි 01 දින සිට. එදින ජාත්‍යන්තර කම්කරු දිනය ලෙස නම් කෙරෙන්නේ මාක්ස්වාදයේ ප්‍රමුඛතම ගුරුවරයෙකු වන ෆෙඩ්රික් එංගල්ස්ගේ නායකත්වයෙන් වූ දෙවැනි ජාත්‍යන්තරය හෙවත් දෙවැනි ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයේ 1989 පැවැති පැරිස් සමුළුවේදී. එයට හේතු වන්නේ පැය 8ක වැඩමුරයක් ඉල්ලා කළ වර්ජනය හා කම්කරු රැලිය ඇමරිකානු පාලක ධනපති පංතිය විසින් මර්දනය කිරීම. 1886 මැයි 01 දින ඇමරිකානු කම්කරුවන් 40000කට අධික පිරිසක සහභාගිත්වයෙන් දැවැන්ත වැඩවර්ජනයක් ආරම්භ කළේ පැය 12 - 14 වැඩ දිනය වෙනුවට පැය 8ක් ඉල්ලාගෙන. 1986 මැයි 04 දින ඇමරිකාවේ චිකාගෝ නුවර හේමාකට් චතුරශ්‍රයේදී පැවැති උද්ඝෝෂණ රැස්වීමට පොලිසිය වෙඩි තැබීම හේතුවෙන් කම්කරුවන් පිරිසක් මිය ගියා. එදින වෙඩි වැදුණු තම සගයන්ගේ ලෙයින් රතු වූ ඇඳුම්, ධජ පතාක ලෙස ඔසවා ඔවුන් පෙළපාළි ගියා. වැඩකරන පංතියේ ධජය රතු වුණේ ඔවුන්ගේ රුධිරයෙන්. නඩු විභාගයකින් පසු අල්වා ගත් කම්කරු නායකයන් කිහිපදෙනෙකු සිර ගෙයට ද කිහිපදෙනෙකු එල්ලා මරා දැමීමට ද තින්දු වුණා. එල්ලා මරා දැමූ කම්කරු නායකයන් පස්දෙනා අතර සිටි ඔගස්ටස් ස්පයිස් තම අවසන් වචනය ලෙස ප්‍රකාශ කර සිටියේ 'අප මරා දමා අපේ හඬ නිහඬ කළ ද එම නිහඬ බව මහා හඬක් ව යළි නැගෙනු ඇත' යනුවෙන්.

මෙවර සැමරෙන්නේ 136 වැනි ලෝක මැයි දින සමරුව. ජාත්‍යන්තර වශයෙන් මැයි දිනය අරගලයේ දිවිදුන් සගයන් සැමරුමක් ලෙස ආරම්භ වුවත් පසුව එය කම්කරු පංති ව්‍යාපාරයේ බලය පෙන්වන සටන්කාමී පෙළපාළි සහ රැලි බවට පත් වුණා. සමාජවාදී සෝවියට් සංගමය ඇතුළු රටවල් 21ක සමාජවාදී රාජ්‍ය පද්ධතිය පැවැති සමයේ එම රටවල මැයි දින සැමරුම සමාජවාදයේ බලමහිමය පෙන්වන්නක් වුණා. එම අවධියේ ම අනෙකුත් සමාජවාදී නොවන රටවල මැයි දින කම්කරු ව්‍යාපාරයේ බලය පෙන්වන්නක් වුණා. මුලදී කම්කරු දිනය එහි වචනාර්ථයෙන් ම කම්කරුවන් සතු වුණත් පසුව මාක්ස්වාදී ගුරුවර, සෝවියට් සමාජවාදයේ සහ ලෝක කොමියුනිස්ට් තෙවැනි ජාත්‍යන්තරයේ නායක වී අයි ලෙනින් පසුගාමී ධනේශ්වර රාජ්‍යවල ගොවි කම්කරු සන්ධානයක් ඉල්ලා සිටීමත් සමග මැයි දිනය ගොවි කම්කරු බලය පෙන්වන දිනයක් බවටයි පත් වුණේ. මෙයින් කියැවෙන්නේ මැයි දිනයෙහි ආරම්භක අරුත ලෝක කම්කරු ව්‍යාපාරය හෙවත් සමාජවාදී ව්‍යාපාරයේ වර්ධනය අනුව විවිධ අර්ථවලින් පෙනී සිටි බව. එබැවින් බලය ගන්නට අරගල කරමින් සිටින කම්කරු ව්‍යාපාරයකට මැයි දිනයේ තේමාව ඒ අරමුණෙන්

> අද ලෝක දේශපාලන තත්ත්වය ද දේශීය වශයෙන් දේශපාලන තත්ත්වය ද වෙනස්. ජාත්‍යන්තර වශයෙන් ධනවාදයේ අසාර්ථක බව, විෂම බව, යල් පැනගිය බව සහ කෲර කොල්ලකාරී බව දැන් වෙනදාටත් වඩා ලොවට තහවුරුයි. එහෙත් ධනවාදී රැවටිල්ල අවසන් නැහැ. දේශීය වශයෙන් ද වර්තමාන තත්ත්වය විශාල වශයෙන් වෙනස්. ශ්‍රී ලංකාවේ ධනපති ක්‍රමය මෙන් ම ධනවාදී දේශපාලන ව්‍යාපාර ද බරපතළ කඩා වැටීමකයි පවතින්නේ. රටේ පැවැති ප්‍රභූ පාලන බලයෙන් ආණ්ඩු බලය ගොවි කම්කරුවන් ප්‍රමුඛ වැඩකරන පංතියේ ජනතා ව්‍යාපාරයට අත්පත් ව තිබෙනවා. එය ජනතාව අතින් සිදු වූ අත්වැරැද්දක් ලෙස පෙන්වන්නට ධනපති කණ්ඩායම් ද අවස්ථාවාදී වම ද උත්සාහ කළත් එය එසේ නොවන බව ඔවුන් පවා දන්නා කාරණයක්.

සකස් වන අතර බලය ලබා ගත්, බලය හොබවන වැඩකරන පංති ව්‍යාපාරයක මැයි තේමාව ලබාගත් බලය වර්ධනය හා සමාජ පරිවර්තනය වෙත ගොවි කම්කරුවන් මෙහෙයවන තේමාවක් සහිතවීම දේශපාලනිකයි. උදාහරණ වශයෙන් ජවිපෙ ප්‍රමුඛ ජාතික ජන බලවේගයේ මැයි දින තේමා පාඨය වන්නේ 'ජන රජයට ජන බලයක්' යන්න.

පළමු ව කම්කරු දිනය මර්දනය කළ ධනපති පාලකයන් කම්කරු ව්‍යාපාරයේ වර්ධනය දැක ක්‍රමයෙන් මැයි දිනය තමන්ගේ කරගන්නට වෙර දරන්නට වුණා. කම්කරු ව්‍යාපාරය මර්දනයෙන් අවසන් කළ නොහැකි බවදත් පාලක ධනපතියන් එය වැලඳගෙන තමන්ගේ ක්‍රමයකට සමරන්නට වුණා. මෙය වැඩබිම් මට්ටමින් ආයතන ප්‍රධානින් ලෙසත් ජාතික මට්ටමෙන් ධනපති පක්ෂ ලෙසත් සිදු කරනවා. බත් ගොට්ටන් බිහි කළේ මොවුන්. බත් ගොට්ට නැත්නම් බත් පැකැට්ටුවට, අරක්කු බෝතලයට වැඩකරන ජනතාව තම තැරැව්කරුවන් මාර්ගයෙන් කොළඹට අද්දවා වැඩි ම කම්කරු බලය අපි සමඟ යැයි පෙන්වන්නට එම ධනපති පක්ෂවලට හැකි වුණා. වාමාංශික ව්‍යාපාරයට ජවිපෙ එක්වීමත් සමඟ 80 දශකයේ මුල සිට දැවැන්ත කම්කරු පංති බලයක් එක්කොට සංවිධානාත්මක හා විචිත්‍රවත් මැයි පෙළපාළි දැක්වූයේ ජවිපෙ. සියලු පැරැණි වාමාංශික පක්ෂ ද නව වාමාංශික කල්ලි කණ්ඩායම් ද ජවිපෙ මැයි පෙළපාළි සහ මැයි රැලි අභිභවන්නට උත්සාහ කළත් එය සාර්ථක වූයේ නැහැ. ජනතාව ද ධනපති හා අවස්ථාවාදී දේශපාලන පක්ෂයක තම මැයි දින සැමරුමේ සාර්ථකත්වය මැන්නේ ජවිපෙ සාර්ථකත්වය නිර්ණායකයක් කරගෙන. ධනපති  පක්ෂ බලයේ සිටින අතර මුදල් වියදම් කරමින් විශාල වශයෙන් සෙනඟ රැස් කළ ද ජවිපෙ මැයි රැලියේ ජීව ගුණය ගන්නට ඒවාට නොහැකි වූයේ කුලියට මිනිසුන් ගෙන ඒම හා කම්කරු මර්දනය හැර අන් යමක් ඒවායේ නොවන නිසා.

අද ලෝක දේශපාලන තත්ත්වය ද දේශීය වශයෙන් දේශපාලන තත්ත්වය ද වෙනස්. ජාත්‍යන්තර වශයෙන් ධනවාදයේ අසාර්ථක බව, විෂම බව, යල් පැනගිය බව සහ ක්‍රෑර කොල්ලකාරී බව දැන් වෙනදාටත් වඩා ලොවට තහවුරුයි. එහෙත් ධනවාදී රැවටිල්ල අවසන් නැහැ. දේශීය වශයෙන් ද වර්තමාන තත්ත්වය විශාල වශයෙන් වෙනස්. ශ්‍රී ලංකාවේ ධනපති ක්‍රමය මෙන් ම ධනවාදී දේශපාලන ව්‍යාපාර ද බරපතළ කඩා වැටීමකයි පවතින්නේ. රටේ පැවැති ප්‍රභූ පාලන බලයෙන් ආණ්ඩු බලය ගොවි කම්කරුවන් ප්‍රමුඛ වැඩකරන පංතියේ ජනතා ව්‍යාපාරයට අත්පත් ව තිබෙනවා. එය ජනතාව අතින් සිදු වූ අත්වැරැද්දක් ලෙස පෙන්වන්නට ධනපති කණ්ඩායම් ද අවස්ථාවාදී වම ද උත්සාහ කළත් එය එසේ නොවන බව ඔවුන් පවා දන්නා කාරණයක්. අවස්ථාවාදී වමේ කෙනෙහිලිකම්, පරාජිත විපක්ෂයේ මඩ, අවලාද, ජනතාවගේ අතීත අත්දැකීම් මත වන සසල වීම් මෙන් ම බලය තහවුරු කරගනිමින් සහ සමාජ පරිවර්තන මඟේ යමින් තව අත්පත් කරගත යුතු වැඩකරන පංති ජයග්‍රහණ පවතිනවා. එහෙත් ලාංකික සමාජ පරිවර්තනයේ නවතම ආකාරය ජනතාවාදී පාලනය හා එක් ව ජනතාව ම අත්හදා බලමින් ජයග්‍රහණය කරා යා යුතු ව තිබෙනවා. මෙය කුමන අභියෝග

වත්මන් ශ්‍රී ලාංකික වැඩකරන ජනතාවට තම අභිලාෂය හා එක් ව යා හැකි ජනතාවාදී ජන පාලනයක් ලැබී තිබෙනවා. ඒ නිසා ඔවුන් නිශ්චිත ලෙස ම වාමාංශික ප්‍රායෝගික අත්දැකීම් ඔස්සේ පවතින ආණ්ඩුවේ මැයි දිනය හා එක්වෙමින් තම බලය සහ ආණ්ඩුව රැක ගැනීමේ ජනතා අභිලාෂය පෙන්වීමට මෙවර මැයි දින සැමරුම උපයෝගී කරගන්නවා ඇති.



යටතේ වුව ආණ්ඩුවට ද ජනතාවට ද අත්හළ නොහැකි වගකීමක්.


මෙවැනි පසුබිමක මෙවර ජනතා විමුක්ති පෙරමුණ ප්‍රමුඛ ජාතික ජන බලවේගයේ මැයි දිනය වැදගත් සහ තීරණාත්මක වූවක්. එක් අතකින් එය වැඩකරන පංති පාලන බලයක ජනසහභාගිත්වය පෙන්වන්නක්. අනෙක් අතට සියලු අවස්ථාවාදයට එරෙහි ව ගොවි කම්කරු ප්‍රමුඛ වැඩකරන පංති බලවේග ඒකරාශි කිරීමක්. ඍජු ලෙස නොපෙනුණ ද ලාංකික සමාජයේ ජනතාවාදී සමාජ පරිවර්තනය ජාතික විමුක්ති අරුතක් ගන්නවා. එබැවින් ඇත්තේ අධිරාජ්‍යවාදී බහුජාතික සමාගම් ආධිපත්‍යයට එරෙහි ව දේශප්‍රේමී සටනක්. ඒ නිසා මෙවර ශ්‍රී ලාංකික වැඩකරන ජනතාවගේ මැයි දිනය පංති අරගලය ද ජාතික විමුක්ති අරගලය ද එකට බැඳුණක්. එබැවින් ජාතික ජන බලවේගය රටපුරා විසිර ගිය ප්‍රධාන දැවැන්ත මැයි රැලි හා පෙළපාළි කිහිපයකට සූදානම්. ඇමරිකන්, ඊශ්‍රායල් හා ඉරාන යුද තත්ත්වය ඇති කළ බලශක්ති අර්බුදය හේතුවෙන් එම සැලසුම වෙනස් කර දිස්ත්‍රික් මට්ටමින් ජනතා පාලනය රැකගැනීම තේමාකොට දීපව්‍යාප්ත රැලි හා පෙළපාළි පවත්වන්නට නව සැලැස්මක් තිබෙනවා.

මෙවර ජාතිවාදය, ආගම්වාදය වතුකරයේ හෝ යාපනයේ හෝ ජනතාව තුළ ඇවිස්සිය නොහැකියි. පුදුමය වන්නේ සමස්ත විපක්ෂය ම තම මැයි දින සැමරුමේ අසාර්ථකත්වය සම්බන්ධයෙන් දැනට ම කරුණු දක්වන්නට ප්‍රසිද්ධියේ ඉදිරිපත් ව සිටීම. ඒ නිසා ආණ්ඩුවේ ජනතාවාදී මැයි දින සමරුව දේශපාලනික ව දැනටමත් ජයග්‍රාහී තත්ත්වයක පවතිනවා. විපක්ෂය නිතර ම යම් කුඩා කාලයකට හෝ යම් සුළු හෝ ජයග්‍රහණයක් ලබන්නේ වචන හරඹවලින්. එහෙත් සංවිධානාත්මක බව හා බලය පෙන්වීම වැනි අවස්ථාවල දිගුකාලීන ජයග්‍රහණය ලබන්නේ ආණ්ඩුවේ දේශපාලන ව්‍යාපාරය.

වත්මන් ශ්‍රී ලාංකික වැඩකරන ජනතාවට තම අභිලාෂය හා එක් ව යා හැකි ජනතාවාදී ජන පාලනයක් ලැබී තිබෙනවා. ඒ නිසා ඔවුන් නිශ්චිත ලෙස ම වාමාංශික ප්‍රායෝගික අත්දැකීම් ඔස්සේ පවතින ආණ්ඩුවේ මැයි දිනය හා එක්වෙමින් තම බලය සහ ආණ්ඩුව රැක ගැනීමේ ජනතා අභිලාෂය පෙන්වීමට මෙවර මැයි දින සැමරුම උපයෝගී කරගන්නවා ඇති.

# සංකල්ප ප්‍රායෝගික කළ යුතු වෙසක්





**පූජ්‍ය ගල්කන්දේ ධම්මානන්ද හිමි**
හිටපු ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
අධ්‍යක්ෂ, වල්පොළ රාහුල මධ්‍යස්ථානය

> අද ලෝකයේ අර්ථ ක්‍රමයක් ලෙස ජයග්‍රහණය කර තිබෙන්නේ පරිභෝජනවාදය. සත්ත්වයාට උපතින් ම ලෝභය, ද්වේෂය, මෝහය තිබෙනවා. මේ පරිභෝජනවාදය ආමන්ත්‍රණය කරන්නේ ලෝභයට. වාණිජකරණය, අධිපරිභෝජනය වැනි කරුණු බැහැර කළ විට විද්‍යාවේ දියුණුව යන්න අහිතකර කරුණක් නොවෙයි. එයින් ලෙඩ රෝග නැති කර ගැනීම, ආයු කාලය දීර්ඝ කර ගැනීම, ළදරු මරණ අඩුකර ගැනීම වැනි වටිනා උපයෝගිතාවක් තිබෙනවා. නමුත් විද්‍යාවේ දියුණුව අපට ලැබෙන්නේ වාණිජකරණයේ දැවටීමෙන්.

ඕනෑ ම ආගමක ශාස්තෘවරයා ඉතා වැදගත්. ශාස්තෘවරයාගේ ජීවිතය සම්බන්ධ සිදුවීම් ද එලෙස ම වැදගත්. ඒ අනුව බුදු දහම සම්බන්ධයෙන් උනන්දු වන පිරිසකට එහි ශාස්තෘවරයාගේ ජීවිතය සම්බන්ධ වැදගත් සිදුවීම් වන්නේ තෙමඟුල ලෙස හඳුන්වන උත්පත්තිය, බුද්ධත්වය, පිරිනිවන.

එහෙත් මේ අතරින් වඩා වැදගත් වන්නේ බුද්ධත්වයට පත්වීම යන කාරණය. බුදුවීම යන්න සිදු නොවුණානම් ඉපදීම සහ පිරිනිවන් පෑම යන දෙකෙහි සුවිශේෂත්වයක් නොතිබෙන්නට පුළුවන්. මේ නිසා වෙසක් යනු බුදුවීම සම්බන්ධයෙන් වන වැදගත් දිනය.

වසර 2500ක සිට වර්ධනය වෙමින් පැවතෙන්නක් අද අප වෙසක් ලෙස සමරනවා. එය කාලයක් තිස්සේ වෙනස්වීම්වලට බඳුන් වෙමින් පැමිණි සංස්කෘතිකාංගයක්. ගැමි ගොවි සමාජයක ජීවිතය සරලයි. එහෙත් අද අප ජීවත් වන්නේ වෙනස්, සංකීර්ණ සමාජයක. අද අන්තර්ජාලයෙන් ලෝකය ම සම්බන්ධ වී තිබෙනවා. ත්‍රිපිටකය වැනි කෘති අතීතයේ තිබුණේ පන්සලක කබඩයක පමණයි. එහෙත් අද අතැති ජංගම දුරකතනයෙන් ත්‍රිපිටකයේ ඕනෑ ම සූත්‍රයක් සැණෙකින් සොයා, කියවා ගන්නට පුළුවන්. එයත් ඉක්මවා අද AI තාක්ෂණය තිබෙනවා.

මේ අනුව බලන විට අප වෙසක් ගැන කතා කරන්නේ වේගයෙන් වෙනස් වන සංකීර්ණ සමාජයක සිට. මේ පරම්පරාව වෙසක් සැමරිය යුත්තේ මුල් වෙසක් සමඟ සසඳමින්. මේ පිළිබඳ ව බුදුන් වහන්සේගේ ධර්මයේත් සඳහන් වෙනවා. අප සිටින්නේ අවදියෙන් නොවේනම් අප අනුසෝතගාමී වෙන්න පුළුවන්. එනම් ගඟ ගලන දෙසට නොදැනුවත් ව ම අපත් ගමන් කරනවා. ඒ ගඟ ගලා යන පැත්තේ ලාභය, ප්‍රයෝජනය, තණ්හාව තිබෙන්නට පුළුවන්. අප අවදියෙන් නොමැතිනම් ධනය, බලය, කීර්තිය සඳහා උපකරණයක් ලෙස බුදුන් වහන්සේ පාවිච්චි කිරීමට අප පෙළඹෙන්නට පුළුවන්. එය බුදුන් වහන්සේ දෙසූ පණිවිඩයට අංශක 160ක් අනෙක් පැත්ත.

ඒ නිසා වෙසක් දවසට අප නැවත අවදි වෙමින්, බුදුවීම සමඟ සසඳමින් අදට තිබෙන අදාළත්වය සාකච්ඡා කරනවා වගේ ම ඒ අනුව වැඩසටහන් සැකසීමයි සිදු විය යුත්තේ. වාණිජකරණය හා බැඳුණු සමාජය

අර්ථාන්විත ව වෙසක් සැමරීමට යොමු කර ගැනීමයි මේ මොහොතේ වැදගත් ම කාරණය.

අද ලෝකයේ අර්ථ ක්‍රමයක් ලෙස ජයග්‍රහණය කර තිබෙන්නේ පරිභෝජනවාදය. සත්ත්වයාට උපතින් ම ලෝභය, ද්වේෂය, මෝහය තිබෙනවා. මේ පරිභෝජනවාදය ආමන්ත්‍රණය කරන්නේ ලෝභයට. වාණිජකරණය, අධිපරිභෝජනය වැනි කරණා බැහැර කළ විට විද්‍යාවේ දියුණුව යන්න අහිතකර කරුණක් නොවෙයි. එයින් ලෙඩ රෝග නැති කර ගැනීම, ආයු කාලය දීර්ඝ කර ගැනීම, ළදරු මරණ අඩුකර ගැනීම වැනි වටිනා උපයෝගිතාවක් තිබෙනවා. නමුත් විද්‍යාවේ දියුණුව අපට ලැබෙන්නේ වාණිජකරණයේ දැවටීමෙන්.

'බුදු දහමේ මුල් පණිවිඩය වෙත යෑම' යනුවෙන් අදහස් කරන්නේ ක්‍රිස්තු පූර්ව හය වැනි සියවසට යෑම නොවෙයි. ඒ නිසා ම නිරන්තරයෙන් අනුසෝතගාමී වීම යන්නයි මෙහි මිනුම් දණ්ඩ. වෙසක් සැමරීමේදී බුද්ධ චරිතය පිළිබඳ ගුණකථනවලට වඩා අද සමාජයේ ප්‍රශ්නවලට බුදු දහමෙන් ලැබෙන පිළිතුරු පිළිබඳ සැලකිලිමත් වීමයි ප්‍රායෝගික.

සමාජ ජීවිතයේ, ගෘහස්ථ ජීවිතයේ, පන්සලේ ප්‍රශ්න නිර්මාණය වී තිබෙනවා. පන්සල බලය ප්‍රකාශ කරන මධ්‍යස්ථානයක් බවට පත් ව තිබෙනවා. මෙවැනි අවස්ථාවලදී බුදු දහමේ පණිවිඩය සහ බුදුන් වහන්සේගේ අදාළත්වය කවරාකාර ද යන්න විමසා බැලීම සහ එතැනින් ප්‍රශ්නවලට පිළිතුරු ගොඩනගා ගැනීම වෙසක් සැමරීමට හොඳ ප්‍රවේශයක්. එය වෙසක් දිනයට අර්ථයක් එක් කරනවා.

වෙසක් උත්සවයේ සැබෑ අරුත සමාජගත කිරීමට බාධා මෙන් ම අභියෝග ද තිබෙනවා. ආගමික ආයතන දැඩි ලෙස සාම්ප්‍රදායික වීම, තත්ත්ව නඩත්තු කිරීම අලුත් පරම්පරාවට සමීප වීමට බාධාවක්. ඔවුන් ආමන්ත්‍රණය කිරීමට උචිත භාෂාව පිළිබඳ අප සැලකිලිමත් විය යුතුයි. අලුත් පරම්පරාව වෙනස් වන්නේ එදා නොලැබුණු තාක්ෂණය ඔස්සේ පැමිණි අවස්ථා අද ඔවුන්ට ලැබෙන නිසා. එය යහපතට හැරවිය හැකියි. මේ නිසා පරණ තත්ත්ව නඩත්තු කරනවා වෙනුවට නව ප්‍රවේශ වෙත එළඹීමට අප ලෑස්ති විය යුතුයි.

මිනිසා ස්වභාවයෙන් ම සමාජීයයි. සාමූහිකයි. ශාසනයෙන් අර්ධයක් ම පවතින්නේ කල්‍යාණ මිත්‍රයන් මත යැයි ආනන්ද තෙරුන් පැවසූ විට බුදුන් වහන්සේ වදාළේ අර්ධයක් නොව සම්පූර්ණයෙන් මේ ශාසනය පවතින්නේ කල්‍යාණ මිත්‍රත්වය මත යනුවෙන්.

මිනිසා ස්වභාවයෙන් ම සමාජීයයි. සාමූහිකයි. ශාසනයෙන් අර්ධයක් ම පවතින්නේ කළ්‍යාණ මිත්‍රයන් මත යැයි ආනන්ද තෙරුන් පැවසූ විට බුදුන් වහන්සේ වදාළේ අර්ධයක් නොව සම්පූර්ණයෙන් මේ ශාසනය පවතින්නේ කල්‍යාණ මිත්‍රත්වය මත යනුවෙන්. කල්‍යාණ මිත්‍රත්වය යනු හුදකලා වීම නොව අප අතර එකිනෙකාට දක්වන කරුණාව, මෛත්‍රිය සහිත සාමූහික බව. අද මිනිසුන් යාන්ත්‍රික වීමෙන් වන්නේ ඔවුන් එකිනෙකා තනිවීම. බෙදා හදා ගැනීමෙන් මිනිසුන් තුළ විවිධ හැකියා වැඩෙනවා. අනෙකා ව තේරුම් ගැනීමට, දරා ගැනීමට පුහුණු වෙනවා.

කල්‍යාණ මිත්‍රත්වය යනු හුදෙකලා වීම නොව අප අතර එකිනෙකාට දක්වන කරුණාව, මෛත්‍රිය සහිත සාමූහික බව. අද මිනිසුන් යාන්ත්‍රික වීමෙන් වන්නේ ඔවුන් එකිනෙකා තනිවීම. බෙදා හදා ගැනීමෙන් මිනිසුන් තුළ විවිධ හැකියා වැඩෙනවා. අනෙකා ව තේරුම් ගැනීමට, දරා ගැනීමට පුහුණු වෙනවා.

බුදු දහමේ විශාල අවධානයක් කරුණාවට මෛත්‍රියට යොමු වෙනවා. මෛත්‍රී භාවනාව යනු පුහුණු කරන්නක්. මේ අභ්‍යාසවලින් අනෙකා ගැන සිතීමට යොමු වෙනවා පමණක් නොවෙයි බුදු දහමේ පටිච්ච සමුප්පාද දැක්මට අනුව අනෙකාගෙන් වෙන් වුණු කිසිවෙක් නැහැ. සමාජය අන්‍යෝන්‍යයි.

ගමේ සියල්ලන් ම මල් නෙළාගෙන පැමිණීම මනස සුවපත් වන ලස්සන වැඩක් වුවත් එයට මෛත්‍රිය, කරුණාව, අන්‍යෝන්‍ය බව ඇතුළත් කළ යුතුයි. එක් කලෙක ඉංග්‍රීසි මාධ්‍ය හදාරන දරුවන් කණ්ඩායමක් බුදු දහම හදාරන්න වල්පොළ රාහුල මධ්‍යස්ථානයට පැමිණියා. මේ දරුවන් සිංහල පවුල්වල ඉංග්‍රීසි කතා කරන දරුවන්. ඔවුන් හැමෝ ම මල් රැගෙන ආවා. ඔවුන් සමඟ සාකච්ඡා කළා මල් යනු මොනවා ද? මල් වැදගත්



වෙන්නේ ඇයි? මල් පිපෙන්නේ ඇයි? මල් නැත්නම් ගෙඩි හැදෙන්නේ නැහැ, මල් නිසා ජීවත්වන සතුන්, පරාග පෝෂණය යන කාරණා පිළිබඳ. මේ සාකච්ඡාව විහිදී ගියා මල් ඇසුරින් අප කෙතරම් අන්‍යෝන්‍ය වෙනවාද යන්න. මේ කාලයේ දහස් ගණන් මල් රැස් කරමින් කරන පූජා ද ලංකාවේ තිබුණා. මේ අතරේ සාකච්ඡාව යොමු වුණා දවසක රටේ එක ම මල් වර්ගයක් කැඩුවොත් කුමක් සිදුවේද යන්න. දරුවන්ගේ පිළිතුර වුණේ ඒ මල්වලින් පමණක් ජීවත්වන සතුන් ඉන්නවානම් එම සතුන්ට ජීවත්වීම දුෂ්කර වන බව. මේ ඔස්සේ අවබෝධ වුණා සාහසික ලෙස මල් කැඩීම නොකළ යුතු බව. අවසානයේදී ඒ දරුවන් යෝජනා කළේ එක් අයෙක් එක මලක් පමණක් රැගෙන ආ යුතු බව.

නමුත් දරුවන්ට මඟ පෙන්වන්නා අධිපතියෙක් ලෙස මල් ගෙනෙන්නට එපා යැයි පැවසීම වෙනුවට පටිච්චසමුප්පාදය හිතේ තබාගෙන ඒ පිළිබඳ එක වදනක්වත් නොපවසා දරුවන් සමඟ සංවාදයේ



අප මතක තබා ගත යුතුයි අවුරුදු 2500ක් ගතවන විට එක පරම්පරාවක් දුටු දෙය ඊළඟ පරම්පරාව දකින්නේ නැති බව. අප මේ ප්‍රවාහයට ඇතුළු වන්නේ බොහෝ කලකට පසුව. ඒ නිසා කවුරුවත් වැරදි නැහැ. නමුත් මුල් පණිවිඩය වන්නේ ද මෙය නොවෙයි. කිසිම දෙයක් සම්පූර්ණ ප්‍රතික්ෂේප කළ යුතු නැහැ. එදිනෙදා හැම මොහොතක ම අපට අවස්ථා පැමිණෙන්නේ මේ සංසන්දනයට.

යෙදීම මේ අවබෝධයට හේතු වුණා. සියලු ම මල් කැඩීමෙන් මී මැස්සන්ට, සමනලයන්ට කුමක් සිදුවේ ද? පරාග පෝෂණය නොවුණොත් එල දරන්නේ කෙසේ ද? එල හට නොගන්නා විට කුරුල්ලන්ට කුමක් සිදුවේ ද? පරිසර සමතුලිතතාවට, ආහාරදාමයට කුමක් සිදුවන්නේ ද? යනුවෙන් සිතීමට මෙහිදී අවස්ථාව සැලැස්සුවා.

මෙසේ නිර්මාණශීලී වෙමින් තරුණ පරපුර සමඟ වෙසඟට අර්ථය දීම අභියෝගයක් නොවෙයි. එය සැබැවින් ම අවස්ථාවක්. සමාජයක් ලෙස අපට නිර්මාණශීලී වෙන්න පුළුවන්නම් අවස්ථා බොහෝ තිබෙනවා. හැමදාම තිබෙන්නේ ගාථා කටපාඩම් කරන්නනම්, බුද්ධ පූජා කරමින් සංවාදයක් ගොඩනැගීමට කාල අවකාශ විවර නොවන්නේනම් මෙවැනි අවස්ථා ගිලිහී යනවා. අපේ පුහුණුවේ මෛත්‍රිය නැහැ. අද තරග තිබෙනවා මල් වැඩිපුර ගේන දරුවන්ට ලකුණු දෙන. වෙසක් අරුත්බර කිරීමටනම් බුදු දහමේ සංකල්ප ප්‍රායෝගික කළ යුතුයි. බුදු දහමේ සඳහන් වන සම්මා වාචා යන්න පුහුණු වැඩපිළිවෙළක් බවට පත් කරන්නට පුළුවන්නම් මොනතරම් ගැටුම් අවම කරගන්න පුළුවන් ද?. බොහෝ අවස්ථාවල ප්‍රශ්නයක් සිදු වූ විට අවසානයේ ඉතිරි වන්නේ ප්‍රශ්නය නොව කතා කළ වචනයක්. සම්මා වාචා යන්න පුහුණු කිරීම අවශ්‍ය වන්නේ ඒ නිසා.

ජනමාධ්‍යයට, ආගමික නායකයන්ට, මාර්ගෝපදේශකයන්ට, ගුරුවරුන්ට හැකියාව තිබෙනවා එදිනෙදා ජීවිතයේ ඒ ඒ අවස්ථා ම උපයෝගි කරගනිමින් සමාජය අර්ථාන්විත ව වෙසක් සැමරීම සඳහා පොලඹවන්නට.

සාමය පිළිබඳ යහපත් සංවාදයක් ගොඩනගන්න වැඩම කළ සාම පා ගමනෙන් මතු වුණේ අනෙකා වෙනුවෙන් මම විඳවීම (suffer) යන කාරණය. එයයි විමුක්ති පණිවිඩවල අන්තර්ගත වන්නේ. බුදුන් වහන්සේත් තමාට තනිව ම නිවන් දැකීමට අවස්ථාව තිබියදී ලෝක සත්ත්වයා කෙරෙහි කරුණාවෙනුයි බුදු වෙන්න උත්සාහ කළේ. සය අවුරුද්දක් දුෂ්කර ක්‍රියාව යනු අනෙකා වෙනුවෙන් දුක් විඳීම. ජේසුස් වහන්සේට ඇණ ගැසුවේ, මහත්මා ගාන්ධි දුක් වින්දේ අනෙකා වෙනුවෙන් විඳවමින්.

මේ පා ගමනේදී ඇතැම් අය වැඩිපුර දුක් විඳිනවා පාවහන් පවා නොමැති ව ඇවිදීමෙන්. ඒ, ඔවුන්ගේ තෝරා ගැනීම. ඇයි ඒ කැපකිරීමට ඉඩ නොදී කෙසෙල් කොළ එළන්නට යන්නේ..? මේ සිදුවන සෑම දෙයක් දෙස ම බලමින් ඒ පිළිබඳ බුදු දහමේ මුල් පණිවිඩය සමඟ ගළපමින් සාකච්ඡා කළ යුතුයි.

අප මතක තබා ගත යුතුයි අවුරුදු 2500ක් ගතවන විට එක පරම්පරාවක් දුටු දෙය ඊළඟ පරම්පරාව දකින්නේ නැති බව. අප මේ ප්‍රවාහයට ඇතුළු වන්නේ බොහෝ කලකට පසුව. ඒ නිසා කවුරුවත් වැරදි නැහැ. නමුත් මුල් පණිවිඩය වන්නේ ද මෙය නොවෙයි. කිසිම දෙයක් සම්පූර්ණ ප්‍රතික්ෂේප කළ යුතු නැහැ. එදිනෙදා හැම මොහොතක ම අපට අවස්ථා පැමිණෙන්නේ මේ සංසන්දනයට. මූලික වශයෙන් වැදගත් වන්නේ හරය තේරුම් ගැනීම. සාහසික නොවීම මෙහිදී ඉතා වටිනා කරුණක්. අප යන මේ ගමනේදී මිනිස්සු වෙනස් වෙනවා. සෑම පන්සලක් ම ගමත් සමඟ මේ සංවාදය ආරම්භ කරමින් සාහසික ලෙස විප්ලවයක් නොව පරිවර්තනයක් කළ යුතුයි. වෙසක් යනු එයට අවස්ථාවයි.

සාකච්ඡා කළේ;

**නයෝමි අමරසිංහ**



## පවිටු දම් දුරලා ගිය සාම චාරිකා

# ඒහිපස්සිකෝ

නිශාන්ත පීරිස්

සාමය හා සදහම් මඟ ලෝකයේම මනු සිත් සුවපත් කරවන විශ්ව ඖෂධයක්. ලොවට අත්‍යවශ්‍ය ම මොහොතේ සාමය උදෙසා සම්බුදු දහම් මඟ වඩින භික්ෂූන් වහන්සේලා සමූහයක් චාරිකාගත වූ 'සාම පා ගමන' නොබෝදා (අප්‍රේල් 21 සිට අප්‍රේල් 28 දක්වා) ශ්‍රී ලංකාවේ ආකර්ෂණීයතම සිදුවීම වුණා. එය ලෝකයට ම පරමාදර්ශී වෑයමක් වූ අතර මෙවැන්නකට එළැඹීම ලක්වාසී අප සැවොමලත් භාග්‍යයක්.

සාම පා ගමන (Walk for peace) මෑතකාලීන ව ජනප්‍රිය වූයේ ඇමරිකාවේදී බෞද්ධ භික්ෂූන් වහන්සේලා සමූහයක් දින 110ක් පුරා සැතපුම් 2300ක් ගිය මහා පා ගමනත් සමඟ. එය නිමා වූයේ 2026 පෙබරවාරි 10 දින. ඇමරිකාවේ ටෙක්සාස් සිට වොෂින්ටන් ඩීසී දක්වා ගිය එම බොදු සාම පා ගමන මිලියනයකට අධික ඇමරිකානු ජනතාව පත් කළේ විස්මයට. පූජ්‍ය පඤ්ඤාකර තරුණ භික්ෂූන් වහන්සේගේ නායකත්වයත් 'ආලෝකා' නම් සුනඛයාගේ අවිහිංසාවාදී ප්‍රවේශයත් එම ගමන ධර්මාලෝකයක් බවට පත් කළා.

ශ්‍රී ලංකාවේ සාම පා ගමනට සැබවින් ම පසුබිම් වූයේ එම විස්මිත ක්‍රියාවලිය. ඇමරිකානු පා ගමනට සම්බන්ධ වූ හිමිවරු ම මේ පා ගමනට ද එක් වුණා. මෙය මෙලෙස සංවිධානය කිරීමේ පුරෝගාමී මෙහෙවර ඉටු කළේ මහනුවර අස්ගිරි විජයසුන්දරාරාම විහාරවාසී ඇමරිකාවේ ටෙක්සාස්හි ගෞතම



බෞද්ධ මධ්‍යස්ථානාධිපති ආචාර්ය පූජ්‍ය මේල්පිටියේ විමලකිත්ති මා හිමි. අදහස් දක්වන උන් වහන්සේ; ලොව්තුරා බුදුන් වහන්සේගේ ධර්මය ලොව පුරා ජනතාවට පිළිපැදීමට හැකි විශ්වීය දර්ශනයක්. එය සැමට සන්නිවේදනය කිරීමේ වගකීම දරන්නේ බෞද්ධ භික්ෂූන් වහන්සේ. ඇමරිකාවේ වාසය කරන අප සියලු දෙනා වහන්සේ එහිදී සිදු කළේ ද එවැනි උතුම් කාර්යයක්. ටෙක්සාස්හි මෙවර වෙසක් පොහෝ දිනය ප්‍රාන්ත රජයේ අනුග්‍රහයෙන් සැමරීමට තීරණය වීම ලෝකයේ ම බෞද්ධ ජනතාව ලැබූ සුබ පණිවිඩයක්. එම අවස්ථාවට ඓතිහාසික ප්‍රවේශයක් වශයෙන් මෙරට අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධි අංකුරයක් ටෙක්සාස් වෙත වැඩම කරවීමේ අරමුණ මූලිකවයි මේ පාගමනය සංවිධානය වුණේ. වියට්නාමයේ පඤ්ඤාකර හිමි ඇතුළු ඇමරිකාවේ වාසය කරන විදෙස් භික්ෂූන් වහන්සේලා අනුරාධපුරයේ සිට කොළඹට පාගමනින් ගෙන වැඩම කළේ එම ශ්‍රී මහා බෝ අංකුරය. ඒ එන මඟ සියලු ජනතාවටත් මේ සුපින්වත් කාර්යයට දායක වීමට ලැබුණේ ඉතා භාග්‍යවත් අවකාශයක්."

ක්‍රිපූ 588 බුදුරජාණන් වහන්සේ තම පළමු ශ්‍රාවකයන් සැට නම අමතා ප්‍රකාශ කළේ "චරථ භික්ඛවේ චාරිකං බහු ජන හිතාය

බහු ජන සුඛාය ලෝකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දේව මනුස්සානං..." යනුවෙන්. ඒ, "මහණෙනි බොහෝ දෙනාගේ හිත සුව පිණිස ගම් නියම් ගම්වල සැරි සරන්න. මුල මැද කලණ වූ දහම දේශනා කරන්න..."යනාදී වූ අර්ථයෙන්. අද අපට අවැසි ව ඇත්තේ ද ලෝකයේ ම මනුෂ්‍ය සිත් සතන් පරක් තෙරක් නොමැති ව ඉවක් බවක් නොමැති ව සීසීකඩ විසිර යද්දී එය නිවා සනහාලීමට උපකාරී වන එකම දිය පොද සද්ධර්මය පමණක්ම වීම.

විශේෂයෙන් ඇමරිකානු සාම පා ගමනේ නියමුවා ලෙස කටයුතු කළ වියට්නාම් ජාතික පඤ්ඤාකර හිමියන් ප්‍රමුඛ බෞද්ධ භික්ෂු පිරිස කෙරෙහි ලාංකික ජනතාව තුළ ඇත්තේ ද අප්‍රමාණ ගෞරවයක්. ලොව ථෙරවාදී බෞද්ධ කේන්ද්‍රස්ථානය වන ශ්‍රී ලංකාව පිළිබඳ උන්වහන්සේලා තුළ ඇත්තේ ද  ගෞරවය පෙරදැරි ඉතා උසස් හැඟීමක්. සැබවින්  ම ඒ බව සනාථ කරවීමයි අපගේ වගකීම විය යුතු ව තිබුණේ. රටක ජනතාව ලෙස විදෙස් භික්ෂු කණ්ඩායමක් අප රටේ සාම පා ගමනක් යෑම මාතෘභූමියේ කීර්තිය, තේජස ලොවට විදහා පාන විරල අවස්ථාවක්. ඒහිපස්සිකෝ යන බුදු වදනට මුල් තැන දෙමින් ගිය මේ සාම ගමනින් ගම්‍ය වූයේ ධර්මය විමසා බැලීමේ විශිෂ්ට ගුණාංගය. මෙහි ගමන් කළ ආලෝකා නැමති සුනඛයා සංකේතාත්මක ව පවසනුයේ ලොව පුරා පැතිරවිය යුතු මානව දයාව හා සත්ත්ව කරුණාව. සම්බුද්ධ ධර්මය මිනිසා, සතා සීපාවා පමණක් නොව සියලු ප්‍රාණීන්ට ම මෙත් සිත් පතුරවන, සොබා දහමට අපමණ ආදරය කරන උත්තරීතර දහමක්. අප උරුමය දරන එම සද්ධර්මය අප සැබවින් ම රකින්නේ ද යන්න මීට වඩා ගැඹුරින් සිතා බැලිය යුතු බව මේ ගමනින් පැහැදිලි වූ සත්‍යයක්.

අප්‍රේල් 21 දින අනුරාධපුරයෙන් ශ්‍රී මහා බෝධි අංකුරය වැඩමවීමෙන් පසුව අප්‍රේල් 22 දින දඹුල්ලේ සිටයි සාම පා ගමන ආරම්භ කළේ. මාතලේ අලු විහාරය, මහනුවර ශ්‍රී දළදා මාළිගය, බෙලිගම්මන විහාරය, තෝලංගමුව ජාතික පාසල, යක්කල අබේසේකරාරාමය, කැලණිය රජමහවිහාරය ආදී නැවතුම් මධ්‍යස්ථාන පසු කරමින් අප්‍රේල් 28 දින ප්‍රධාන උත්සවය පැවැත්වුණේ කොළඹ නිදහස් චතුරශ්‍රයේදී. ඒ, ත්‍රෛනිකායික මහ සඟරුවන, ජනාධිපතිවරයා ඇතුළු රාජ්‍ය ප්‍රධානීන්ගේ මූලිකත්වයෙන්. මෙහිදී ජය ශ්‍රී මහ බෝධි අංකුරය ඇමරිකාව වෙත නිල වශයෙන් පිරිනැමුණේ සාම්ප්‍රදායික රාජ්‍ය තාන්ත්‍රික යුතුකම ඉටු කරමින්.

සාම පා ගමනේ යථාර්ථය නිවැරදි ව කියවා ගැනීම ජාතියක් වශයෙන් අපට හැකි වූයේ ද යන්න තව දුරටත් සිතා බැලිය යුත්තේ ගැඹුරින්. මෙය ලෝකයේ ප්‍රධාන ථෙරවාදී බෞද්ධ රට හා ලොව බලවත් ම රාජ්‍යය අතර ආගමික සංස්කෘතික බැඳීමක උපරි සංධිස්ථානයක්. එසේම ලෝකයේ අප රටට හිමි බෞද්ධ අනන්‍යතාව හා පිරිසිදු ථෙරවාදී දහම ආරක්ෂා කර ගැනීමට මෙරට වෙසෙන සියලු භික්ෂූන් වහන්සේලාට මෙන් ම රජය ඇතුළු මහ ජනතාවට රුධිරගත බැඳීමක්, වගකීමක් හා වගවීමක් ඇති බව යළි ශපථ කරවීමක්.

ක්‍රිපූ 588 බුදුරජාණන් වහන්සේ තම පළමු ශ්‍රාවකයන් සැට නම අමතා ප්‍රකාශ කළේ "චරථ භික්ඛවේ චාරිකං බහු ජන හිතාය බහු ජන සුඛාය ලෝකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දේව මනුස්සානං..." යනුවෙන්. ඒ,**"මහණෙනි බොහෝ දෙනාගේ හිත සුව පිණිස ගම් නියම් ගම්වල සැරි සරන්න. මුල මැද කලණ වූ දහම දේශනා කරන්න..."**යනාදී වූ අර්ථයෙන්. අද අපට අවැසි ව ඇත්තේ ද ලෝකයේ ම මනුෂ්‍ය සිත් සතන් පරක් තෙරක් නොමැති ව ඉවක් බවක් නොමැති ව සීසීකඩ විසිර යද්දී එය නිවා සනහාලීමට උපකාරී වන එකම දිය පොද සද්ධර්මය පමණක්ම වීම.



# කලාපීය යුද්ධයේ ගෝලීය අර්බුදය




ඇමරිකාව- ඊශ්‍රායලය සහ ඉරානය අතර යුද්ධය යම් ආකාරයකට සමථයකට පත් වී තිබුණත් එය නිශ්චිත විසඳුමකට මෙතෙක් එළැඹී නැහැ. යුද්ධය සෘජු ව ම නොපැවතියත් එහි වක්‍රාකාර බලපෑම් තිබෙනවා.

මේ අර්බුදයට විසඳුම් සෙවීම සඳහා ඇමරිකාව සහ ඉරානය අතර පළමු වටයේ සාකච්ඡා පාකිස්තානයේදී පැවතුණා. එහිදී නිශ්චිත එකඟතාවකට පැමිණියේ නැහැ. පැවැත්වීමට නියමිත ව තිබූ ඇමරිකා-ඉරාන දෙවැනි වටයේ සාකච්ඡා අවලංගු කර තිබෙනවා. දෙවැනි වටයේ සාකච්ඡා සඳහා ඉරාන නියෝජිතයන් පාකිස්තානයට පැමිණියත් ඔවුන් ඇමරිකා නියෝජිතයන් මුණ නොගැසී ආපසු පිට ව ගොස් තිබෙනවා. මෙවැනි පසුබිමක ඇමරිකා නියෝජිතයන් පාකිස්තානයට එවන්නේ නැති බවත් අවශ්‍යනම් ඉරානය සමඟ දුරකතන මාර්ගයෙන් සාකච්ඡා කළ හැකි බවත් ඇමරිකා ජනාධිපති Donald Trump සඳහන් කළා. එසේ ම ඉරානය බුද්ධිමත් තීරණයක් ගත යුතු බවත් න්‍යෂ්ටික ආයුධ නිෂ්පාදනය පිළිබඳ කිසිදු ආකාරයක අවධානයක් යොමු නොකළ යුතු බවත් ඔහු අවධාරණය කර තිබෙනවා.

එම කාලය අතරතුරදී ඉරානය හෝමූස් හරහා යාමට පැමිණි නෞකා අවහිර කළ අතර ඇමරිකාව, ඉරාන වරායවලින් පිටවන නෞකා අවහිර කිරීමේ ක්‍රියාවලියේ නිරත වුණා. ඇමරිකා ජනපතිවරයා පවසන්නේ ඉරාන නායකත්වය විනාශ කර ඇති බැවින් ඔවුන්ගේ නායකයන් පිළිබඳ පවතින්නේ අවිනිශ්චිත තත්ත්වයක බව. එහෙත් ඉරාන බලධාරින් සඳහන් කරන්නේ උත්තරීතර නායක Mojtaba Khameneiගේ උපදෙස් මත සියලු ක්‍රියාමාර්ගවලට එළැඹ ඇති බව. ඔහු සමඟ වසර 15ක් සිටි පිරිසක් ටෙහෙරාන්හි තීරණ ගැනීමේ මධ්‍යස්ථානවලට යොමු කර ඇති බව අල්ජසීරා ප්‍රවෘත්ති සේවය සඳහන් කරනවා.

ඒ අතරතුර එක්සත් අරාබි එමීර් රාජ්‍යය තීරණය කර තිබෙන්නේ OPEC සංවිධානයෙන් ඉවත්වීමට. යුද්ධය සහ OPEC සංවිධානයේ මැදිහත් වීම මත ඇති වූ තත්ත්වය වෙනසකට ලක් කිරීමයි ඔවුන්ගේ අරමුණ. ඒ අනුව නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීම වෙනුවෙන් මේ තීරණය ගත් බවයි ඔවුන් පවසන්නේ. එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ ඇමරිකාව අතර සහයෝගිතාව වර්ධනය වීමට ද මෙය හේතුවක් විය හැකියි. OPEC ධාරිතාවෙන් 15%ක් පමණ අයත් වන්නේ එක්සත් අරාබි එමීර් රාජ්‍යයට. ඔවුන්ගේ මේ තීරණයත් සමඟ OPEC සංවිධානයේ පැවැත්ම සම්බන්ධයෙන් ද යම් ආකාරයක ගැටලුකාරී තත්ත්වයක් මතු ව තිබෙනවා. පවතින වාතාවරණය අනුව ලෝක බැංකුව පෙන්වා දෙන්නේ බලශක්ති මිල ගණන් 24%කින් පමණ ඉහළ යනු ඇති බව. කෙසේ වෙතත් වර්තමානයේ පවතින්නේ අවිනිශ්චිත තත්ත්වයක්.

ඉරානය සහ ඇමරිකාව අතර අප්‍රේල් 08 දින සිට ආරම්භ වූ සටන් විරාමය යළි දීර්ඝ කරන බව ඇමරිකා ජනාධිපතිවරයා සඳහන් කළා. ඒ, පාකිස්තානයේ ඉල්ලීම පරිදි සාකච්ඡා අවසන් වන තුරු. මැදපෙරදිග කලාපයේ ආතතිය අඩුවීමක් සිදු වන බවක් පෙනෙන්නට නැහැ. ඇමරිකාවේ තවත් ගුවන් යානා ප්‍රවාහන නෞකාවක් මැදපෙරදිග කලාපයට යොමු කිරීමත් ඒ අතර දැක ගත හැකියි.

යුද්ධය ආරම්භ වූ පෙබරවාරි 28 දින සිට පුද්ගලයන් 3000කට වැඩි පිරිසක් මියගොස් ඇති බව ඉරානයේ මානව හිමිකම් ක්‍රියාකාරී කණ්ඩායම පෙන්වා

**චන්දන මාරසිංහ**

දෙනවා. ඒ අතර ළමයින් ද සිටිනවා. සමාජ ආරක්ෂක අමාත්‍යාංශය පෙන්වා දෙන්නේ යුද්ධයෙන් ඉරානයේ මිලියන 02කට පමණ රැකියා අහිමි වී ඇති බව. ලෙබනන් සෞඛ්‍ය අමාත්‍යාංශය පෙන්වා දෙන්නේ ඊශ්‍රායල ප්‍රහාර හේතුවෙන් එරට පුද්ගලයන් 1947 දෙනෙක් මියගොස් ඇති බව. ගල්ෆ් කලාපයේ අනෙකුත් රටවල අවම වශයෙන් පුද්ගලයන් 24 දෙනෙකු මිය ගොස් ඇති බව සඳහන්. දකුණු ලෙබනනයේ වෙන ම ආරක්ෂක කලාපයක් ප්‍රකාශයට පත් කිරීමට ඊශ්‍රායලය සැලසුම් කර තිබෙනවා. ලෙබනනයට එරෙහි යුද්ධය අවසන් කිරීම සඳහා තාවකාලික සටන් විරාමයක් ප්‍රකාශයට පත් කර තිබුණත් ඊශ්‍රායලය වරින් වර ලෙබනනයට ප්‍රහාර එල්ල කිරීම නවතා නැහැ. යුද්ධය ආරම්භයේ සිට ඉරානය විසින් 21 දෙනෙකුට මරණ දඬුවම නියම කරන ලද බව එක්සත් ජාතීන්ගේ සංවිධානය සඳහන් කරනවා. තවත් 4000කට පමණ සිදු වී ඇත්තේ අත්අඩංගුවේ පසුවීමට.

යුද්ධය හේතුවෙන් මැදපෙරදිග ආර්ථික බිඳ වැටීම ගැන එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන අනතුරු අඟවා තිබෙනවා. ඒ අනුව එම කලාපයේ දළ දේශීය නිෂ්පාදනය 6%කින් අඩු විය හැකි අතර මූල්‍ය වෙළෙඳපොළට එල්ල වන බාධා නිසා ඩොලර් බිලියන 120-194 අතර මූල්‍ය පාඩුවක් සිදුවිය හැකියි. නැව්වල රක්ෂණ පිරිවැය ඉහළ යාම සහ අස්ථාවර තෙල් මිල හේතුවෙන් අන්තර් සම්බන්ධිත ආර්ථිකවලට බලපෑම් එල්ල විය හැකියි. උද්ධමනය මෙන් ම ණය ගැනීමේ පිරිවැය ද ඉහළ යා හැකි අතර ආහාර සහ බලශක්ති මිල ගණන් ඉහළ යාමෙන් කලාපයේ මිලියන 04කට ආසන්න පිරිසක් දරිද්‍රතාවට පත් කළ හැකි බවත් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන පෙන්වා දෙනවා. මෙහි බරපතළ ම බලපෑම එල්ල විය හැක්කේ ඉරානයට. එහි මිලියන සංඛ්‍යාත පිරිසක් දරිද්‍රතාවට පත් වීම ද වැළැක්විය නොහැකියි. යුද්ධය ආරම්භයේ සිට ගෝලීය ගුවන් ප්‍රවාහන ඉන්ධන මිල දෙගුණයකට වඩා වැඩි වී ඇති බව ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමය පවසනවා. ආසියා කලාපයට ද මෙහි බලපෑම වැඩි වශයෙන් එල්ල වී තිබෙන අතර උතුරු ඇමරිකා කලාපයට එම වැඩිවීම පෙන්වා ඇත්තේ සියයට 88%ක් ලෙස. හෝමූස් හරහා ගමන් කරන නැව්වලින් ගාස්තු අය කිරීමට ඉරාන පාර්ලිමේන්තු අනුමැතිය හිමි වූ අතර ඉන් එකතු කළ පළමු ගාස්තුව මුල්වරට මහා භාණ්ඩාගාරයට යොමු කළ බව ඉරානය පවසනවා. ඉන් සිදුවන්නේ භාණ්ඩ ප්‍රවාහන ගාස්තු තවත් ඉහළ යාම. යුද්ධය නිසා මතුවන තර්ජන හේතුවෙන් ගල්ෆ් කලාපයේ දිනකට බොරතෙල් බැරල් මිලියන 15ක් පමණ සිර වී ඇති අතර ඉන් ගෝලීය වෙළෙඳපොළේ අස්ථාවරත්වයක් නිර්මාණය වීම වළක්වන්නට බැහැ.

> යුද්ධය හේතුවෙන් ඇමරිකාව ලෝකයට එල්ල කළ බලපෑම සම්බන්ධයෙන් යළිත් සලකා බැලීමේ තත්ත්වයක් මතු කර තිබෙනවා. මුස්ලිම් බහුතර රටවල ජනතාව ඇමරිකාවට එරෙහි විරෝධතාවල නිරත වීම, NATO සංවිධානයේ ඇතැම් සාමාජිකයන් යුද්ධයට මැදිහත්වීම ප්‍රතික්ෂේප කිරීම ඉන් කිහිපයක්. යුද්ධය අපේ දෙයක් නොවේය යන්න NATO හි ඇතැම් නායකයන් සඳහන් කළත් ඇමරිකාවේ යුද ශක්තිය නෙටෝ සංවිධානයේ ප්‍රධානතම ශක්තියක් බව ද පෙන්වා දිය යුතුයි. ඇමරිකාව නෙටෝවෙන් ඉවත් වුවහොත් එය ඇමරිකා අභ්‍යන්තරයේ දේශපාලන ගැටලුවක් ද විය හැකියි.

ඉන්ධන සම්බන්ධයෙන් මතු වන ගැටලු අවම කිරීම සඳහා බංගලි දේශය වැනි රටවල් හඳුන්වා දී තිබෙන්නේ සලාක ක්‍රමයක්. වසර 04කට පසුව බ්‍රිතාන්‍යයේ පළමුවරට පෙට්‍රල් මිල 14%කින් හා ඩීසල් මිල 27%කින් ඉහළ ගොස් තිබෙනවා. සමුද්‍ර සන්ධිය අවහිර කිරීම නිසා නැව් 2000ක් පමණ කලාපයේ සිර වී ඇති බවයි ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය පවසන්නේ. යුද්ධය නිසා ලෝකයේ බොරතෙල් සහ ස්වාභාවික ගෑස් සැපයුම්වලින් 20%ක් පමණ අහිමි කර තිබෙනවා.

ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර වැඩසටහන පෙන්වා දෙන්නේ තෙල්, ස්වාභාවික ගෑස් සහ පොහොර මිල ගණන් වැඩිවීම ආහාර අර්බුදයක් ඇතිවීමට හේතුවක් විය හැකි බව. ඒකාබද්ධ ප්‍රකාශනයක් නිකුත් කරමින් ඔවුන් සඳහන් කළේ අඩු ආදායම්ලාභී හා ආනයන මත යැපෙන ආර්ථිකවලට මෙය අවදානම් බව. මේ වන විටත් උග්‍ර ආහාර හිඟයකින් පෙළෙන ජනගහනය මිලියන 300ක් පමණ වෙනවා. එය 20%කින් පමණ ඉහළ යා හැකි බවයි ලෝක බැංකුව පවසන්නේ.

ධවල මන්දිරය පෙන්වා දෙන්නේ 2027 මූල්‍ය වර්ෂය සඳහා ජනාධිපති Donald Trump ආරක්ෂක වියදම් ලෙස ඩොලර් ට්‍රිලියන 1.5ක් අය වැයට ඇතුළත් කිරීමට තීරණය කර ඇති බව. එහෙත් ජනාධිපතිවරයාට යුද්ධ කිරීමට ඇති හැකියාව සීමා කරමින් සෙනෙට් සභාවට ඉදිරිපත් වූ තවත් යෝජනාවක් පරාජය වී තිබෙනවා.

The Economist පෙන්වා දෙන ආකාරයට හෝමූස් හේතුවෙන් ඇති වූ අවපාතය නිර්මාණය කරන දුෂ්කරතා වඩාත් වර්ධනය විය හැකියි. ඇමරිකාවට ජෙට් ඉන්ධන අවසන් වීමේ ක්ෂණික අවදානමක් නැතත් ගෝලීය හිඟය ඔවුන්ට ද බලපෑම් කර තිබෙනවා. ඇමරිකාවේ සංචාරකයන්ගේ ගමන් ගාස්තු ඉහළ යාමට එය හේතු වුණා. ගුවන් සමාගම්වල දෙවැනි විශාලතම පිරිවැය වෙන් වන්නේ ඉන්ධනවලට. කුවේට් සහ බහරේන්වල සැපයුමට බාධා එල්ල වුවහොත් මේ තත්ත්වය තවත් වර්ධනය විය හැකියි. නව අවි ආයුධ නිෂ්පාදනය සඳහා පෙන්ටගනයට 2027 වසර වෙනුවෙන් ඩොලර් බිලියන 31.8ක් අවශ්‍ය බව මාධ්‍ය වාර්තා කරනවා. යුද්ධය වෙනුවෙන් වියදම් දැනටමත් ඩොලර් බිලියන 50ක

මට්ටමට ළඟා වී ඇති බව ඩිමොක්‍රටික් පක්ෂය ඇස්තමේන්තු කර තිබෙන්නක්. දෙවැනි ලෝක යුද්ධයෙන් පසු වැඩි ම ආරක්ෂක වියදමක් සිදු කර තිබෙන්නේ ට්‍රම්ප් පරිපාලනය.

හාවඩ් විශ්වවිද්‍යාලය පෙන්වා දෙන්නේ ගැටුම් අවසානයේ ඇමරිකාවේ බදු ගෙවන්නන්ට ඩොලර් ට්‍රිලියනයක් දක්වා අමතර ව වැය කිරීමට සිදු විය හැකි බව. කෙසේ වෙතත් ධවල මන්දිරය එය ප්‍රතික්ෂේප කර තිබෙනවා. 2027 වසරේ ආරක්ෂාව සඳහා ඩොලර් ට්‍රිලියන 1.5ක්





අනුමත කරන ලෙස කොංග්‍රසය ඉල්ලා ඇති අතර එය 40%ක වැඩි වීමක්.

යුද්ධය නිසා ලොවට අහිමි වූ තෙල් සැපයුමෙන් ඩොලර් බිලියන 50ක් පමණ අහිමි වී අවසන්. තෙල් නිෂ්පාදනයෙන් දිනකට බැරල් මිලියන 10ක් පමණ අඩු වී ඇති බව නාවික විශ්ලේෂකයන් වන Kpler ආයතනය පෙන්වා දෙනවා. භාණ්ඩ සැපයීම සඳහා වන බාධා නිසා 2026 හා 2027 යන කාලයේදී ආසියා පැසිපික් කලාපයේ ආර්ථික වර්ධනය 5.4% සිට 5.1% දක්වා මන්දගාමී විය හැකියි.

යුද්ධය හේතුවෙන් ඇමරිකාව ලෝකයට එල්ල කළ බලපෑම සම්බන්ධයෙන් යළිත් සලකා බැලීමේ තත්ත්වයක් මතු කර තිබෙනවා. මුස්ලිම් බහුතර රටවල ජනතාව ඇමරිකාවට එරෙහි විරෝධතාවල නිරත වීම, NATO සංවිධානයේ ඇතැම් සාමාජිකයන් යුද්ධයට මැදිහත්වීම ප්‍රතික්ෂේප කිරීම ඉන් කිහිපයක්. යුද්ධය අපේ දෙයක් නොවේය යන්න NATO හි ඇතැම් නායකයන් සඳහන් කළත් ඇමරිකාවේ යුද ශක්තිය නෙටෝ සංවිධානයේ ප්‍රධානතම ශක්තියක් බව ද පෙන්වා දිය යුතුයි. ඇමරිකාව නෙටෝවෙන් ඉවත් වුවහොත් එය ඇමරිකා අභ්‍යන්තරයේ දේශපාලන ගැටලුවක් ද විය හැකියි. ඇමරිකා ජනාධිපතිගේ යුද ක්‍රියාමාර්ග පිළිබඳ NBC ආයතනය සිදු කළ මත විමසුමකින් හෙළි වූයේ ඇමරිකා ජාතිකයන්ගෙන් 2/3ක් පමණ මේ යුද්ධයට අප්‍රසාදය පළ කර ඇති බව. එසේ ම ඇමරිකාවේ කළ සමීක්ෂණවලින් හෙළි වී තිබෙන්නේ වියට්නාම යුද්ධයෙන් අනතුරු ව බහුතර පිරිසක් අප්‍රසාදය පළ කරන යුද්ධය මෙය බව. අල්ජසීරා වාර්තා කරන ආකාරයට යුද්ධය ආරම්භයේදී ඊට අකමැති වූ ඇමරිකා ජාතිකයන්ගේ සංඛ්‍යාව 43%ක්. අප්‍රේල් 12 දින වන විට එම සංඛ්‍යාව 60% දක්වා වැඩි වී තිබෙනවා.

යුද්ධය හේතුවෙන් ඇමරිකාව සතු අවි ආයුධවල ක්ෂය වීමක් සිදු ව තිබෙන බවයි වාර්තා වන්නේ. ඉරානය සමඟ යුද්ධය අවසන් වී වෙනත් යුද්ධයක් ඇතිවුවහොත් ප්‍රබල විරුද්ධවාදියෙකුට මුහුණදීම සඳහා පවතින ආයුධ ප්‍රමාණවත් නොවන අතර පෙර මට්ටමට යළි ළඟාවීම සඳහා වසර කිහිපයක් ගතවිය හැකි බව CSIS විශ්ලේෂණ ආයතනය දක්වා තිබෙනවා. Bloomberg දක්වන ආකාරයට ඇමරිකාවේ නාවික ආධිපත්‍යය ද අඩු වී තිබෙනවා. දැනට පවතින නැව් 300න් බටහිර අර්ධ ගෝලයේ සිට පැසිපික් දක්වා මෙහෙයුම් කිරීමට සිදු ව තිබෙන අතර එය පහසු නැහැ.

www.americanprogress.org වෙබ් අඩවිය පෙන්වා දෙන්නේ දූෂිත වායුව හා දූෂිත ජලය හේතුවෙන් දිගුකාලීන සෞඛ්‍ය අවදානමක් ද මතු ව ඇති බව. තෙල්, රසායනික කම්හල් සහ ආයුධ ගබඩාවලට බෝම්බ හෙළීම හේතුවෙන් සිදුවන පරිසර හානිය ද ඉහළ ගොස් තිබෙනවා. මැදපෙරදිග කලාපය ජල හිඟයකට මුහුණදෙන බැවින් ජනගහනයෙන් 83%කට පමණ ජල අනාරක්ෂිත බවක් ඇතිවීමේ අවදානමක් ද තිබෙනවා. ගල්ෆ් කලාපය පුරා පානීය ජලය බවට පිරිසිදු කර භාවිත කරන්නේ මුහුදු ජලය. මෙහි ක්‍රියාවලිය කම්හල් මත රඳා පවතින නිසා මේවාට හානි සිදුවුවහොත් මානුෂීය අර්බුදය උත්සන්න විය හැකියි.

මෙවැනි පසුබිමක යුද්ධය ඉතා කඩිනමින් අවසන් නොවුවහොත් සාමකාමී, දේශපාලනික, තානාපති මාර්ගයේ විසඳුම් මීට නොලැබුණහොත් මේ අර්බුදකාරී තත්ත්වය තවදුරටත් උත්සන්න වීම වැළැක්විය නොහැකි වනු ඇති.





ඉදිරියෙන් සිටින්නේ රීඩ්. පිටුපසින් වමේ සිට: ක්‍රිස්ටිනා, වික්ටර්, ජෙරමි

# සඳ වටා ගිය සඳ

**නිහාල් පීරිස්**

අජටාකාශගාමීන් සිව් දෙනෙකු සඳ ආසන්නයට ගොස් එය වටා රවුමක් ගසා පෙරළා පෘථිවිය කරා පැමිණි ආටෙමිස් 2 (Artemis 2) අභ්‍යවකාශ මෙහෙයුම පසුගිය දිනවල ලොව විශාල අවධානයක් දිනා ගත්තා. අභ්‍යවකාශ ගමන් නිතර සිදු වුවත් සඳ වෙත යන ගමන් එලෙස නිතර සිදු වන්නේ නැහැ. ආටෙමිස් 2 මෙහෙයුමට සුවිශේෂ අවධානයක් යොමු වීමට එය ප්‍රධාන හේතුවක්. මෙවැනි සඳ ගමනක් සිදු වූයේ වසර 54කට පසු පළමු වතාවට.

බොහෝ අභ්‍යවකාශ ගමන් සිදුවන්නේ පෘථිවියේ සිට කි.මී. 300-400ක් වැනි දුරකට පමණයි. එහෙත් සඳ වෙත යාමේදී කි.මී. ලක්ෂ 4කට ආසන්න දුරක් ගමන් කිරීමට සිදු වෙනවා. ආටෙමිස් 2 මෙහෙයුමට කලින් මිනිසුන් අවසන් වරට සඳ වෙත ගියේ 1972 දෙසැම්බර් මාසයේ. ඒ, ඇමරිකාවේ නාසා ආයතනය එකල ක්‍රියාත්මක කරමින් සිටි ඇපලෝ වැඩසටහන යටතේ. එම සඳ ගමන හැඳින්වුණේ ඇපලෝ 17 යනුවෙන්.

ඇපලෝ 17 සහ ආටෙමිස් 2 මෙහෙයුම් අතර වෙනසක් තිබෙනවා. ඇපලෝ 17 මෙහෙයුමේදී අජටාකාශගාමීන් දෙදෙනෙකු සඳ මත ගොඩ බැස්සා. ආටෙමිස් 2 මෙහෙයුමේදී අජටාකාශගාමීන් සඳ වටා ගමන් කළා විනා සඳ මත ගොඩ බැසීමක් සිදු වුණේ නැහැ. එසේ වුවත් ඇපලෝ 17න් වසර 54කට පසු සිදු වූ මේ සඳ ගමන අභ්‍යවකාශ ගවේෂණ ක්ෂේත්‍රයේ සිදු වූ ඉතා වැදගත් සුවිශේෂ සිදුවීමක්.

ආටෙමිස් 2 යනු නාසා ආයතනය ක්‍රියාත්මක කරමින් සිටින ආටෙමිස් වැඩසටහනේ දෙවැනි මෙහෙයුම. මෙයට කලින් ආටෙමිස් 1 මෙහෙයුම 2022 වසරේ දියත් කෙරුණා. එහිදීත් අභ්‍යවකාශ යානයක් සඳ ආසන්නයෙන් ගමන් කර පෘථිවිය කරා පැමිණියා. එහෙත් එම මෙහෙයුමට අජටාකාශගාමීන් කිසිවෙකු සහභාගි වුණේ නැහැ. එහිදී යානය ගමන් කළේ අජටාකාශගාමීන් රහිත ව.

දින 10ක ගමනක් වූ ආටෙමිස් 2 සඳ



ගමන ආරම්භ වූයේ ශ්‍රී ලංකාවේ වේලාවෙන් අප්‍රේල් 02 දින අලුයම 4.05ට පමණ. ඊට සහභාගි වූ අජටාකාශගාමීන් නැවත පෘථිවිය වෙත සේන්දු වුණේ අප්‍රේල් 11 දින.

ආටෙමිස් වැඩසටහන යටතේ 2028 වසරේ දියත් කිරීමට නියමිත ආටෙමිස් 4 මෙහෙයුමේදී අජටාකාශගාමීන් දෙදෙනෙකු සඳ මත ගොඩ බැසීමට නියමිත ව තිබෙනවා. එය ආටෙමිස් වැඩසටහනේ තවත් ඓතිහාසික මෙහෙයුමක් වනු ඇති.

ආටෙමිස් 1 සහ ආටෙමිස් 2 මෙහෙයුම්වල මෙන් ම ලබන වසරේ දියත් කිරීමට නියමිත ආටෙමිස් 3 මෙහෙයුමේ ද ප්‍රධාන අරමුණු වන්නේ මේ ආටෙමිස් වැඩසටහනේදී යොදා ගන්නා යානාවල සහ රොකට්ටුවල ක්‍රියාකාරිත්වය පරීක්ෂාවට ලක් කිරීම. මේ මෙහෙයුම්වලදී අජටාකාශගාමීන් ගමන් කරන යානා හැඳින්වෙන්නේ ඔරායන් යන නමින්. එම යානා අභ්‍යවකාශය කරා ගෙන යන රොකට්ටු හැඳින්වෙන්නේ Space Launch System යනුවෙන්. මිනිසුන් සඳ මත ගොඩ බසින ආටෙමිස් 4 මෙහෙයුම සාර්ථක කර ගැනීමේදී මේ පරීක්ෂා කිරීම්, අත්හදාබැලීම් බෙහෙවින් වැදගත්.

නොබෝදා දියත් කෙරුණු ආටෙමිස් 2 මෙහෙයුමේදීත් මෙවැනි පරීක්ෂා කිරීම් කිහිපයක් සිදු වුණා. Space Launch System රොකට්ටුවේ ක්‍රියාකාරිත්වය මෙන් ම ඔරායන් යානයට සම්බන්ධ

ජල සැපයුම්, ඔක්සිජන් සැපයුම් පද්ධතිවල සහ  උෂ්ණත්වය පාලනය කිරීමේ පද්ධතිවල ක්‍රියාකාරිත්ව ද මෙහිදී පරීක්ෂාවට ලක් කෙරුණා.

මේ ඓතිහාසික සඳ ගමනට සහභාගි වූ අජටාකාශගාමීන් සිව් දෙනා ගැනත් විශේෂයෙන් සඳහන් කළ යුතුයි. ඈත අභ්‍යවකාශය කරා යන මෙවැනි ගමන් බෙහෙවින් අනතුරුදායක බව අමුතුවෙන් කිව යුතු නැහැ. මෙබඳු ගමනකදී යම් අනතුරක් සිදු වුවහොත් අජටාකාශගාමීන්ගේ ජීවිත බේරා ගැනීම සඳහා ඇති හැකියාව ඉතා අවමයි. අනතුරුදායක සහ අභියෝගාත්මක මෙවැනි ගමනක නිරත වීම සඳහා සුවිශේෂ කායික මානසික ශක්තියක්, යෝග්‍යතාවක් තිබිය යුතු ම වෙනවා.

ආටෙමිස් 2 මෙහෙයුමට සහභාගි වූයේ රීඩ් වයිස්මාන්, ක්‍රිස්ටිනා කුක්, වික්ටර් ග්ලෝවර් සහ ජෙරමි හැන්සන් යන අජටාකාශගාමීන් සිව් දෙනා. ඔවුන් අතරින් රීඩ්, ක්‍රිස්ටිනා සහ වික්ටර් ඇමරිකාවේ නාසා ආයතනයට සම්බන්ධ අජටාකාශගාමීන්. කැනේඩියානු ජාතිකයකු වන ජෙරමි කැනඩා අභ්‍යවකාශ ඒජන්සියට සම්බන්ධ ව කටයුතු කරන්නෙක්.

ක්‍රිස්ටිනා, වික්ටර් සහ ජෙරමි යන තිදෙනා ම ආටෙමිස් 2 මෙහෙයුමෙන් ඉතිහාසගත වුණා. අභ්‍යවකාශ

> දින 10ක ගමනක් වූ ආටෙමිස් 2 සඳ ගමන ආරම්භ වූයේ ශ්‍රී ලංකාවේ වේලාවෙන් අප්‍රේල් 02 දින අලුයම 4.05ට පමණ. ඊට සහභාගි වූ අජටාකාශගාමීන් නැවත පෘථිවිය වෙත සේන්දු වුණේ අප්‍රේල් 11 දින. ආටෙමිස් වැඩසටහන යටතේ 2028 වසරේ දියත් කිරීමට නියමිත ආටෙමිස් 4 මෙහෙයුමේදී අජටාකාශගාමීන් දෙදෙනෙකු සඳ මත ගොඩ බැසීමට නියමිත ව තිබෙනවා. එය ආටෙමිස් වැඩසටහනේ තවත් ඓතිහාසික මෙහෙයුමක් වනු ඇති.

ගමන් ඉතිහාසයේ සඳ ආසන්නයට ගිය පළමු කාන්තාව ක්‍රිස්ටිනා. සඳ ආසන්නයට ගමන් කළ සුදු ජාතික නොවන පළමු අජටාකාශගාමියා ලෙස වික්ටර් ඉතිහාසයට එක්වෙනවා. ඔහු කළු ඇමරිකානු ජාතිකයෙක්. ජෙරමි ඉතිහාසයට එක් වන්නේ මෙවැනි සඳ චාරිකාවකට සහභාගි වූ ඇමරිකානු නොවන පළමු අභ්‍යවකාශගාමියා හැටියට. ක්‍රිස්ටිනා මෙයට පෙරත් අභ්‍යවකාශයේ වාර්තාවක් පිහිටුවා තිබෙනවා. ඒ, අඛණ්ඩ ව වැඩි ම කාලයක් අභ්‍යවකාශයේ ගත කළ කාන්තාව හැටියට. ඇය මේ වාර්තාව පිහිටුවූයේ දින 328ක කාලයක් ජාත්‍යන්තර අභ්‍යවකාශ මධ්‍යස්ථානයේ ගත කරමින්. ඒ, 2019 මාර්තු 14 දින සිට 2020 පෙබරවාරි 6 දින දක්වා. (ජාත්‍යන්තර අභ්‍යවකාශ මධ්‍යස්ථානය යනු පෘථිවියේ සිට කි.මී. 400ක් පමණ ඉහළින් අභ්‍යවකාශයේ රඳවා ඇති විද්‍යාගාරයක්.)

ආටෙමිස් 2 චාරිකාවේදී මේ අජටාකාශගාමීන්  දුර්ලභ අත්දැකීම් රැසක් ලබන්නට සමත් වුණා. පෘථිවියේ අපට කිසි විටෙක දකින්නට නොලැබෙන සඳෙහි අඳුරු අර්ධය නමින් හැඳින්වෙන කලාපයට ඉහළිනුත් ඔවුන් ගමන් කළා. අඳුරු අර්ධය, ඈත අර්ධය යන නම්වලින් හැඳින්වෙන මේ කලාපය නිතර ම පවතින්නේ පෘථිවියෙන් ඉවතට හැරී. එසේ වන්නේ සඳ තම අක්ෂය වටා භ්‍රමණය වන වේගය සහ පෘථිවිය වටා ගමන් කරන වේගය සමාන වීම නිසා.

අඳුරු අර්ධය නමින් හැඳින්වුණත් එය අඳුරින් වැසුණු කලාපයක් නොවෙයි. එම කලාපයටත් සාමාන්‍ය ආකාරයෙන් හිරුඑළිය ලැබෙනවා. අඳුරු අර්ධය යන නම ලැබී ඇත්තේ එය කිසි විටෙක පෘථිවියට නොපෙනෙන නිසා පමණයි. මේ අර්ධය පියවි ඇසින් දැක ගන්නට ලැබීම ඉතා දුර්ලභ අත්දැකීමක්.

මේ සඳ ගමනේදී අජටාකාශගාමීන්ට පසුකරන්නට සිදු වූ වඩාත් ම අනතුරුදායක අවස්ථාවක් වූයේ ඈත අභ්‍යවකාශයේ සිට පැමිණ නැවත පෘථිවියේ වායුගෝලයට ඇතුළුවීමේ අවස්ථාව. එම අවස්ථාව වනවිට ඔවුන්ගේ යානය ගමන් කරමින් තිබුණේ පැයට කි.මී. 38,000ක පමණ අධික වේගයකින්. මේ නිසා එය වායුගෝලය සමග ගැටීමේදී ඇතිවන ඝර්ෂණය හේතුවෙන් යානයේ පිටත ආරක්ෂක ආවරණය දැඩි රත් වීමකට බඳුන් වෙනවා. එය සෙන්ටිග්‍රේඩ් අංශක 2,700ක තරම් උෂ්ණත්වයකට ළඟා වූ බව සඳහන්. මෙහිදී ආරක්ෂක ආවරණයේ යම් දෝෂයක් තිබුණානම් ඉතා අවසනාවන්ත තත්ත්වයක් ඇති වී අජටාකාශගාමීන්ගේ ජීවිත පවා අහිමි වීමට ඉඩ තිබුණා.


එහෙත් ආටෙමිස් 2 මෙහෙයුමේදී එවැනි බිහිසුණු තත්ත්වයක් ඇති නොවූ අතර යානය ඉතා  නිරුපද්‍රිත ව පෘථිවිය වෙත ළඟා වුණා.



අජටාකාශගාමීන් යානය තුළදී

# ලොව සසැලේ රට නොසැලේ

ලෝක ඉතිහාසය පුරා ම යුද ගැටුම් නිරන්තරයෙන් සිදු වී ඇති බැවින් එය 'ලේ තැවරුණු ඉතිහාසයක්' ලෙස හැඳින්වීම ද වරදක් නැහැ. පළමු සහ දෙවැනි ලෝක යුද්ධ වැනි විශාල ගැටුම් ලෝකයේ දේශපාලන හා ආර්ථික පද්ධති සම්පූර්ණයෙන් ම වෙනස් කළ අතර සමාජ, ආගමික සහ ආර්ථික ක්ෂේත්‍රවල දීර්ඝකාලීන බලපෑම් ඇති කළා. දෙවැනි ලෝක යුද්ධයෙන් පසු යුරෝපීය රටවල් ආර්ථික වශයෙන් බිඳවැටුණත් 'මාෂල් සැලැස්ම' වැනි වැඩසටහන් ඔස්සේ නැවත ගොඩනැඟුණා. යුද්ධ හේතුවෙන් ඇතැම් ශිෂ්ටාචාර විනාශ වුණා. එවැනි විනාශ හේතුවෙන් නව ශිෂ්ටාචාර බිහිවීමට ද මඟ පෑදී තිබෙනවා. එබැවින් යුද්ධය විනාශකාරී වුවත් එය හේතු වී තිබෙනවා ඉතිහාසයේ විශාල පරිවර්තන සිදුකිරීමටත්. එහෙත් උසස් චින්තනයෙන් යුතු මිනිසාගේ ප්‍රධාන අරමුණ විය යුත්තේ යුද්ධයෙන් තොර, සාමකාමී සහ ස්ථායි මානව ශිෂ්ටාචාරයක් ගොඩනැගීමට අඛණ්ඩ ව උත්සාහ කිරීම. කෙසේ වෙතත් ඉරානයට එරෙහි ඇමරිකා-ඊශ්‍රායල් යුදමය වාතාවරණය ලෝක ආර්ථිකයට මෙන් ම ශ්‍රී ලංකා ආර්ථිකයට ද සිදු කර ඇති බලපෑම සුළුපටු නැහැ. ඒ අනුව එය කෙබඳු බලපෑමක් ද? මෙවැනි පසුබිමක අප ඒ සඳහා සූදානම් විය යුත්තේ කෙසේ ද? මේ පිළිබඳ විමසුමට ලක් කරමිනුයි මෙවර දෙසතිය කවරයේ කතාවේ කතාබහ සිදු වන්නේ.



මහාචාර්ය
**එස්. කේ. නාරද්ද ගමගේ**
ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

### ඉරාන-ඊශ්‍රායල යුද්ධයේ පසුබිම

භූගෝලීය, දේශපාලනික හා උපායමාර්ගික වශයෙන් ලෝකයේ ඉතා සුවිශේෂ ස්ථානයක මැදපෙරදිග කලාපය පිහිටා තිබෙනවා. වර්තමාන අර්බුදයේ බොහෝ මූල පිහිටා තිබෙන්නේ ඉතිහාසයේ ගැඹුරින්. 1979 වසරේ ඉරානයේ සිදු වූ ඉස්ලාමීය විප්ලවය එහි දේශපාලන දිශාව වෙනස් කළ ප්‍රධාන සිදුවීමක්. එම විප්ලවය හේතුවෙන් බටහිර හිතවාදී රාජ්‍ය පාලන ක්‍රමය අවසන් වී, ඉස්ලාමීය මූලධර්ම මත පදනම් වූ නව රාජ්‍ය පාලන ක්‍රමයක් ස්ථාපිත වුණා. ඒ හේතුවෙන් ඉරානය සහ බටහිර කඳවුර සමඟ ඇති සම්බන්ධතා හා ඊශ්‍රායලය වැනි රටවල් සමඟ ඇති දේශපාලන ගැටුම් තවදුරටත් උග්‍ර වීමයි සිදු වුණේ.

ඉරානය යනු මැදපෙරදිග කලාපයේ දෙවැනි විශාලතම රාජ්‍යය ලෙසයි සැලකෙන්නේ. ලෝක මට්ටමින් ගත් විට එය භූමි ප්‍රමාණය අනුව 18 වැනි ස්ථානය හිමි කර ගන්නා අතර ජනගහනය අනුව ද එය ලෝකයේ ජනාකීර්ණ රටවල් අතර ඉහළ ස්ථානයක පවතිනවා. මැදපෙරදිග කලාපයේ ෂියා ඉස්ලාම් රාජ්‍යයක් ලෙස ද ඉරානයට තිබෙන්නේ විශේෂ භූමිකාවක්. මේ දේශපාලන හා ආගමික වෙනස්කම් හේතුවෙන් ඉරානය සහ බටහිර බල කඳවුරු අතර දිගුකාලීන ආතති සහ ගැටුම්කාරී තත්ත්ව නිර්මාණය වී ඇති අතර ඒවා වර්තමාන මැදපෙරදිග අස්ථාවරතාවට ද බලපා තිබෙනවා. මෙවැනි භූ-දේශපාලනික වාතාවරණයක් යටතේ බටහිර රටවල දැඩි ආර්ථික සම්බාධක යටතේ පවතින ඉරානය, තම යුරේනියම් බලගැන්වීම් වැඩසටහන නොකඩවා ඉදිරියට ගෙන යාම බටහිර කඳවුර තුළ දැඩි නොසන්සුන්තාවක් ඇති කිරීමටයි හේතු වී ඇත්තේ. විශේෂයෙන් මැදපෙරදිග කලාපයේ පිහිටි මුස්ලිම් නොවන රාජ්‍යයක් වන ඊශ්‍රායලයේ ජාතික ආරක්ෂාවට මේ වැඩසටහන



සෘජු තර්ජනයක් ලෙස බටහිර ලෝකය සලකනවා. මේ සම්බන්ධයෙන් වරින් වර ජාත්‍යන්තර සාකච්ඡා සහ සම්මුති පැවැත්වුවත් දෙපාර්ශ්වය අතර තිරසර සහ ස්ථිර එකඟතාවකට පැමිණීමට මේ වන තෙක් හැකියාව ලැබී නැහැ.

ජාත්‍යන්තර හා ජාතික ආරක්ෂාව. ජාත්‍යන්තර ගුවන්, නාවික සහ භූ ප්‍රවාහන පද්ධතිවල ආරක්ෂාව පවත්වා ගැනීම ධනේශ්වර ආර්ථික ක්‍රමයේ ස්ථාවරතාව සඳහා අත්‍යවශ්‍ය කරුණක්. බටහිර සහ ආසියානු දියුණු රටවල් ජාතික ආරක්ෂාවට මෙන් ම ජාත්‍යන්තර නාවික ගමනාගමනයේ ආරක්ෂාව සඳහා විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරන්නේ ද ඒ නිසා. මේ ආරක්ෂාව තහවුරු නොකළහොත් ගෝලීය වෙළෙඳාම, සැපයුම් දාම සහ නිෂ්පාදන ක්‍රියාවලිය විශාල වශයෙන් බිඳවැටීමට ඉඩ තිබෙනවා. මෙවැනි පදනම් ගණනාවක් මත ගොඩනැඟී ඇති ලෝක ධනේශ්වර ආර්ථික ක්‍රමය තුළ වර්තමානයේ ඉරානයට එරෙහි ඇමරිකා-ඊශ්‍රායල් යුද්ධය සහ ඒ ආශ්‍රිත කලාපවල ඇති වී තිබෙන ගැටුම්කාරී තත්ත්ව මේ පදනම් සියල්ලට ම දැඩි බලපෑම් එල්ල කරමින් තිබෙනවා.

මේ පසුබිම යටතේ පසුගිය වසරේදී ඇමරිකාව සහ ඊශ්‍රායලය එක් ව ඉරානයට එරෙහි ව ක්‍රියාත්මක කළ දොළොස් දින යුද මෙහෙයුම් හේතුවෙන් දෙපාර්ශ්වයට ම සැලකිය යුතු හානි සිදු වුණා. මෑතකාලයේදී ඊශ්‍රායලය සහ ඇමෙරිකාව එක් ව ඉරානයට එරෙහි ව දියත් කළ යුදමය ක්‍රියාමාර්ග හේතුවෙන් ඉරානයේ දේශපාලන හා යුද නායකත්වය, ආර්ථික ක්‍රියාකාරකම්, යටිතල පහසුකම් සහ සාමාන්‍ය ජනතාව කෙරෙහි ද ඇති වුණේ දැඩි හානිකර බලපෑම්. ඉරානයේ ප්‍රතිප්‍රහාර හේතුවෙන් ඊශ්‍රායලය පමණක් නොව මැදපෙරදිග කලාපයේ බටහිර හිතවාදී රාජ්‍ය වන සෞදි අරාබිය, එක්සත් අරාබි එමිරේට්ස් වැනි රටවල ද ආර්ථික සහ ආරක්ෂක අස්ථාවරතාව වැඩි වී ඇති බව දක්නට පුළුවන්. මේ තත්ත්වය හේතුවෙන් විශේෂයෙන් ඛනිජ තෙල් නිෂ්පාදන කේන්ද්‍ර, තෙල් බෙදාහැරීමේ ජාල සහ ඒ ආශ්‍රිත යටිතල පහසුකම් දැඩි ලෙස හානි වී තිබෙනවා. ගුවන් තොටුපොළ සහ ප්‍රධාන ප්‍රවාහන මධ්‍යස්ථාන ද බාධාවට ලක් වී, කලාපීය ප්‍රවාහන හා වෙළෙඳ කටයුතු අඩාල වී තිබෙනවා. මෙවැනි තත්ත්ව අදාළ රටවලට පමණක් නොව සමස්ත මැදපෙරදිග කලාපයට මෙන් ම ගෝලීය ආර්ථිකයට ද එල්ල කරමින් තිබෙන්නේ දැඩි හා සෘජු බලපෑම්.

## ලෝක ආර්ථිකයට බලපෑම

වර්තමාන ලෝක ධනේශ්වර ආර්ථික ක්‍රමය ගොඩනැඟී පවතින්නේ මූලික උපකල්පන කිහිපයක් මත. එහි පළමු මූලික සන්දර්භය වන්නේ ලෝකයේ කිසිදු රටක් සම්පූර්ණයෙන් ස්වයංපෝෂිත ආර්ථිකයක් නොවී, එකිනෙකා මත යැපෙන ආර්ථික පද්ධති ලෙස ක්‍රියා කිරීම. ඒ අනුව රටක සාපේක්ෂ වාසි ඇති නිෂ්පාදන රටේ ම සිදුකරන අතර අනෙකුත් භාණ්ඩ හා සේවා විදේශයෙන් ආනයනය කරනවා. මේ ක්‍රමය ඔස්සේ නිදහස් වෙළෙඳාම වර්ධනය වී, ලෝකය පුරා සම්පත් කාර්යක්ෂම ලෙස බෙදා හැරීම සිදු වන අතර ඉහළ ජීවන මට්ටමක් ගොඩනැඟීමට දායක වීමේ ප්‍රතිඵලයක් ලෙස ලෝක මට්ටමින් නිර්මාණය වී ඇත්තේ සංකීර්ණ සැපයුම් දාම.

දෙවැනි මූලික මූලික සන්දර්භය වන්නේ ලෝක ආර්ථිකය ලාභදායී සහ විශ්වසනීය බලශක්ති සැපයුමක් මත පදනම් ව ක්‍රියා කිරීම. විශේෂයෙන් කර්මාන්ත නිෂ්පාදන, ප්‍රවාහන හා සේවා ක්ෂේත්‍ර සියල්ල ම බලශක්ති මත රඳා පවතිනවා. ලෝක බලශක්ති අවශ්‍යතාවෙන් විශාල කොටසක් ඛනිජ තෙල් සහ එයට ආශ්‍රිත නිෂ්පාදනවලින් සපයන අතර එහි ප්‍රධාන මූලාශ්‍රයක් වන්නේ මැදපෙරදිග කලාපය. මේ බලශක්ති සම්පත් වෙත නිදහස් ප්‍රවේශය ලැබීමෙන් චීනය, ඉන්දියාව සහ






බටහිර යුරෝපීය රටවල් වැනි ප්‍රධාන ආර්ථිකවල කර්මාන්ත ක්ෂේත්‍ර විශාල ලෙස වර්ධනය වී තිබෙනවා. ඒවායේ නිෂ්පාදිත භාණ්ඩ ලෝකය පුරා පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා සපුරාලන අතර තහවුරු කරන්නේ ගෝලීය ආර්ථික ක්‍රමයේ අඛණ්ඩ ක්‍රියාකාරිත්වය.

තෙවැනි මූලික සන්දර්භය වන්නේ ජාත්‍යන්තර හා ජාතික ආරක්ෂාව. ජාත්‍යන්තර ගුවන්, නාවික සහ භූ ප්‍රවාහන පද්ධතිවල ආරක්ෂාව පවත්වා ගැනීම ධනේශ්වර ආර්ථික ක්‍රමයේ ස්ථාවරතාව සඳහා අත්‍යවශ්‍ය කරුණක්. බටහිර සහ ආසියානු දියුණු රටවල් ජාතික ආරක්ෂාවට මෙන් ම ජාත්‍යන්තර නාවික ගමනාගමනයේ ආරක්ෂාව සඳහා විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරන්නේ ද ඒ නිසා. මේ ආරක්ෂාව තහවුරු නොකළහොත් ගෝලීය වෙළෙඳාම, සැපයුම් දාම සහ නිෂ්පාදන ක්‍රියාවලිය විශාල වශයෙන් බිඳවැටීමට ඉඩ තිබෙනවා. මෙවැනි පදනම් ගණනාවක් මත ගොඩනැඟී ඇති ලෝක ධනේශ්වර ආර්ථික ක්‍රමය තුළ වර්තමානයේ ඉරානයට එරෙහි ඇමරිකා-ඊශ්‍රායල් යුද්ධය සහ ඒ ආශ්‍රිත කලාපවල ඇති වී තිබෙන ගැටුම්කාරී තත්ත්ව මේ පදනම් සියල්ලට ම දැඩි බලපෑම් එල්ල කරමින් තිබෙනවා. එමගින් බලශක්ති සැපයුම, ජාත්‍යන්තර වෙළෙඳාම සහ ආරක්ෂාව යන මූලික කාරණා අස්ථාවර වී නිර්මාණය වී ඇත්තේ ලෝක ආර්ථිකයට සැලකිය යුතු අභියෝගයක්.

මැදපෙරදිග කලාපය ලෝක බලශක්ති සැපයුමේ ප්‍රධාන මූලාශ්‍රය බැවින් එහි ඇති වන ඕනෑ ම ගැටුම්කාරී තත්ත්වයක් ගෝලීය තෙල් සැපයුමට සෘජු බලපෑම් එල්ල කරනවා. මෙවැනි අස්ථාවරතා හේතුවෙන් තෙල් නිෂ්පාදනය හා ප්‍රවාහනය බාධා වීම, විශේෂයෙන් හෝමූස් සමුද්‍ර සන්ධිය වැනි ප්‍රධාන මුහුදු මාර්ග අවදානමට ලක්වීම නිසා සිදු වන්නේ ගෝලීය තෙල් මිල ඉහළ යාම. එහි ප්‍රතිඵලයක් ලෙස ඉන්ධන, ප්‍රවාහන හා නිෂ්පාදන වියදම් ඉහළ ගොස් ජීවන වියදම ද වැඩි වන අතර ඒ සමඟ ම ආයෝජන අඩුවීම, ගෝලීය ආර්ථික වර්ධනය වර්ධනය මන්දගාමී වීම සහ සැපයුම් දාම බිඳවැටීම් ද සිදු වෙනවා. එහි ප්‍රතිවිපාක විහිදී පවතින්නේ ලෝකයේ සියලු ආර්ථික වෙත. ඉන්දියාව ගත් විට එරට ශ්‍රමිකයන්ගෙන්





විශාල සංඛ්‍යාවක් මැදපෙරදිග රටවල සේවය කරන නිසා ඔවුන්ගෙන් ලැබෙන විදේශ ප්‍රේෂණ ඉන්දියානු ආර්ථිකයට වැදගත් ආදායම් මූලාශ්‍රයක්. එහෙත් මේ ගැටුම් හේතුවෙන් එම ආදායම් අඩුවීමේ අවදානමක් මතුවෙමින් පවතිනවා. එය ඉන්දියානු ජනතාවගේ ජීවන තත්ත්වයට හා ආර්ථික ස්ථාවරතාවට ඇති කර තිබෙන්නේ අහිතකර බලපෑම්.

ලෝකයේ උසස් තාක්ෂණික නිෂ්පාදන විශේෂයෙන් අර්ධසන්නායක (semiconductors) නිෂ්පාදනයේ ප්‍රධාන භූමිකාවක් ඉටු කරන තායිවානය ද මේ තත්ත්වයෙන් බලපෑමට ලක් වී තිබෙනවා. තායිවානයට අවශ්‍ය බලශක්තියෙන් විශාල කොටසක් මැදපෙරදිග කලාපයෙන් ආනයනය කරන බැවින් හෝමුස් සමුද්‍ර සන්ධිය වැනි මාර්ගවල ඇති වන අවදානම් හේතුවෙන් බලශක්ති සැපයුම අස්ථාවර වීම නිෂ්පාදන ක්‍රියාවලියට බාධා කරනවා. එමඟින් ලෝක වෙළෙඳපොළේ තාක්ෂණික උපකරණ මිල ඉහළ යාමත් සැපයුම අඩුවීමත් නිසා සමස්ත ලෝක ආර්ථිකයට ඇති කරන්නේ විශාල බලපෑමක්. ඉන්ධන මිල ඉහළ යාම හේතුවෙන් ප්‍රවාහන වියදම් වැඩිවීමෙන් ආහාර මිල ගණන් ලෝකය පුරා ඉහළ යමින් පවතිනවා. විශේෂයෙන් අප්‍රිකානු සහ ආසියානු රටවල ආහාර මිල වේගයෙන් ඉහළ යාම හේතුවෙන් ආහාර සුරක්ෂිතතාව සම්බන්ධයෙන් මතුවෙමින් තිබෙන්නේ ප්‍රබල ගැටලු. මැදපෙරදිග කලාපය ජාත්‍යන්තර ගුවන් සහ නාවික ප්‍රවාහනයේ කේන්ද්‍රස්ථානයක් වන බැවින් පවතින යුද්ධමය තත්ත්වය හේතුවෙන් දක්නට ලැබෙන්නේ ගුවන් ගමන් අවලංගු වීම, ප්‍රවාහන වියදම් ඉහළ යාම සහ ගුවන් ටිකට් මිල ඉහළ යාම වැනි ප්‍රතිවිපාක. මෙය ලෝක සංචාරක කර්මාන්තයට දැඩි බලපෑමක් එල්ල කරන අතර විශේෂයෙන් යුරෝපයෙන් ආසියානු කලාපයට පැමිණෙන සංචාරක ප්‍රවාහය අඩුවීමට ද හේතු වී තිබෙනවා.

ලෝක භාණ්ඩ හා සේවා නිෂ්පාදනයට සුවිශේෂ දායකත්වයක් සපයන චීන ආර්ථිකය ද මැදපෙරදිග කලාපයේ පවතින ගැටුම්වලින් දැඩි ලෙස බලපෑමට ලක්වෙමින් පවතින්නක්. චීනයට අවශ්‍ය බලශක්තිවල සැලකිය යුතු කොටසක් විශේෂයෙන් ඛනිජ තෙල් මැදපෙරදිග රටවලින් ආනයනය කරන බැවින් එම සැපයුමට ඇති වන බාධා කර්මාන්ත ක්ෂේත්‍රය හා ගෝලීය සැපයුම් දාම ක්‍රියාවලියට ඇති කරන්නේ සෘජු බලපෑම්. ලාභදායී බලශක්තිය මත පදනම් ව ගොඩනැඟී ඇති කර්මාන්ත රැසක් සඳහා පිරිවැය ඉහළ යාමෙන් නිෂ්පාදන ක්‍රියාකාරිත්වය මන්දගාමී වීම හෝ කර්මාන්ත වසා දැමීමේ හෝ අවදානමක් ද මතුවෙමින් තිබෙනවා. මෙය චීන ආර්ථික මොඩලයට ද සැලකිය යුතු අභියෝගයක් ලෙසයි පෙනී යන්නේ. චීන ආර්ථිකයට සිදුවන මේ බලපෑම ලෝක ආර්ථික වර්ධනයට සෘජු හා අනිවාර්ය බලපෑමක් ඇති කරනවා.



> රටේ විදේශ විනිමය තත්ත්වය නිසි ලෙස කළමනාකරණය කිරීම ද ප්‍රමුඛ අවශ්‍යතාවක්. විදේශ ණය ආපසු ගෙවීමේ හැකියාව ශක්තිමත් කර ගැනීම සඳහා විදේශ සංචිත වර්ධනය කර ගත යුතුයි. ඒ සඳහා අපනයන ආදායම් වැඩි කිරීම, සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය සහ විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම වැනි ක්‍රියාමාර්ග දීර්ඝකාලීන ව ක්‍රියාත්මක කළ යුතු වෙනවා. පවතින විදේශ විනිමය සම්පත් වඩාත් කාර්යක්ෂම ව භාවිත කිරීම සහ ප්‍රමුඛ ආර්ථික අවශ්‍යතා සඳහා පමණක් ඒවා වෙන් කිරීම ද කෙටිකාලීන ව වැදගත්.

මේ යුද්ධමය වාතාවරණය ලෝක ආර්ථිකයේ ඩිජිටල් යටිතල පහසුකම්වලට ද ඇති කරන්නේ දැඩි බලපෑම්. විශේෂයෙන් ජාත්‍යන්තර දත්ත මධ්‍යස්ථාන ක්‍රියාත්මක කිරීම සඳහා විශාල බලශක්ති ප්‍රමාණයක් අවශ්‍ය වන බැවින් බලශක්ති මිල ඉහළ යාම හේතුවෙන් ඒවා පවත්වාගෙන යෑමේ පිරිවැය සැලකිය යුතු ලෙස වැඩි වෙනවා. එහි ප්‍රතිඵලයක් ලෙස ඩිජිටල් සේවා, ව්‍යාපාර සහ ගෝලීය ආර්ථික ක්‍රියාකාරකම්වල කාර්යක්ෂමතාවට ද එල්ල කරන්නේ අහිතකර බලපෑම්.

## ශ්‍රී ලංකා ආර්ථිකයට බලපෑම

මැදපෙරදිග කලාපයේ වර්ධනය වී ඇති යුද්ධමය වාතාවරණය ශ්‍රී ලංකා ආර්ථිකයට ද දැඩි හා සෘජු බලපෑම් එල්ල කරමින් පවතිනවා. විශේෂයෙන් ඉතිහාසයේ දැක ඇති බරපතළ ම ආර්ථික අර්බුදයෙන් පසු යම් ප්‍රකෘතිමත් වීමක් සිදුවෙමින් පවතින අවස්ථාවක, මේ බාහිර කම්පන තත්ත්වය නැවතත් ආර්ථික ස්ථාවරතාවට කර ඇත්තේ අභියෝගයක්.

ප්‍රධාන වශයෙන් ඉන්ධන සහ බලශක්ති මිල ඉහළ යාම ශ්‍රී ලංකා ආර්ථිකයට සෘජු බලපෑමක් එල්ල කර තිබෙනවා. ජාත්‍යන්තර වෙළෙඳපොළේ තෙල් මිල වේගයෙන් ඉහළ යාම හේතුවෙන් දේශීය වෙළෙඳපොළේ ඉන්ධන මිල ද ඉහළ යාම වැළැක්විය නොහැකියි. එය ප්‍රවාහන,

නිෂ්පාදන හා සේවා ක්ෂේත්‍රවලට දැඩි බලපෑම් ඇති කර තිබෙන අතර සැපයුම් අර්බුද සහ විදේශ ආනයන වියදම් ඉහළ යාම හේතුවෙන් ඉන්ධන සහ අත්‍යවශ්‍ය භාණ්ඩ ලබා ගැනීමේ අපහසුතා ද මතුවෙමින් තිබෙනවා. මෙවැනි පසුබිමක එය පාලනය කිරීම සඳහා රජයට කෙටිකාලීන ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග කිහිපයක් ගැනීමටයි සිදු වුණේ. ප්‍රවාහන වියදම් ඉහළ යාම හේතුවෙන් බස් ගාස්තු, ටැක්සි ගාස්තු සහ භාණ්ඩ ප්‍රවාහන වියදම් ඉහළ ගියා. එය භාණ්ඩ හා සේවා මිල ගණන් ඉහළ යාමට සෘජු ව ම බලපෑ අතර එහි ප්‍රතිඵලයක් ලෙස දේශීය ආර්ථිකය උද්ධමන පීඩනයකට ලක්වීම නොවැළැක්විය හැකි තත්ත්වයක් බවට පත්වෙමින් තිබෙනවා.

විදේශ විනිමය මත ඇති වන අහිතකර පීඩනයත් ප්‍රබල බලපෑමක්. ශ්‍රී ලංකාවේ ඉන්ධන සහ ගෘහස්ථ ගෑස් වැනි අත්‍යවශ්‍ය බලශක්ති සම්පත් විශාල වශයෙන් ආනයනය මත රඳා පවතින බැවින් ජාත්‍යන්තර වෙළෙඳපොළේ ඒවායේ මිල ඉහළ යාම රටේ විදේශ විනිමය වියදම් සැලකිය යුතු ලෙස වැඩි කරනවා. විශේෂයෙන් ගල්ෆ් කලාපයේ යුද්ධමය තත්ත්වය හේතුවෙන් ලෝක වෙළෙඳපොළේ තෙල් මිල ඉහළ යාමත් සමඟ ශ්‍රී ලංකාවට බනිජ තෙල් ආනයනය සඳහා විශාල ඩොලර් ප්‍රමාණයක් වැය කිරීමට සිදු වුණා. ජාත්‍යන්තර වාර්තා අනුව ද ලෝක තෙල් මිල සමඟ සැසඳීමේදී ශ්‍රී ලංකාවට සිදු වුණේ ඉන්ධන ඉතා ඉහළ මිලකට ආනයනය කිරීමට. මේ තත්ත්වය හේතුවෙන් විදේශ විනිමය හිඟය ක්‍රමයෙන් වර්ධනය විය හැකි අතර එය විදේශ විනිමය සංචිත පහත වැටීමටත් විනිමය අනුපාතය දුර්වල වීමටත් බලපාන්නේ සෘජු ව ම. එබැවින් මේ බාහිර කම්පනය ශ්‍රී ලංකා ආර්ථිකයේ මූල්‍ය ස්ථාවරතාවට සැලකිය යුතු අභියෝගයක් ලෙස පෙනී යනවා.



මැදපෙරදිග කලාපයේ සේවය කරන ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගේ රැකියා සහ විදේශ ප්‍රේෂණ මත ඇතිවන අහිතකර බලපෑමත් සැලකිය ප්‍රබල වූවක්. මේ වන විට ලක්ෂ සංඛ්‍යාත ශ්‍රී ලාංකිකයන් මැදපෙරදිග රටවල රැකියා කරමින් සිටිනවා. ඔවුන් වාර්ෂික ව රටට ලබා දෙන්නේ ඩොලර් බිලියන 08කට ආසන්න විදේශ ප්‍රේෂණ ප්‍රමාණයක්. මේ ප්‍රේෂණ ආර්ථිකයේ විදේශ විනිමය ආදායමට සපයන දායකත්වය ඉතා වැදගත්. එහෙත් වර්තමාන ගැටුම්කාරී තත්ත්වය හේතුවෙන් මැදපෙරදිග රටවල ශ්‍රමික රැකියා අවස්ථා සම්බන්ධයෙන් අවිනිශ්චිතතාව ඉහළ ගොස් ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස ඇතැම් ශ්‍රමිකයන් නැවත රටට පැමිණීම ද වාර්තා වෙමින් තිබෙනවා. මෙය විදේශ ප්‍රේෂණ ප්‍රවාහයට සෘජු බලපෑමක් ඇති කරමින් ශ්‍රී ලංකාවේ විදේශ විනිමය ආදායම අඩුවීමට හේතු විය හැකියි. පසුගිය ආර්ථික අර්බුද සමයේදී විදේශ ශ්‍රමික ප්‍රේෂණ ශ්‍රී ලංකා ආර්ථිකය ස්ථාවර කිරීමට සුවිශේෂ කාර්යභාරයක් ඉටු කළා. යුද්ධමය වාතාවරණය හමුවේ ඇති වී තිබෙන අනෙකුත් ප්‍රධාන බලපෑම් අතර ආර්ථික ස්ථාවරතාව සහ ආයෝජන ක්ෂේත්‍රයට ඇති වන බලපෑම ද සුවිශේෂයි. විශේෂයෙන් ගෝලීය ආයෝජකයන් අවදානම් ඉහළ කලාපවල ආයෝජන කිරීමට අකමැති වීම හේතුවෙන්, යුද්ධමය කලාප ආශ්‍රිත රටවලට යොමු වන සෘජු විදේශ ආයෝජන ප්‍රමාණය සැලකිය යුතු ලෙස අඩුවීම සිදු වන්නක්. ශ්‍රී ලංකාව ජාත්‍යන්තර නාවික ගමනාගමනයේ උපායමාර්ගික ස්ථානයක පිහිටා තිබීම හේතුවෙන්, ඉන්දියානු සාගර කලාපයේ ඇතිවන ඕනෑ ම ආරක්ෂක අවදානමක් රටේ ආයෝජන පරිසරයට සෘජු බලපෑම් එල්ල කරනවා. වර්තමාන ගැටුම් තත්ත්වය හේතුවෙන් මේ කලාපයේ අවිනිශ්චිතතාව වැඩිවීම ඉඩ සලසන්නේ ශ්‍රී ලංකාවේ අපේක්ෂිත හා සැලසුම් කර ඇති ආයෝජන ප්‍රවාහය අඩපණ වීමට හෝ ප්‍රමාද වීමට. විශේෂයෙන් පසුගිය කාලයේ වාර්තා වූ ඉරාන නෞකාවලට එල්ල වූ ප්‍රහාර වැනි සිදුවීම් ගෝලීය නාවික ආරක්ෂාව පිළිබඳ අවදානම තවදුරටත් වැඩි කර ඇති අතර එය ආයෝජක විශ්වාසය ද අඩු කිරීමට හේතු වන්නට පුළුවන්. එබැවින් සෘජු විදේශ ආයෝජන පහළ යාම සහ ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී වීම වැනි ප්‍රවණතා නොවැළැක්විය හැකි තත්ත්වයක් ලෙසයි පෙනී යන්නේ.

එමෙන් ම ගෝලීය ආර්ථික අවිනිශ්චිතතාව හේතුවෙන් සංචාරක කර්මාන්තය සහ අපනයන වෙළෙඳාම ද මන්දගාමී විය හැකියි. එය රටේ සමස්ත ආර්ථික වර්ධනයට අභියෝගයක් ලෙස පවතිනවා. ශ්‍රී ලංකාවේ විදේශ විනිමය ආදායම් අතර සංචාරක ඉපයුම් ගන්නේ ප්‍රමුඛ ස්ථානයක්. ආර්ථික ස්ථාවරතාව සහ සංවර්ධනය සඳහා එය වැදගත්. එහෙත් වර්තමාන තත්ත්වය හේතුවෙන් සංචාරක කර්මාන්තයට දැඩි බලපෑමක් ඇතිවෙමින් තිබෙනවා. විශේෂයෙන් යුරෝපීය සංචාරකයන්ගේ ප්‍රධාන ගමන් මාර්ග වන මැදපෙරදිග ගුවන් මධ්‍යස්ථානවල ඇතිවන අස්ථාවරතාව, ගුවන් ගමන් අවලංගු කිරීම් සහ ප්‍රමාද හේතුවෙන් ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරක ප්‍රවාහය මන්දගාමී වී තිබෙනවා. මෙය ශ්‍රී ලංකා ආර්ථිකයට සෘජු අහිතකර බලපෑමක් එල්ල කරමින්, අපේක්ෂිත සංචාරක ඉපයුම් සහ ආර්ථික ඉලක්ක සපුරා ගැනීම ද අභියෝගාත්මක කාරණයක් බවටයි පත් කර තිබෙන්නේ.

ඉතිහාසයේ වාර්තා වූ දැඩි ආර්ථික අර්බුදයකට මුහුණදෙමින් සිටි ශ්‍රී ලංකා ආර්ථිකය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ඇති කරගත් විස්තීර්ණ ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමෙන් යම් ප්‍රමාණයක ආර්ථික ස්ථාවරතාවක් ලබාගනිමින් යථා තත්ත්වයට පත්වෙමින් සිටියා. එහෙත් වර්තමාන ගෝලීය ආර්ථික අවිනිශ්චිතතාව නැවතත් අභියෝගයක් ලෙස මතුවෙමින් තිබෙනවා. විශේෂයෙන් 2028 වසරේදී ආරම්භ වීමට නියමිත විදේශ ණය වාරික ගෙවීම සඳහා සූදානම් විය යුතු අවස්ථාවක, මේ බාහිර ආර්ථික කම්පන ශ්‍රී ලංකා ආර්ථිකයට දැඩි පීඩනයක් එල්ල කරනු ඇති. එහි ප්‍රතිඵලයක් ලෙස අපේක්ෂිත

ආර්ථික වර්ධන වේගය පහළ යාමක් සිදුවිය හැකියි. රටේ මූල්‍ය ස්ථාවරතාව ද අභියෝගයට ලක්විය හැකියි. ඒ අනුව මේ ආර්ථික පීඩනය අවම කර ගැනීම සඳහා කඩිනම් හා සාර්ථක ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගැනීම අත්‍යවශ්‍ය වෙනවා.

ඇති වී තිබෙන මේ බලපෑම් අවම කර ගැනීම සඳහා කෙටිකාලීන ව ප්‍රධාන අවධානය යොමු විය යුත්තේ ඉන්ධන මිල ස්ථාවරතාව සහ ඉන්ධන සැපයුම් කළමනාකරණය කෙරෙහි. ජාත්‍යන්තර තෙල් මිල ඉහළ යාම හමුවේ දේශීය වෙළෙඳපොළේ ඉන්ධන මිල ස්ථාවර කිරීම සඳහා සැලසුම්ගත මිල නියාමන ක්‍රමයක් ක්‍රියාත්මක කළ යුතුයි. සීමිත ඉන්ධන තොග කාර්යක්ෂම ලෙස බෙදා හැරීම සඳහා ශක්තිමත් යාන්ත්‍රණයක් අවශ්‍ය වෙනවා. විශේෂයෙන් කෘෂිකර්මය, සෞඛ්‍ය, අධ්‍යාපන, ප්‍රවාහන, සංචාරක සහ අපනයන සහ කර්මාන්ත සඳහා ප්‍රමුඛතාව ලබාදෙමින් ඉන්ධන සැපයුම සහතික කළ යුතුයි. මෙය ආර්ථිකයේ අඛණ්ඩ ක්‍රියාකාරිත්වය පවත්වා ගැනීමටයි උපකාරී වන්නේ.

පසුගිය කාලයේ ඇති වූ ආර්ථික අර්බුදය සහ 'දිට්වා' වැනි ස්වාභාවික කුණාටු තත්ත්ව හේතුවෙන් බලපෑමට ලක් වූ සමාජ කණ්ඩායම් ආරක්ෂා කිරීම සඳහා ශක්තිමත් සමාජ ආරක්ෂණ ජාලයක් පවත්වාගෙන යාම අත්‍යවශ්‍යයි. විශේෂයෙන් අඩු ආදායම්ලාභී පවුල්, රැකියා අහිමි වූ පිරිස් සහ ස්වාභාවික ආපදා හේතුවෙන් පීඩාවට පත් වූ ජනතාව ඉලක්ක කරගනිමින් ඔවුන්ට සෘජු ව ප්‍රතිලාභ ලැබෙන ආකාරයට සහන වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු වෙනවා. රටේ විදේශ විනිමය තත්ත්වය නිසි ලෙස කළමනාකරණය කිරීම ද ප්‍රමුඛ අවශ්‍යතාවක්. විදේශ ණය ආපසු ගෙවීමේ හැකියාව ශක්තිමත් කර ගැනීම සඳහා විදේශ සංචිත වර්ධනය කර ගත යුතුයි. ඒ සඳහා අපනයන ආදායම් වැඩි කිරීම, සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය සහ විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම වැනි ක්‍රියාමාර්ග දීර්ඝකාලීන ව ක්‍රියාත්මක කළ යුතු වෙනවා. පවතින විදේශ විනිමය සම්පත් වඩාත් කාර්යක්ෂම ව භාවිත කිරීම සහ ප්‍රමුඛ ආර්ථික අවශ්‍යතා සඳහා පමණක් ඒවා වෙන් කිරීම ද කෙටිකාලීන ව වැදගත්. එයින් ආර්ථික ස්ථාවරතාව තහවුරු කර ගැනීමට හැකි වන අතර අනාගතයේ ඇතිවිය හැකි බාහිර කම්පනවලට මුහුණදීම සඳහා ශක්තිමත් පදනමක් ගොඩනැගීමට ද හැකි වනු ඇති. ඒ අනුව කෙටිකාලීන හා දිගුකාලීන ලෙස ආර්ථිකයට ඇතිවන බලපෑම් අඩු කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග කඩිනමින් ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වෙනවා. නුදුරු අනාගතයේදී ඇතිවිය හැකි මෙවැනි බාහිර කම්පනවලට මුහුණ දිය හැකි ලෙස ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා ආර්ථික විවිධාංගීකරණය, බලශක්ති ආරක්ෂාව සහ විදේශ විනිමය කළමනාකරණය වැනි ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු අතර මෙවැනි පියවර ඔස්සේ ශ්‍රී ලංකා ආර්ථිකයේ ස්ථාවරතාව සහ තිරසාරත්වය තහවුරු කරගත හැකි වනු ඇති.

ඇති වී තිබෙන මේ බලපෑම් අවම කර ගැනීම සඳහා කෙටිකාලීන ව ප්‍රධාන අවධානය යොමු විය යුත්තේ ඉන්ධන මිල ස්ථාවරතාව සහ ඉන්ධන සැපයුම් කළමනාකරණය කෙරෙහි. ජාත්‍යන්තර තෙල් මිල ඉහළ යාම හමුවේ දේශීය වෙළෙඳපොළේ ඉන්ධන මිල ස්ථාවර කිරීම සඳහා සැලසුම්ගත මිල නියාමන ක්‍රමයක් ක්‍රියාත්මක කළ යුතුයි. සීමිත ඉන්ධන තොග කාර්යක්ෂම ලෙස බෙදා හැරීම සඳහා ශක්තිමත් යාන්ත්‍රණයක් අවශ්‍ය වෙනවා. විශේෂයෙන් කෘෂිකර්මය, සෞඛ්‍ය, අධ්‍යාපන, ප්‍රවාහන, සංචාරක සහ අපනයන සහ කර්මාන්ත සඳහා ප්‍රමුඛතාව ලබාදෙමින් ඉන්ධන සැපයුම සහතික කළ යුතුයි. මෙය ආර්ථිකයේ අඛණ්ඩ ක්‍රියාකාරිත්වය පවත්වා ගැනීමටයි උපකාරී වන්නේ.

## රටේ ශක්තිය

ඉතිහාසයේ ගැඹුරු ම ආර්ථික අර්බුදයෙන් අනතුරුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය වැඩසටහන යටතේ එකඟ වූ ආර්ථික ප්‍රතිසංස්කරණ සාර්ථක ව ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් ලෙස 2025 වර්ෂයේදී ආර්ථිකයට උසස් කාර්ය සාධනයක් වාර්තා කිරීමට හැකි වී තිබෙනවා. එමගින් බොහෝ මූලික සර්ව ආර්ථික විචල්‍ය යථාවත් වීම දක්නට පුළුවන්. විශේෂයෙන් 2025 වසරේ අගභාගයේදී ඇති වූ දිට්වා සුළි කුණාටුව වැනි ස්වාභාවික විපත් මධ්‍යයේ වුවත් ශ්‍රී ලංකා ආර්ථිකය අඛණ්ඩ ව වර්ධනයක් අත්පත් කර ගැනීමට සමත් ව තිබීම සැලකිය යුතු තත්ත්වයක්. ඒ අනුව ආර්ථිකය 5%කින් වර්ධනය වී ඇති අතර ඒක පුද්ගල ආදායම ඩොලර් 5000 දක්වා ඉහළ ගොස් තිබෙනවා. උද්ධමනය 2.1%ක් ලෙස පාලනය කිරීමට මහ බැංකු ප්‍රතිපත්ති සමත් වී තිබීම යහපත් තත්ත්වයක්. එම වසරේ සංචාරක පැමිණීම් මිලියන 2.36 දක්වා ඉහළ ගොස් ඇති අතර එමගින් ඩොලර් බිලියන 03 ඉක්මවූ විදේශ විනිමය ආදායමක් උපයා



ගැනීමට ද හැකි වී තිබෙනවා. වාර්තාගත ලෙස විදේශ ශ්‍රමිකයන්ගෙන් ලැබෙන ප්‍රේෂණ ඉහළ ගොස් ඇත්තේ ඩොලර් බිලියන 8.1 දක්වා. රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 16.7% දක්වා ඉහළ ගොස් ඇති අතර අය වැය හිඟය අඩු වී රාජ්‍ය ණය 91.6% දක්වා පහළ බැස තිබෙනවා. එසේ ම බැංකු පද්ධතියේ මූල්‍ය ස්ථාවරත්වය ද තවදුරටත් ශක්තිමත් වී ඇති නිසා සමස්තයක් ලෙස 2025 වර්ෂය සැලකිය හැක්කේ ශ්‍රී ලංකා ආර්ථිකය ස්ථායීකරණයක් සහ ඉහළ කාර්ය සාධනයක් වාර්තා කළ වසරක් ලෙස.

එබැවින් 2026 වර්ෂයේදී ජාත්‍යන්තර අභියෝග මධ්‍යයේ වුවත් ශ්‍රී ලංකාවට ආර්ථික ස්ථායීභාවය පවත්වාගෙන යාමේ හැකියාවක් පවතින බව පැහැදිලි වෙනවා. මේ ස්ථායීභාව තවදුරටත් තහවුරු කර ගැනීම සඳහා 2025 වර්ෂය පුරා ක්‍රියාත්මක කළ ආර්ථික ප්‍රතිසංස්කරණ අඛණ්ඩ ව ක්‍රියාත්මක කිරීම රජයේ මූලික වගකීමක්. විශේෂයෙන් ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක සහනාධාර වැඩසටහන් නැවත සමාලෝචනය කරමින් ඉලක්කගත කණ්ඩායම් නිවැරදි ව හඳුනා ගනිමින් සමාජ ආරක්ෂණ ජාලය ගුණාත්මකව ශක්තිමත් කිරීම, රාජ්‍ය ආයතන ප්‍රතිසංස්කරණය, බදු පදනම පුළුල් කිරීම, වංචා හා දූෂණ අවම කිරීම, රජයේ වියදම් කාර්යක්ෂමව කළමනාකරණය කිරීම, රාජ්‍ය හා පුද්ගලික ආයෝජන ප්‍රවර්ධනය කිරීම, ඍජු විදේශ ආයෝජන ආකර්ෂණය කිරීමේ ක්‍රියාමාර්ග හඳුන්වාදීම, රාජ්‍ය සේවයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම, අපනයන විවිධාංගිකරණය මෙන් ම දැනටමත් යෝජනා වී ඇති ජපානය වැනි රටවල් සමඟ වන නිදහස් වෙළෙඳ ගිවිසුම් සඳහා කඩිනමින් යොමුවීම යනාදිය ප්‍රමාද නොකොට ක්‍රියාත්මක විම අත්‍යවශ්‍ය වෙනවා. මේ ක්‍රියාමාර්ග ඔස්සේ මැපෙරදිග කලාපය ආශ්‍රිත ව ඇති ව තිබෙන අර්බුදයට සාර්ථක ව මුහුණදීමට සහ ඒවා කළමනාකරණයට ඇති හැකියාව තවදුරටත් වර්ධනය කරගැනීමට ශ්‍රී ලංකාවට හැකියාව තිබෙනවා. එවිට අනාගතයේදී ද මෙවැනි බාහිර කම්පනවලට සාර්ථක ව මුහුණ දිය හැකි තිරසර ආර්ථිකයක් ගොඩනගා ගැනීමට ප්‍රබල අවස්ථාවක් රටේ පවතින බව සඳහන් කළ යුතුයි.



# ගෝලීය බලපෑම්කාරී තත්ත්වයක්

ආචාර්ය
**ඩබ්ලිව්. ඒ. විජේවර්ධන**
හිටපු මහ බැංකු නියෝජ්‍ය අධිපති

ඇමරිකා එක්සත් ජනපදය-ඊශ්‍රායලය එක් පසෙකත් ඉරානය අනෙක් පසෙකත් සිට කරන මේ යුද්ධය, හුදෙක් මැදපෙරදිග කලාපයට පමණක් නොවෙයි සමස්ත ලෝක ආර්ථිකයට ම බලපාන කාරණයක් වී අවසන්.

සෑම ආර්ථිකයක ම ක්‍රියාත්මක වන ප්‍රධානතම යෙදවුම වශයෙන් පිළිගැනෙන බලශක්තිය (ඉන්ධන) ප්‍රධාන වශයෙන් ලැබෙන්නේ මැදපෙරදිගින්. පවතින යුදමය වාතාවරණය සමඟ මේ බලශක්තිය ලැබෙන ප්‍රමාණය අඩු වී බලශක්ති මිල ගණන් ඉහළ ගොස් තිබෙනවා. ඒ නිසා සෑම ආර්ථිකයකට ම සිදු වී තිබෙනවා මේ තත්ත්වය සමඟ අභ්‍යන්තර ව තමන්ගේ ආර්ථිකයේ විවිධ ගැලපීම් සිදු කරන්න. එහිදී විශේෂයෙන් උද්ධමනය ඉහළ යාම, නිෂ්පාදන වියදම වැඩි වීම, නිෂ්පාදන වියදම වැඩි වීමෙන් භාණ්ඩ අලෙවි කිරීමට තිබෙන හැකියාව අඩු වීම, නිෂ්පාදන හැකියාව අඩු වීම නිසා අපනයන අඩු වීම සිදු වුණා. මෙය ශ්‍රී ලංකා ආර්ථිකයේ විදේශ සංචිතවලට මෙන් ම අමුද්‍රව්‍ය මිල ගණන්වල සිට ගෘහ ආර්ථික ක්‍රියාකාරකම් දක්වා බලපෑම් කිරීමට හැකි තත්ත්වයක්.





ලෝක මුදල් ක්‍රමයටත් මේ තත්ත්වය බලපා තිබෙනවා. එම බලපෑම හඳුනා ගැනීම සඳහා ලෝක මූල්‍ය ඉතිහාසය පිළිබඳ විමසා බැලීම වැදගත්. 1945 වසරේදී දෙවැනි ලෝක සංග්‍රාමයෙන් ජයග්‍රහණය කළ රටවල් ලෝක බැංකුවත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් ගොඩනැගීමේදී විශේෂයෙන් ජාත්‍යන්තර වෙළෙඳාම බාධාවකින් තොර ව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සංචිත ව්‍යවහාර මුදලක අවශ්‍යතාව ඇති වුණා. එතෙක් එම කාර්යය ඉටු කළේ මහා බ්‍රිතාන්‍යයේ රන් පවුම්. මහා බ්‍රිතාන්‍යයට තවදුරටත් එම කටයුත්ත කරගෙන යෑමට නොහැකි වීම නිසා ඇමරිකා එක්සත් ජනපදය ඒ වෙනුවෙන් ඉදිරිපත් වුණා. මෙහිදී ඇමරිකා එක්සත් ජනපදය නිල වශයෙන් වගකීම භාර ගත්තා ලෝකයේ මහ බැංකුවල රාජකාරි ඉටු කිරීමට. ලෝක ද්‍රවශීලතාව ඇති කිරීම සඳහා විදේශ විනිමය සංචිත මුදලක් අවශ්‍ය වුණා. එහිදී ඇමරිකා එක්සත් ජනපදය එකඟ වුණා එම සංචිත මුදල වශයෙන් ඇමරිකානු ඩොලරය භාවිත කිරීමට. එම එකඟතාවත් සමඟ ම ඇමරිකා එක්සත් ජනපදය තවත් පොරොන්දුවක් වුණා ලෝක ජනතාවට. ඒ, දඹ රත්‍රන් අවුන්සයක් ඇමරිකානු ඩොලර් 35කට හුවමාරු කරන්නට. මේ නිසා ලෝකයේ වෙනත් රටවලට තමන්ගේ ව්‍යවහාර මුදල් රත්‍රන්වලින් නියම කිරීමේ අවශ්‍යතාවක් ඇති වුණේ නැහැ. අපට ඩොලර් තිබෙනවානම් අපේ ව්‍යවහාර මුදලත් රත්‍රන් බවට පරිවර්තනය කරගන්නට පුළුවන්. මේ ක්‍රියාවලිය හැඳින්වූවේ රන් විනිමය මිනුම යනුවෙන් (Gold exchange standard). 1960 ගණන්වල අගභාගය වන තෙක් මෙය බොහෝ සාර්ථක ව ක්‍රියාත්මක වුණා.

ලෝක මහ බැංකු රාජකාරි ඉටු කරන රටකට ඇති වන විශේෂ වාසියක් වන්නේ තමන් අඩු වියදමකින් ඩොලර් නිකුත් කර, ලෝකයෙන් ම ඒ රටට මූර්ත භාණ්ඩ ගෙන්වා ගත හැකි වීම. එහෙත් අවාසනාවකට ඇමරිකා එක්සත් ජනපදය වියට්නාම් යුද්ධයට පැටලුණු පසු ඩොලර් නිකුතුව ඉහළ දැමුවා. මේ නිසා ඩොලර්වල වටිනාකම පහළ ගියා. ඒ සමඟ ම රත්‍රන්වල විවෘත වෙළෙඳපොළ මිල ගණන් දෙගුණයක් බවට පත් වුණා. ආයෝජකයන් මෙය අවස්ථාවක් කරගනිමින් ඇමරිකාවෙන් රත්‍රන් මිල දී ගෙන විවෘත වෙළෙඳපොළේ විකිණීමෙන් ලාභ ලැබුවා. මේ ක්‍රියාවලිය නිසා ඇමරිකා එක්සත් ජනපදයේ තිබුණු සම්පූර්ණ රත්‍රන් තොගය ම ශුන්‍ය වුණා 1971 අගෝස්තු මාසය වන විට. ඒ නිසා එක්සත් ජනපදය තීන්දුවක් ගත්තා රත්‍රන්වල නිල මිල ඩොලර් 70 දක්වා වැඩි කිරීමට හෝ නොඑසේනම් මේ රන් විනිමය මිනුමෙන් ඉවත් වීමට. ඔවුන් පළමු වැනි කාරණයට කැමති වුණේ නැහැ එය 100%කින් ඇමරිකා එක්සත් ජනපද ඩොලරය අවප්‍රමාණය කිරීමක් නිසා. එසේ වූවානම් රත්‍රන් නිෂ්පාදනය කරන රටක් සහ ඒ වන විටත් විශාල රත්‍රන් තොගයක් සන්තකයේ තිබෙන රටක් විදිහට සෝවියට් දේශයට විශාල වාසියක් ලැබීමේ හැකියාව තිබුණා. එවිට ඔවුන් එක රැයකින් බලවතුන් බවට පත්වෙනවා. ඒ නිසා ඇමරිකා එක්සත් ජනපදය 1971 අගෝස්තු මාසයේ ප්‍රකාශයක් නිකුත් කළා ඔවුන් මේ රන් විනිමය මිනුමෙන් ඉවත් වන බවට. එලෙස ඉවත් වුණත් වෙනත් විකල්ප සංචිත මුදලක් නොතිබුණු නිසා රටවල් ඇමරිකා එක්සත් ජනපද ඩොලරය භාවිත කළා තමන්ගේ නිල සංචිත ලෙස.

1970 මුල්භාගයේදී OPEC සංවිධානය එක පැන් පහරින් බොරතෙල්වල මිල දෙගුණයක් කළා. මේ නිසා ලෝකයේ ම පැවැති ඩොලර් සංචිත ඇදී ගියේ එම රටවලට. එවිට එක්සත් ජනපදය මේ රටවල් සමඟ එකඟතාවකට පැමිණ ප්‍රකාශයක් නිකුත් කළා මින් පසු ඛනිජ තෙල් අපනයනය කරනවානම් ඒවායේ

> කෘත්‍රිම බුද්ධිය මාර්ගයෙන් පුළුවන්කම තිබෙනවා විශාල වශයෙන් වැරදි තොරතුරු, සත්‍ය ලෙස මවාපාමින් ජනතාවට පෙන්වන්න සහ රටේ ආණ්ඩු පක්ෂය, තවත් පාර්ශ්ව එමගින් විශාල වශයෙන් අසීරුතාවට පත් කරන්න. මේවා බොහෝ විට ජනගත වන්නේ සමාජ මාධ්‍ය ඔස්සේ. මෙලෙස ජනගත වන වැරදි තොරතුරු සාධක සහිත ව **(Facts and figures)** නිවැරදි කිරීමට ප්‍රධාන මාධ්‍යවල විශේෂ ඉඩක් වෙන් කළ යුතුයි.



මිල ගණන් ඩොලර්වලින් නියම කළ යුතුයි යනුවෙන්. එවිට සෙසු රටවල් ඩොලර් අත්පත් කර ගත යුතුයි ඛනිජ තෙල් මිල දී ගැනීමට. ඒ ක්‍රමය පෙට්‍රෝ ඩොලර් ලෙස හැඳින්වුණා.

මේ වන විට මැදපෙරදිග යුද්ධය පෙට්‍රෝ ඩොලර්වලට තර්ජනයක් වී තිබෙනවා. ඉරානය මාර්තු 14 දින ප්‍රකාශයක් කර තිබෙනවා හෝමූස් සමුද්‍ර සන්ධිය හරහා යන සියලු ම නැව්වල ප්‍රවාහනය කරන ඛනිජ තෙල්, පොහොර, LP ගෑස් මිල ගණන් චීනයේ යුවාන්වලින් ප්‍රකාශ කළ යුතු බවට. එවිට පෙට්‍රෝ යුවාන් බවට පෙට්‍රෝ ඩොලර් පත් වෙනවා. ඒ සමග මෙතෙක් ඩොලර් නිෂ්පාදනය කර අනෙක් රටවල මූර්ත වත්කම් තමන්ට ලබාගන්නට ඇමරිකා එක්සත් ජනපදයට පැවති ඒකාධිකාරී බලය පලුදු වුණා. ඒ නිසා ප්‍රධාන වශයෙන් ම මේ යුද්ධය අද



එක්සත් ජනපද ඩොලරය හා සම්බන්ධ යුද්ධයක් බවට ද පත් ව තිබෙනවා.

මෙතෙක් අප ජාත්‍යන්තර ගෙවීම් කළේ SWIFT (Society for Worldwide Interbank Financial Telecommunication) ඔස්සේ. එනම් පෙට්‍රෝ ඩොලර් ක්‍රමයයි ක්‍රියාත්මක වුණේ. මෙය වෙනත් ව්‍යවහාර මුදලකට මාරු වන විට අප ගෙවීම් පදනම විදිහට පාවිච්චි කරන්නේ කුමක්ද යන කාරණය මත වෙනවා. එහෙත් BRICS රටවල් (බ්‍රසීලය, රුසියාව, ඉන්දියාව, චීනය, දකුණු අප්‍රිකාව) ඔවුන්ගේ ම ගෙවීම් පද්ධතියක් අද නිර්මාණය කර තිබෙනවා. එය හැඳින්වෙන්නේ mBridge නමින්. එය SWIFTවලට ම සමාන පද්ධතියක්.

යුවාන්වලින් පෙට්‍රල්වල, LP ගෑස්වල, පොහොරවල මිල ගණන් නියම කළා ම අපට ගෙවීමේ පහසුකම තිබෙනවා mBridge ඔස්සේ. එවිට එම මුදල් ගලා යන්නේ චීනය දෙසට. අප SWIFTවලින් ගෙවනු ලැබුවහොත් එම මුදල් ගලා යන්නේ අමරිකාව දෙසට. මේ අනුව පැහැදිලියි මේ යුද්ධය ඉරානයත් සමඟ කළාට ඇමරිකා එක්සත් ජනපදය යුද්ධය කරන්නේ චීනය සහ රුසියාවත් සමඟ බව. චීන ආර්ථිකය වේගයෙන් වර්ධනය වෙමින් තිබෙනවා.

ශ්‍රී ලංකාව වැනි රටවල් තමන්ගේ ගෙවුම් පද්ධතිය SWIFTවලින් ගෙවීමටයි තවමත් හුරු කර තිබෙන්නේ. අපේ බැංකු ක්‍රමයත් තිබෙන්නේ SWIFTවලින් ගෙවීමට. මෙය සංශෝධනය කර mBridgeවලින් ගෙවීමට අවශ්‍ය පහසුකම් ලබාදීමට මහ බැංකුවට සිදු වෙනවා. එසේ නොවුණොත් මේ විශාල ගනුදෙනු ප්‍රමාණය කළ නොහැකි වෙනවා අප SWIFTවලින් පමණක් ගෙවන නිසා. එබැවින් අපේ ගෙවීම් පද්ධතිය තව පුළුල් කරන්න වෙනවා mBridgeවලිනුත් ගෙවන්න පුළුවන් ආකාරයට. මෙය ශ්‍රී ලංකා මහබැංකුවට යම් ආකාරයක අභියෝගයක් ද වනු ඇති.

යුද්ධය රටේ ජාත්‍යන්තර ප්‍රවාහනයට මෙන් ම අභ්‍යන්තර ප්‍රවාහනයටත් බලපානවා. යුද්ධයත් සමඟ හෝමුස් සමුද්‍ර සන්ධියේ හිර වී තිබුණා නැව් 2000ක් පමණ. ඒ අනුව ජාත්‍යන්තර නාවික ගමනාගමනය සහ ජාත්‍යන්තර ගුවන් ගමනාගමනය අඩාල වී තිබෙනවා. දේශීය වශයෙන් දැනටමත් අප සලාක ක්‍රමයටයි ඉන්ධන බෙදා හරින්නේ. ඉදිරියට අපට ඉන්ධන ලබාගත නොහැකි වුණොත් රටේ ඉන්ධන ලබාදීම තවදුරටත් සීමා කරන්න සිදු වේවි. ඒ, යුද්ධය තවත් දුරදිග ගියහොත්. මෙය සමස්ත ලෝකයට ම බලපාන්න පුළුවන් තත්ත්වයක්.

ප්‍රේෂණ සහ සංචාරක කර්මාන්තය යනු අප විදේශ සංචිත ගොඩනගා ගන්නා ප්‍රධාන මාර්ග. පවතින යුද්ධය නිසා ප්‍රේෂණවලට බලපෑමක් ඇති වෙනවා. මැදපෙරදිග යුද්ධය ඇති වීම නිසා අපේ බැංකු ක්‍රමයට එම සංචිත ලැබෙන්නේ නැහැ. දෙවැන්න සංචාරක කර්මාන්තයට වන බලපෑම. එවැන්නක් තවමත් සිදු ව නැහැ.

මෙවැනි තත්ත්වයකදී ශ්‍රී ලංකා ආණ්ඩුව, ප්‍රතිපත්ති සම්පාදකයන්, විපක්ෂය, ජනමාධ්‍ය ආයතන සහ මහජනතාව සමස්තයක් ලෙස ක්‍රියා කිරීම වැදගත්. වර්තමාන තාක්ෂණය පිළිබඳ අවධානයෙන් සිටිය යුතුයි. විශේෂයෙන් කෘත්‍රිම බුද්ධිය මාර්ගයෙන් පුළුවන්කම තිබෙනවා විශාල වශයෙන් වැරදි තොරතුරු, සත්‍ය ලෙස මවාපාමින් ජනතාවට පෙන්වන්න සහ රටේ ආණ්ඩු පක්ෂය, තවත් පාර්ශ්ව එමගින් විශාල වශයෙන් අසීරුතාවට පත් කරන්න. මේවා බොහෝ විට ජනගත වන්නේ සමාජ මාධ්‍ය ඔස්සේ. මෙලෙස ජනගත වන වැරදි තොරතුරු සාධක සහිත ව (Facts and figures) නිවැරදි කිරීමට ප්‍රධාන මාධ්‍යවල විශේෂ ඉඩක් වෙන් කළ යුතුයි.

සටහන

**කාංචනා සිරිවර්ධන**




ආචාර්ය
**ලසිත පත්බේරිය**
අධ්‍යක්ෂ
ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව


# ආර්ථික ස්වාරක්ෂක රට සතුයි

මැදපෙරදිග කලාපයේ හටගෙන ඇති අස්ථාවර තත්ත්වය අප බලාපොරොත්තු නොවූ මොහොතක උද්ගත වූවක්. විශේෂයෙන් 2026 වසරේ මුල් කාර්තුවේ, එනම් පෙබරවාරි අගභාගයේ සිට උත්සන්න වූ මේ ගැටුම්කාරී තත්ත්වය හේතුවෙන් ගෝලීය ආර්ථිකයට එල්ල වී ඇති අභියෝග විවිධයි. මේ අභියෝගවල බලපෑම සංවර්ධිත රටවලට සාපේක්ෂ ව ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටවලට දැඩි ව බලපානවා. ලෝක වෙළෙඳපොළේ ඉන්ධන මිල උච්චාවචනය වීම, ගෝලීය සැපයුම් ජාල අවහිර වීම සහ සංචාරක කර්මාන්තය මන්දගාමී වීම මීට ප්‍රධාන හේතු.

පසුගිය වසර කිහිපයේ ශ්‍රී ලංකාව විවිධ ආර්ථික කම්පනවලට මුහුණ දුන්නා. 2022 වසරේ පැවති දැඩි ආර්ථික අර්බුදයෙන් පසු ක්‍රියාවට නැංවූ ස්ථායීකරණ වැඩසටහන සහ දැඩි ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ හේතුවෙන් මෙරට ආර්ථිකය ගොඩනගාගෙන තිබුණේ යම් ඔරොත්තු දීමේ ශක්තියක්. එහෙත් මැදපෙරදිග අර්බුදයත් සමඟ එම ගොඩනැගෙමින් පවතින ස්ථායිතාවට අලුත් බාධා එල්ල වුණා. මේ බාහිර කම්පනවලට මුහුණ දීම සඳහා ශ්‍රී ලංකාව සතු ව පෙර වසරවලට වඩා යහපත් මට්ටමක පවතින ආර්ථික ස්වාරක්ෂක (Economic buffers) පවතින බව මෙහිදී සිහිපත් කළ යුත්තක්. විශේෂයෙන් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියෙහි පවතින විනය ඔස්සේ අය වැය පරතරය කළමනාකරණය කර ගැනීමත් බාහිර අංශයේ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා දළ නිල


පසුගිය වසර කිහිපයේ ශ්‍රී ලංකාව විවිධ ආර්ථික කම්පනවලට මුහුණ දුන්නා. 2022 වසරේ පැවති දැඩි ආර්ථික අර්බුදයෙන් පසු ක්‍රියාවට නැංවූ ස්ථායීකරණ වැඩසටහන සහ දැඩි ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ හේතුවෙන් මෙරට ආර්ථිකය ගොඩනගා ගෙන තිබුණේ යම් ඔරොත්තු දීමේ ශක්තියක්. එහෙත් මැදපෙරදිග අර්බුදයත් සමඟ එම ගොඩනැගෙමින් පවතින ස්ථායිතාවට අලුත් බාධා එල්ල වුණා. මේ බාහිර කම්පනවලට මුහුණ දීම සඳහා ශ්‍රී ලංකාව සතු ව පෙර වසරවලට වඩා යහපත් මට්ටමක පවතින ආර්ථික ස්වාරක්ෂක (Economic buffers) පවතින බව මෙහිදී සිහිපත් කළ යුත්තක්.


සංචිත මට්ටම ඉහළ නංවා ගැනීමත් මේ ගැටුම්කාරී සමයේදී ශ්‍රී ලංකාවට සපයන්නේ අතිරේක ආරක්ෂාවක්. මේ රාජ්‍ය මූල්‍ය සහ බාහිර අංශයේ ශක්තිමත්භාවය හේතුවෙන් මැදපෙරදිග අර්බුදය හමුවේ වුවත් මෙරට ආර්ථිකය පෙර මෙන් කඩා වැටීමකට ලක් නොවී ඉදිරියට පවත්වාගෙන යාමට හැකියාව ලැබී තිබෙනවා.

අර්බුදයේ ඍජු සහ වඩාත් ම තීරණාත්මක බලපෑම වන්නේ ඉන්ධන මිල ඉහළ යාම. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පිරිවැය මත පදනම් වූ මිල සූත්‍රය හේතුවෙන් ලෝක වෙළෙඳපොළෙහි ඉන්ධන මිලෙහි සිදුවන වෙනස්කම් දේශීය වෙළෙඳපොළට ගලා එනවා. ශ්‍රී ලංකාව මුළුමනින් ම ඉන්ධන ආනයනය කරන රටක් වන බැවින් එය අත්‍යවශයෙන් ම සිදුවිය යුත්තක්. එසේ නොවුණහොත් මෙවැනි විදේශ කම්පනවලින් සිදුවන මිල වැඩිවීම් ඉන්ධන පාරිභෝගිකයන් නොගෙවා රාජ්‍ය අය වැයට බරක් වී ඉන්ධන අඩු වැඩි වශයෙන් භාවිත කරන සියලුම ශ්‍රී ලාංකිකයන්ට එක ලෙස ගෙවීමට සිදු වෙනවා.

බලශක්ති මිල ඉහළ යාම දේශීය උද්ධමනය කෙරෙහි ඍජු ව ම බලපාන බව අප්‍රේල් මාසයේ දත්ත දෙස බැලීමේදී පැහැදිලි වන්නක්. මාර්තු මස 2.2%ක් ලෙස පැවති වාර්ෂික උද්ධමනය අප්‍රේල් වන විට 5.4%ක් දක්වා ඉහළ යාමෙන් පෙනී යන්නේ ජනතාවගේ පරිභෝජන ශක්තිය කෙරෙහි මේ අර්බුදය කෙතරම්දුරට බලපා ඇති ද යන්න. කෙසේ වෙතත් ශ්‍රී



ලංකා මහ බැංකුවේ පුරෝකථන මත අවශ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙන් අනතුරු ව යුදමය තත්ත්වයේ තීව්‍රභාවය අනුව මධ්‍යකාලීන ව උද්ධමනය 5%ක ඉලක්කගත අගය වටා පවත්වා ගැනීමට හැකිවනු ඇති.

පවතින දත්ත අනුව 2026 මාර්තු සහ අප්‍රේල් මාසවලදී සංචාරක පැමිණීම් පසුගිය වසරට සාපේක්ෂ ව පිළිවෙළින් 20% සහ 22%කින් පමණ පහත වැටී තිබෙනවා. මැදපෙරදිග කලාපයේ ගුවන් ගමන් අවදානම, ලෝක මට්ටමින් ඇති වී තිබෙන අනාරක්ෂිත බව මෙන් ම ගුවන් ටිකට්පත් මිල වැඩිවීම මීට ප්‍රධාන හේතු. එහෙත් ඉදිරි මාස කිහිපය මෙරට සංචාරක කර්මාන්තයේ සාමාන්‍යයෙන් පැමිණීම අඩු කාලසීමාවක් (off-season) වන බැවින් එයින් සිදුවන සමස්ත පාඩුව අවම වන්නට පුළුවන්.

විදේශ රැකියා ක්ෂේත්‍රය සහ අපනයන ආදායම ද අවදානමකට ලක් ව ඇති ක්ෂේත්‍ර. ශ්‍රී ලංකාවේ විදේශ විනිමය උත්පාදනය කරන ප්‍රධාන මූලාශ්‍රයක් වන මැදපෙරදිග සේවය කරන ශ්‍රමිකයන්ගෙන් ලැබෙන ප්‍රේෂණ මත දැනට සෘණාත්මක බලපෑමක් ඇති වී නොතිබුණත් ඉදිරියේදී ප්‍රේෂණ අඩු විය හැකියි. එසේ ම මැදපෙරදිග රටවලට සිදු කරන ප්‍රධාන වශයෙන් තේ අපනයනය විශාල වශයෙන් මාර්තු මාසයේදී අඩු වී තිබෙනවා. එහෙත් අනෙකුත් ප්‍රධාන වෙළෙඳපොළ සඳහා වන අපනයන පවතින්නේ ස්ථාවර මට්ටමක.

අර්බුදයේ සැබෑ බලපෑම තීරණය වන්නේ යුදමය තත්ත්වය ඉදිරියේදී පවතින කාලසීමාව සහ එහි තීව්‍රතාව මත. එබැවින් මේ බාහිර කම්පනයට මුහුණදීම සඳහා පවතින ස්වාරක්ෂක ඉතා හොඳින් කළමනාකරණය, විශේෂයෙන් විදේශ විනිමය සංචිත වඩාත් සුරක්ෂිත ව කළමනාකරණය වර්තමානයේ අත්‍යවශ්‍ය වෙනවා.

විශේෂයෙන් 2026 මාර්තු මාසය වන විට ඉන්ධන ආනයන වියදම ඇමරිකානු ඩොලර් මිලියන 630ක් දක්වා 75%කින් පමණ විශාල ලෙස ඉහළ ගොස් ඇති බව පෙනී යනවා. මෙය වසරේ මුල්භාගයේදී අපේක්ෂා කළ අගයට වඩා වැඩි වීමක්. ඒ සඳහා ඉන්ධන මිල වැඩිවීම මෙන් ම ඉන්ධන සඳහා ඉල්ලුම එම මාසයේදී වැඩිවීම ද හේතු වුණා. එහෙත් දේශීය වශයෙන් ඉන්ධන සඳහා පවතින ඉල්ලුම යම් ප්‍රමාණයකට සීමා වී ඇති බැවින් සහ ආර්ථිකයේ ඉල්ලුම යම්කිසි ප්‍රමාණයකින් අඩු විය හැකි බැවින් වසර තුළදී ආනයන වියදම දැරිය නොහැකි මට්ටමට ඉහළ යා නොහැකියි.

ගෝලීය බලශක්ති මිල ඉහළ යාම සහ සැපයුම් දාමයන්හි ඇති වූ බාධා මධ්‍යයේ බලශක්ති සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා ඉන්ධන පරිභෝජනය කළමනාකරණය වෙනුවෙන් ඉන්ධන සලාක ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට මෙන් ම පොදු ප්‍රවාහන සේවා භාවිතය දිරිමත් කිරීමට රජය පියවර ගත්තා. බලශක්ති ඉල්ලුම අවම කිරීමේ අරමුණින් රාජ්‍ය සහ පෞද්ගලික අංශය සඳහා හඳුන්වා දුන්නේ නිවසේ සිට වැඩ කිරීමේ ක්‍රමවේද. කාර්යක්ෂම බලශක්ති භාවිතය සහ බලශක්ති සංරක්ෂණය පිළිබඳ ජාතික මට්ටමේ දැනුවත් කිරීමේ වැඩසටහන් ද දියත් කළා.

සමස්තයක් ලෙස ගත් කල, මැදපෙරදිග යුදමය වාතාවරණය ශ්‍රී ලංකා ආර්ථිකයට තීරණාත්මක බලපෑමක් එල්ල කළ හැකි බව නොරහසක්. මේ අර්බුදයේ සැබෑ බලපෑම තීරණය වන්නේ යුදමය තත්ත්වය ඉදිරියේදී පවතින කාලසීමාව සහ එහි තීව්‍රතාව මත. එබැවින් මේ බාහිර කම්පනයට මුහුණදීම සඳහා පවතින ස්වාරක්ෂක ඉතා හොඳින් කළමනාකරණය, විශේෂයෙන් විදේශ විනිමය සංචිත වඩාත් සුරක්ෂිත ව කළමනාකරණය වර්තමානයේ අත්‍යවශ්‍ය වෙනවා.

# අපනයන ප්‍රගතියක්



**මංගල විජේසිංහ**
සභාපති, ප්‍රධාන විධායක නිලධාරී
අපනයන සංවර්ධන මණ්ඩලය

මැදපෙරදිග කලාපයේ බලපෑම ඇත්තේ 5%-8%ක ප්‍රමාණයක්. එහෙත් රක්ෂණ ගාස්තු හා නැව් ගාස්තුව ඉහළ යාම හේතු කරගෙන යම් බලපෑමක් වර්තමානයේ ඇති වී තිබෙනවා භාණ්ඩවල පිරිවැය සම්බන්ධයෙන්. අපනයන විවිධාංගීකරණය හා වෙළෙඳපොළ විවිධාංගීකරණය නිසා එහි බලපෑම තරමක් අඩු වී තිබෙනවා. එහිදී විශේෂයෙන් කිව යුතුයි අපනයන සංවර්ධන මණ්ඩලය ලෙස අපගේ ඉලක්කය වූයේ 2025 වසරේ ලබාගත් අපනයන ආදායමේ 6%ක වර්ධනය 2026 වසරේ 10%ක වර්ධනයක් කරා ගෙන යාමට. ඒ අනුව 2026 වසරේ මුල් මාස දෙක තුළ 7.5%ක වර්ධනයක් ලබා ගැනීමට හැකි වුණා. එහෙත් මාර්තු මාසයේ එය 5%කින් පසුබෑමකට ලක්වුණා. අපනයන ඉහළ නැංවීමට මේ වසරේ වැඩසටහන් 140කට වැඩි සංඛ්‍යාවක් සංවිධානය කර තිබෙනවා. ඊට අමතර ව ජාතික අපනයන සංවර්ධන සැලැස්මක් මැයි මාසයේදී එළිදැක්වීමට නියමිතයි.

මෙරට ජනතාව අතර විශේෂ කතාබහට ලක් වූ මාතෘකාවක් වුණේ 2026 වසරේ මාර්තු මාසයේ අපනයන ආදායම. පෙබරවාරි මාසයේ අග සිට මැදපෙරදිග කලාපයේ යුද්ධය ආරම්භ වූ පසු එය මෙරට අපනයන ආදායම අඩු කිරීමට බලපෑම් කළ හැකි බව ඔවුන්ගේ අදහස වුණා.

ශ්‍රී ලංකා රේගුවේ දත්ත අනුව මාර්තු මාසයේ අපනයන ආදායම ඇමරිකානු ඩොලර් මිලියන 1467ක් ලෙසයි වාර්තා වන්නේ. ඒ, වෙළෙඳ භාණ්ඩ අපනයන ආදායම ඇමරිකානු ඩොලර් මිලියන 1180ක් සහ සේවා අංශයේ අපනයන ආදායම ඇමරිකානු ඩොලර් මිලියන 286ක් වශයෙන්. ඒ අනුව පෙබරවාරි මාසයට සාපේක්ෂ ව පෙන්නුම් කරන්නේ අපනයන ආදායමේ 9%ක වර්ධනයක්. 2025 මාර්තු මාසයට සාපේක්ෂ ව 2026 මාර්තු මාසය සැසඳීමේදී 5.2%ක අඩුවීමක් දක්නට ලැබෙනවා. පොල් ආශ්‍රිත නිෂ්පාදනවල අපනයන ආදායම, ඉලෙක්ට්‍රොනික අංශය, ආහාරපාන අංශය, මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රය සහ තොරතුරු තාක්ෂණ යන ක්ෂේත්‍රවල අපනයන ආදායමේ කැපී පෙනෙන වර්ධනයක් 2026 මාර්තු මාසයේදී දක්නට පුළුවන්. විශේෂයෙන් ඉන්දියාව, ප්‍රංශය, බෙල්ජියම, ජපානය සහ චීනය යන රටවලට සිදු කළ අපනයනවල ආදායමේ කැපී පෙනෙන වර්ධනයක් මේ මාසයේදී දක්නට ලැබුණා.

මෙහිදී කලාප වශයෙන් රටවල් සලකා බැලීම වැදගත්. ඒ අනුව ලතින් ඇමරිකානු රටවල් ආශ්‍රිත ව කිසියම් ආකාරයකට අපනයන ආදායමේ අඩුවීමක් දැකගත හැකියි. යුරෝපය, අප්‍රිකානු හා ආසියානු රටවල කැපී පෙනෙන වර්ධනයක් 2026 මාර්තු මාසයේදී දක්නට පුළුවන්. එහෙත් මැදපෙරදිග කලාපයේ 48%ක අපනයන ආදායමේ අඩුවීමක් මාර්තු මාසයේදී දක්නට ලැබෙනවා. සාමාන්‍යයෙන් මාසික ව ශ්‍රී ලංකාව මැදපෙරදිගට අපනයනය කරනවා ඇමරිකානු ඩොලර් මිලියන 90-100ත් අතර නිෂ්පාදන වටිනාකමක් සහිත අපනයන. ඒ අනුව මාර්තු මාසයේදී මැදපෙරදිග කලාපවල රටවලින් වාර්තා වන්නේ ඇමරිකානු ඩොලර් මිලියන 45ක ආදායමක්.

විශේෂයෙන් 2026 වසරේ ජනවාරි සිට මාර්තු දක්වා මෙරට අපනයන ආදායම ඇමරිකානු ඩොලර් මිලියන 4308ක් ලෙස වාර්තා වෙනවා. එය 2025 වසර සමඟ සැසඳූ විට 2%කට ආසන්න වර්ධනයක්. 2026 වසරේ පළමු කාර්තුවේ වෙළෙඳ භාණ්ඩ අපනයන ආදායම ඇමරිකානු ඩොලර් මිලියන 3387ක්. සේවා අංශයේ අපනයන




ආදායම ඇමරිකානු ඩොලර් මිලියන 921ක් ලෙස වාර්තා වෙනවා. 2026 පෙබරවාරි 28 දින සිට යුද්ධය ආරම්භ වූවාට පසුව මෙරට අපනයනකරුවන් ගැටලු රාශියකට මුහුණ දුන්නා. ඊට හේතු වන්නේ නැව් ගාස්තු ඉහළ යාම, භාණ්ඩවල පිරිවැය ඉහළ යාම සහ රක්ෂණ ගාස්තු ඉහළ යාම. ඒ අනුව එයාර් කාගෝ (Air cargo), ෂිප් කාගෝ (Ship cargo) යැවීමේදී මේ ගැටලුවලට මුහුණපෑමට අපනයනකරුවන්ට සිදු වුණා. එය ශ්‍රී ලංකාවේ විදේශ විනිමයටත් අපනයන ආදායමටත් බලපෑම් කරනවා.

විශේෂයෙන් 2026 මාර්තු මාසයේ මැද වන විට කිසියම් ප්‍රමාණාත්මක වර්ධනයක් කාගෝවල තිබෙනවා. එහෙත් ශ්‍රී ලංකාවේ සිට ෂිප් කාගෝවලින් සෘජු ව ම යැවීම අපහසුයි. ඒ අනුව බොහෝ අපනයනකරුවන් වෙනත් මාර්ග ඔස්සේ අපනයන ක්‍රියාවලිය සිදු කරනවා විශේෂයෙන් මැදපෙරදිග රටවලට. මේ සඳහා බලපෑම් ඇති කර තිබෙන්නේ නැව් ගාස්තු සහ රක්ෂණ ගාස්තු ඉහළ යාම. සමස්තයක් ලෙස ගත් විට මැදපෙරදිග යුද්ධය හේතුවෙන් රක්ෂණ ගාස්තු සහ නැව් ගාස්තු ඉහළ යාම සෑම ක්ෂේත්‍රයකට ම බලපෑවා. එවැනි තත්ත්වයක් පැවැතියත් මේ වසරේ මාර්තු මාසයේ ඇමරිකානු ඩොලර් මිලියන 1467ක අපනයන වර්ධනයක් ලබා ගැනීම ජයග්‍රහණයක්.

මැදපෙරදිග කලාපයේ බලපෑම ඇත්තේ 5%-8%ක ප්‍රමාණයක්. එහෙත් රක්ෂණ ගාස්තු හා නැව් ගාස්තුව ඉහළ යාම හේතු කරගෙන යම් බලපෑමක් වර්තමානයේ ඇති වී තිබෙනවා භාණ්ඩවල පිරිවැය සම්බන්ධයෙන්. අපනයන විවිධාංගීකරණය හා වෙළෙඳපොළ විවිධාංගීකරණය නිසා එහි බලපෑම තරමක් අඩු වී තිබෙනවා. එහිදී විශේෂයෙන් කිව යුතුයි අපනයන සංවර්ධන මණ්ඩලය ලෙස අපගේ ඉලක්කය වූයේ 2025 වසරේ ලබාගත් අපනයන ආදායමේ 6%ක වර්ධනය 2026 වසරේ 10%ක වර්ධනයක් කරා ගෙන යාමට. ඒ අනුව 2026 වසරේ මුල් මාස දෙක තුළ 7.5%ක වර්ධනයක් ලබා ගැනීමට හැකි වුණා. එහෙත් මාර්තු මාසයේ එය 5%කින් පසුබෑමකට ලක්වුණා. අපනයන ඉහළ නැංවීමට

වර්තමානයේ පවතින වෙළෙඳ ගිවිසුම් සමාලෝචනය කර තවදුරටත් ශ්‍රී ලංකාවට වාසිදායක මට්ටමේ වෙළෙඳ ගිවිසුම් වෙත යාමට පියවර ගනිමින් සිටිනවා. ඊට අමතර ව නව අපනයන සැකසුම් කලාප 05-10ත් අතර සංඛ්‍යාවක් ස්ථාපිත කිරීමත් බලාපොරොත්තුවක්. මේ සෑම පියවරකින් ම අපේක්ෂා කරන්නේ සෑම ක්ෂේත්‍රයක ම වර්ධනය ඔස්සේ 2026 වසරේ කැපී පෙනෙන අපනයන වර්ධනයක් කරා යාම.



මේ වසරේ වැඩසටහන් 140කට වැඩි සංඛ්‍යාවක් සංවිධානය කර තිබෙනවා. ඊට අමතර ව ජාතික අපනයන සංවර්ධන සැලැස්මක් මැයි මාසයේදී එළිදැක්වීමට නියමිතයි. එහිදී අපේ ඉලක්කය වී තිබෙන්නේ ශ්‍රී ලංකාවේ ඇති සාම්ප්‍රදායික අපනයනයෙන් ඔබ්බට ගොස් අපනයන ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම. ඒ සඳහා නව ක්ෂේත්‍ර ගණනාවක් හඳුනාගෙන තිබෙනවා. ඛනිජ ද්‍රව්‍ය පදනම් කරගත් ක්ෂේත්‍රය (Mineral based), ස්වයංක්‍රීය සංරචක (Auto components), ඉලෙක්ට්‍රොනික ක්ෂේත්‍රය (Electronic), ආහාර පාන ක්ෂේත්‍රය (Food And Beverage) වශයෙන් නව ක්ෂේත්‍ර රාශියක් හඳුනාගෙන තිබෙනවා. ඒ අනුව ඒවායෙහි සැලසුම් සියල්ල නිම කර තිබෙනවා. මැයි මාසයෙන් පසුව ජාතික අපනයන සංවර්ධන සැලැස්ම ශ්‍රී ලංකාවේ දියත් කිරීම අපේක්ෂාවක්. මෙහි ඉලක්කය වී ඇත්තේ 2030 වසර වන විට ඇමරිකානු ඩොලර් බිලියන 36ක ඉලක්කයක් කරා යාමට. ඒ අනුව වාර්ෂික ව අපනයනයෙන් 10%ක වර්ධනයක් සහ භාණ්ඩ විවිධාංගීකරණය හා වෙළෙඳපොළ විවිධාංගීකරණය ඔස්සේ නව අපනයන ආදායම් වර්ධනයක් බලාපොරොත්තු වෙනවා. ඒ වෙනුවෙන් කමිටුවක් ද පත් කළා.

වර්තමානයේ පවතින වෙළෙඳ ගිවිසුම් සමාලෝචනය කර තවදුරටත් ශ්‍රී ලංකාවට වාසිදායක මට්ටමේ වෙළෙඳ ගිවිසුම් වෙත යාමට පියවර ගනිමින් සිටිනවා. ඊට අමතර ව නව අපනයන සැකසුම් කලාප 05-10ත් අතර සංඛ්‍යාවක් ස්ථාපිත කිරීමත් බලාපොරොත්තුවක්. මේ සෑම පියවරකින් ම අපේක්ෂා කරන්නේ සෑම ක්ෂේත්‍රයක ම වර්ධනය ඔස්සේ 2026 වසරේ කැපී පෙනෙන අපනයන වර්ධනයක් කරා යාම. අවිනිශ්චිත තත්ත්ව සමඟ වුවත් එහිදී අපේක්ෂා කරන්නේ 10%ක අපනයන වර්ධනයක් ළඟා කර ගැනීම.

**රංගිකා අබේසේකර**



# ඩිජිටල් සංස්කෘතිය හා මාධ්‍ය පරිභෝජනය

කපිල එම්. ගමගේ

සන්නිවේදන තාක්ෂණය අත්පත් කර ගන්නා වේගවත් දියුණුව නිසා 21 වැනි ශතවර්ෂය 'ඩිජිටල් යුගය' ලෙස හැඳින්වෙනවා. අන්තර්ජාලය, සුහුරු දුරකතනය, සමාජ මාධ්‍ය සහ නව තාක්ෂණික සංවර්ධනය හේතුවෙන් ජීවන රටා, සන්නිවේදන ක්‍රම සහ තොරතුරු පරිභෝජනයේ ස්වරූප වෙනස් වී ඇත්තේ ගැඹුරින් ම. 'ඩිජිටල් සංස්කෘතිය' යන සංකල්පය මේ පරිවර්තනයේ මූලික භූමිකාවක් ඉටු කරනවා. ඩිජිටල් සංස්කෘතිය (Digital Culture) යනුවෙන් හැඳින්වෙන්නේ පරිශීලකයන් ඩිජිටල් තාක්ෂණය (සුහුරු දුරකතන, අන්තර්ජාලය, සමාජ මාධ්‍ය, යෙදුම් සහ ඩිජිටල් වේදිකා) භාවිත කරන විට ඇතිවන හැසිරීම්, පුරුදු, වටිනාකම් සහ සමාජ අන්තර්ක්‍රියා රටාවල එකතුව. ග්‍රාහකයා තොරතුරු ලබාගැනීම, සන්නිවේදනය කිරීම, වැඩ කිරීම සහ විනෝදාස්වාදය ලබන ආකාරය ඩිජිටල් තාක්ෂණයෙන් හැඩගැසීම ඩිජිටල් සංස්කෘතිය ලෙස සැලකෙනවා.

ඩිජිටල් සංස්කෘතියෙහි ක්‍රියාකාරකම්, අධ්‍යාපනය සහ විනෝදාස්වාදය ද විශාල ලෙස වෙනස් වෙනවා. online classes, Zoom meetings, e-learning platforms සහ digital payment systems වැනි දේ සාමාන්‍ය ජීවිතයේ කොටසක් බවටයි පත් වී තිබෙන්නේ. මෙය පුද්ගලයෙකුට ඕනෑ ම ස්ථානයක සිට සම්බන්ධ වීමට හා ක්‍රියාත්මක වීමට හැකියාව ලබා දෙන අතර කාර්යක්ෂමතාව ද වැඩි කරනවා.

ඩිජිටල් සංස්කෘතිය යනු තාක්ෂණය පමණක් නොව එය පුද්ගලන්ගේ සිතීම, සන්නිවේදනය, සමාජ සම්බන්ධතා සහ සංස්කෘතික වටිනාකම් පවා වෙනස් කරන නව සමාජ පද්ධතියක්. ශ්‍රී ලංකාව ද ගෝලීය ඩිජිටල් පරිවර්තනයේ කොටසක් වශයෙන් පසුගිය දශක දෙකේ වේගයෙන් ඩිජිටල් සමාජයක් වෙත පරිවර්තනය වී තිබෙනවා. අන්තර්ජාල ප්‍රවේශය වැඩිවීම, ජංගම දුරකතන භාවිතයේ වර්ධනය සහ සමාජ මාධ්‍ය වේදිකා ජනප්‍රිය වීම හේතුවෙන් ශ්‍රී ලාංකිකයන්ගේ මාධ්‍ය පරිභෝජන රටාව වෙනස් වී තිබෙන්නේ සම්පූර්ණයෙන් ම. ඒ ඔස්සේ සාම්ප්‍රදායික මාධ්‍යවලින් (Traditional media) ඩිජිටල් වේදිකා (Digital platforms) වෙත ගමන් කිරීමක් සිදු වී ඇති අතර පරිශීලකයන්ගේ භූමිකාව ද අක්‍රිය ග්‍රාහකයාගේ සිට ක්‍රියාකාරී අන්තර්ගත නිර්මාණකරුවන් ලෙස වෙනස් වී තිබෙනවා.

ඩිජිටල් මාධ්‍ය පරිභෝජනයේ ප්‍රධාන ලක්ෂණයක් වන්නේ ඉල්ලුම මත (on-demand) හෝ පරිශීලකයාට අවශ්‍ය මොහොතක හෝ අන්තර්ගතය ලබා ගැනීමේ හැකියාව තිබීම. YouTube වීඩියෝ, Facebook පෝස්ට්, TikTok වීඩියෝ සහ Online news platforms ඔස්සේ පරිශීලකයන්ට තම කැමැත්ත අනුව අන්තර්ගතය තෝරා ගත හැකියි. මෙය සාම්ප්‍රදායික භෞමික සංඛ්‍යාත භාවිත මාධ්‍ය (Terrestrial) රටාවට වඩා ඉතා නම්‍යශීලී හා පුද්ගල කේන්ද්‍රීය (Personalized) පරිභෝජන රටාවක්.

මෙහිදී ඇල්ගොරිතම් (algorithm) තාක්ෂණය විශේෂ භූමිකාවක් ඉටු කරනවා. සමාජ මාධ්‍ය වේදිකා විසින් පරිශීලකයාගේ හැසිරීම් (likes, shares, watch time) විශ්ලේෂණය කර ඔහුට හෝ ඇයට හෝ ගැළපෙන අන්තර්ගතය නිර්දේශ කරනු ලබන අතර මාධ්‍ය පරිභෝජනය ඇල්ගොරිතම මගින් පාලිත (algorithm-driven) ක්‍රියාවලියක් බවට පත් කර තිබෙනවා. මෙහිදී පරිශීලකයාට නොදැනීම ඔහුගේ මාධ්‍ය තේරීම් බාහිර පාලනයකට යටත් වීමේ අවදානම ද ඇති කරන බව පැහැදිලි වන කරුණක්.

ඩිජිටල් සංස්කෘතියෙහි මාධ්‍ය පරිභෝජනය ප්‍රබල අන්තර්ක්‍රියාකාරී ක්‍රියාවලියක් බවට පත් වී අවසන්. like, comment, share වැනි ක්‍රියා ඔස්සේ පරිශීලකයා අන්තර්ගතයට ප්‍රතිචාර දක්වන අතර මෙය මාධ්‍යය සහ ප්‍රේක්ෂකයා අතර නිර්මාණය කරන්නේ ඍජු සන්නිවේදන පාලමක්. සාම්ප්‍රදායික මාධ්‍යයේ තිබූ දුරස්ථභාවය ද අඩු කර තිබෙනවා.

ඩිජිටල් සංස්කෘතිය හා මාධ්‍ය පරිභෝජනය යනු නව තාක්ෂණය මත පදනම් වූ සමාජ

වෙනස්කම් ද්විත්වයක්. ඒවා එක් ව තොරතුරු ලබාගැනීමේ වේගය, අන්තර්ගත නිර්මාණය සහ සමාජ සම්බන්ධතා ක්‍රමය සම්පූර්ණයෙන් ම වෙනස් කරමින් නව මාධ්‍ය යුගයක් නිර්මාණය කර තිබෙනවා.

ශ්‍රී ලංකාවේ ඩිජිටල් සංස්කෘතිය වර්ධනය වීමත් සමඟ මාධ්‍ය පරිභෝජනයේ ගැඹුරු වෙනස්කම් දක්නට පුළුවන්. බහුතරය තම ජංගම දුරකතනයෙන් මාධ්‍ය පරිභෝජනය සිදු කරන නිසා කෙටි ස්වරූපී අන්තර්ගත වඩාත් ජනප්‍රිය වී තිබෙනවා. උණුසුම් පුවත් බොහෝවිට පළමු ව සමාජ මාධ්‍යවල පළ වන අතර සාම්ප්‍රදායික මාධ්‍ය එය පසුව වාර්තා කරන ස්වරූපයකුයි දක්නට ලැබෙන්නේ. මෙය පුරවැසි මාධ්‍යකරණය වර්ධනය වීමට ද හේතුවක්.

ඩිජිටල් සංස්කෘතිය හේතුවෙන් තොරතුරු ලබා ගැනීමේ ක්‍රමය ද වෙනස් වී තිබෙනවා. සාම්ප්‍රදායික මාධ්‍ය වෙනුවට සමාජ මාධ්‍ය හා ඩිජිටල් වේදිකා ප්‍රධාන මූලාශ්‍ර බවට පත් කරගෙන තිබීමත් අධ්‍යාපනය, ව්‍යාපාර සහ රැකියා ක්ෂේත්‍රවල ද ඩිජිටල් තාක්ෂණය හේතුවෙන් කාර්යක්ෂමතාව වැඩි වී තිබීමත් දක්නට පුළුවන්. online learning සහ e-commerce වැනි නව ක්‍රම වඩාත් ජනප්‍රිය වී තිබෙන අතර ඒ සමඟ මෙහි අවදානම් ස්වරූප ද නිර්මාණය වී තිබෙනවා. තොරතුරු අධික ව පැතිරීම, ව්‍යාජ ප්‍රවෘත්ති සහ පුද්ගලිකත්වයට හානි කරන ගැටලු වැනි අභියෝග ද ඉස්මතු වීම නොවැළැක්විය හැකි තත්ත්වයක්.

ඩිජිටල් සංස්කෘතියේ වැදගත් ම බලපෑමක් වන්නේ පරිශීලකයන්ගේ භූමිකාව වෙනස් වීම. පෙර යුගයේදී මාධ්‍ය පරිභෝජකයන් අක්‍රිය ග්‍රාහකයන් ලෙස පමණක් අන්තර්ගතය ලබා ගත් අතර අද ඔවුන් ක්‍රියා කරන්නේ අන්තර්ගත නිර්මාණකරුවන් ලෙස. ඩිජිටල් සංස්කෘතිය ශ්‍රී ලංකාවේ දේශපාලන හා සමාජ ක්‍රියාකාරකම්වලට ද බලපානවා. සමාජ මාධ්‍ය ඔස්සේ දේශපාලන අදහස් හුවමාරු වීම, මාර්ගගත විරෝධතා (online actinism) සහ විරෝධතා ව්‍යාපාර (Protest movement) සංවිධානය කිරීම පහසු වී ඇති අතර ම ඒ ඔස්සේ ජනතාවට තම අදහස් ප්‍රකාශ කිරීම සඳහා විවෘත වේදිකාවක් නිර්මාණය වීමත් දක්නට පුළුවන්.

ඩිජිටල් සංස්කෘතිය හේතුවෙන් ග්‍රාහකයන් විනෝදය සොයා ගන්නා ආකාරය ද වෙනස්. රූපවාහිනී වැඩසටහන් වෙනුවට YouTube, Netflix· වැනි streaming platforms ජනප්‍රිය වීම, ගීත රස විඳීම සඳහා Apple Music, Sportify මෙන් ම short videos, meme, viral content වැනි නව විනෝදාත්මක ස්වරූප වර්ධනය දක්නට ලැබෙනවා. මෙය ශ්‍රී ලංකාවේ ආර්ථික ක්ෂේත්‍රයට ද සෘජු ව ම බලපානවා. එහිදී e-commerce, online businesses සහ digital marketing වර්ධනය වන්නේ වේගයෙන්. social media marketing ඔස්සේ කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර (SMEs) තම නිෂ්පාදන ප්‍රවර්ධනය සඳහා ඩිජිටල් මාධ්‍ය භාවිතයට විශේෂ නැඹුරුතාවක් දක්වනවා.

තොරතුරු ලබාගැනීමේ ක්‍රියාවලිය වේගවත් හා පහසු වීම, අන්තර්ජාලය ඔස්සේ ලෝකයේ ඕනෑ ම ස්ථානයකින් දැනුම ලබා ගැනීමට ඇති හැකියාව නිසා

**ඩිජිටල් සංස්කෘතියේ වැදගත් ම බලපෑමක් වන්නේ පරිශීලකයන්ගේ භූමිකාව වෙනස් වීම. පෙර යුගයේදී මාධ්‍ය පරිභෝජකයන් අක්‍රිය ග්‍රාහකයන් ලෙස පමණක් අන්තර්ගතය ලබා ගත් අතර අද ඔවුන් ක්‍රියා කරන්නේ අන්තර්ගත නිර්මාණකරුවන් ලෙස. ඩිජිටල් සංස්කෘතිය ශ්‍රී ලංකාවේ දේශපාලන හා සමාජ ක්‍රියාකාරකම්වලට ද බලපානවා.**

සන්නිවේදනය ද වඩා කාර්යක්ෂම වී ඇති අතර සමාජ මාධ්‍ය, email සහ messaging appsවලින් මානව සම්බන්ධතා ශක්තිමත් කර තිබෙනවා. සමාජ සම්බන්ධතා ජාලකරණය පුළුල් වී තිබෙනවා. සමාජ මාධ්‍ය ඔස්සේ විදේශගත ශ්‍රී ලාංකිකයන් සමඟ සම්බන්ධතා පවත්වා ගැනීම දැන් ඉතා ම පහසුයි. අධ්‍යාපන ක්ෂේත්‍රයේදී online learning, virtual classrooms සහ digital resources ඔස්සේ ඉගෙනීමේ අවස්ථා පුළුල් වීම ඩිජිටල් සංස්කෘතියෙහි ධනාත්මක බලපෑම්.

ඩිජිටල් සංස්කෘතිය සමඟ සමාජයට විවිධ අභියෝග හා සෘණාත්මක බලපෑම් ද ඇති වී තිබෙනවා. එහිදී ප්‍රධාන ගැටලුවක් වන්නේ ව්‍යාජ තොරතුරු (fake news) සහ අසත්‍ය ප්‍රචාර වේගයෙන් පැතිරීම. ඒ ඔස්සේ සමාජයේ ව්‍යාකූලතා ඇති වීමට තිබෙන ඉඩකඩ පුළුල්. අන්තර්ජාලයට අධික ලෙස ඇබ්බැහි වීම නිසා කාල කළමනාකරණය දුර්වල වීම සහ මානසික සෞඛ්‍යයට අහිතකර බලපෑම් ද ඇති විය හැකියි. විශේෂයෙන් තරුණ පරපුර අතර මෙහි අධික භාවිතයක් (e·cessive usage) දක්නට ලැබෙනවා. පුද්ගලිකත්වය (privacy) සම්බන්ධ ගැටලු ද වැඩියි. දත්ත සොරකම් කිරීම සහ cyber security අවදානම් ද ඉස්මතු වී තිබෙනවා. සයිබර් හිරිහැර කිරීම (cyberbullying) හා මාර්ගගත හිරිහැර කිරීම් (online harassment) වැනි ගැටලු ද වර්ධනය වී තිබෙන්නේ අලුත් මුහුණුවරකින්.

සමාජ මාධ්‍ය භාවිතය හේතුවෙන් සෘජු භෞතික සමාජ සම්බන්ධතා අඩු වී ඇති අතර සමාජ හුදෙකලාව බහුලයි. ඩිජිටල් බෙදීම (Digital divide) පරිධියේ රටවල ප්‍රබල ගැටලුවක්. ශ්‍රී ලංකාව වැනි රටවල නාගරික ප්‍රදේශවලට වඩා ග්‍රාමීය ප්‍රදේශවල අන්තර්ජාල ප්‍රවේශය සීමිතයි. අදාළ ඩිජිටල් උපාංග මිල අධික වීම නිසා ඒවා සපයා ගැනීමේ ගැටලු ද එම ප්‍රදේශවල පවතිනවා. එහෙත් වැරදි තොරතුරු (Misinformation), පෞද්ගලිකත්ව ගැටලු (Privacy Issues) සහ ඩිජිටල් බෙදීම (Digital divide) ආදිය නිසා මේ පරිවර්තනය සම්පූර්ණයෙන් ම ධනාත්මක නැහැ.

මේ අනුව ඩිජිටල් සංස්කෘතිය යනු සම්පූර්ණයෙන් ම ධනාත්මක හෝ සෘණාත්මක හෝ වන්නක් නොව දෙයාකාරය ම සංගෘහිත සංකීර්ණ සමාජ පරිවර්තනයක්. එය නිවැරදි ව හා වගකීමෙන් භාවිත කළහොත් සමාජ සංවර්ධනයට විශාල දායකත්වයක් ලබාදිය හැකියි. එබැවින් ඩිජිටල් සාක්ෂරතාව (Digital literacy) ඉහළ නැංවීම, මාධ්‍ය නියාමන (Media regulation) ක්‍රමවේද හඳුන්වා දීම සහ තාක්ෂණයේ සදාචාරාත්මක භාවිතය (Ethical use of Technology) වැනි සංකල්ප හඳුන්වා දීම ඉතා වැදගත්.

කෙසේ වෙතත් ඩිජිටල් සංස්කෘතිය ශ්‍රී ලාංකික මාධ්‍ය පරිභෝජනයේ විශාල පරිවර්තනයක් ඇති කර තිබෙන බව පිළිගත යුතු කරුණක්. එබැවින් මේ පරිවර්තනයේ ප්‍රතිලාභ උපරිම කිරීමට සහ අභියෝග අවම කිරීමට නිසි ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හා ඩිජිටල් දැනුවත්භාවය (Digital awareness) ඇති කිරීම ශ්‍රී ලාංකික සමාජයට දැඩි ව අවශ්‍ය වෙනවා.



# අතීතකාමියෙකුගේ සෙලෝලයිඩ් කැරැල්ල

# One Battle After Another

බුවිනාත් අමුගොඩ

මෙවර පැවැත්වුණු (මාර්තු 15) 98 වැනි ඔස්කාර් හෙවත් ඇකඩමි සම්මාන උලෙළේදී One Battle After Another හොඳම චිත්‍රපටය, හොඳම අධ්‍යක්ෂණය, හොඳම සහාය නළුවා ඇතුළු සම්මාන හයකින් පිදුම් ලැබුවා.

මෙහි තිරපිටපත ලියා ඇත්තේ අධ්‍යක්ෂ පෝල් තෝමස් ඇන්ඩර්සන්. 1990දී Thomas Pynchon රචිත Vineland නැමති නවකතාවයි ඊට පාදක වී ඇත්තේ. එහි French 75 නැමැති වාමාංශික ව්‍යාපාරයකට සම්බන්ධ Bob සහ Perfidia නැමැති යුවලක් වසර 16ක් තිස්සේ සැඟ ව සිටිනවා. Perfidia සමග ලිංගික සබඳතාවක් පවත්වන ලද උග්‍ර දක්ෂිණාංශික ව්‍යාපාරයකට සම්බන්ධ Lockjaw නැමැති හමුදා නිලධාරියා තම අතීතය මකා දමනුවස් හඹා යන්නේ Perfidia සහ ඇගේ දියණිය Willa පසුපස. Bob, Wlla ව රැකගනුවස් ගෙන යන අරගලය ඔස්සේ කතාව ඉදිරියට ඇදෙන අතර සිනමාපටය අවසන Willaගේ සැබෑ පියා කවුරුන් ද? යන වග හෙළිදරව් වෙනවා.

චිත්‍රපටය ශානරීය වශයෙන් ගත් කල අයත් වන්නේ අඳුරු ප්‍රහසන (Black Comedy) සහ ක්‍රියාදාම - ත්‍රාසජනක (Action - Thriller ) ප්‍රවර්ගවලට. ඒ අනුව මෙය සාම්ප්‍රදායික කතාවක් නොවන බව පැහැදිලි වන්නක්.

තේමාත්මක වශයෙන් ගත් කල සිනමාපටයෙන් ඇමරිකානු බිමෙහි සංක්‍රමණික ප්‍රශ්නය, සුදු ජාතික ආධිපත්‍යය (White supremacy), පියෙකු සහ දියණියක අතර ඇති බැඳීම යනාදී පුළුල් පරාසයක් ස්පර්ශ කරනවා. වත්මනෙහි ඇමරිකා එක්සත් ජනපද භූමියේ සංක්‍රමණික ගැටලු සහ වාර්ගික අර්බුද ගැන පුළුල් කතාබහක් ගොඩ නැඟී ඇති පසුබිමක පැහැදිලි වන්නේ චිත්‍රපටයේ තේමාව ඊට අනුකූල වීම අහම්බයක් නොවන බව. වාර්ගික ගැටලුව සහ සුදු ජාතික ආධිපත්‍යය සම්බන්ධයෙන් විමසා බැලූ හොලිවුඩ් චිත්‍රපට රැසක් ඇතිමුත් එම සිනමාපට සමඟ බැලූ විට One Battleහි විශේෂත්වයක් දැකිය හැකියි. එනම් Black Comedy යන ශානරය සමඟ ක්‍රියාදාම සහ ත්‍රාසජනක ලක්ෂණ ද මුසු කරමින් ගොතන ලද කතාවක් ඔස්සේ ඉහත දක්වන ලද තේමා සම්බන්ධයෙන් ගැඹුරු කතිකාවක යෙදීම. 2026 වසරේ හොඳම අනුවර්තනීය තිරපිටපතට හිමි ඔස්කාර් සම්මානය හිමිවූයේ ද One Battle වෙත.

සිනමාපටයේ ගෝලීය දේශපාලන සන්දර්භය ඍජු ව කතාබහ වන බව සැබෑවක්. එහෙත් චිත්‍රපට වියමනෙහි යටිපෙළ වෙත පිවිස විමසා බලන්නෙකුට මෙය පුළුල් තිර සිනමාවේ අතීතකාමී ලක්ෂණ රැකගනුවස් අධ්‍යක්ෂවරයා විසින් දියත් කරන ලද ඒක පාර්ශ්වීය මෙහෙයුමක් බව ද තර්ක කළ හැකියි.

වසර 130කට අධික ඉතිහාසයක් ඇති ලෝක සිනමාව විවිධ අවධිවල අර්බුද රැසකට මුහුණ දුන් බව නොරහසක්. කුමන බාධක මධ්‍යයේ වුව ද තවමත් සිනමාවේ පුළුල් තිර අත්දැකීම නොනැසී පවතින අතර ප්‍රේක්ෂකයා සිනමාපට නැරඹීමට සිනමා ශාලා කරා ඇදෙනවා. ඊට හේතුව වන්නේ එම පුළුල් තිර අත්දැකීම විතැන් කිරීමට ශක්‍යවත් මාධ්‍යයක් මෙතෙක් බිහි නොවීම විය හැකියි. විශාල ප්‍රේක්ෂකාගාරයක් තුළ අඳුරේ තනි වෙමින් රිදී තිරය මතින් මැවෙන මායාත්මක අත්දැකීමට ප්‍රේක්ෂකයා තවමත් පෙම් බඳිනවා.

ඩිජිටල් තාක්ෂණයේ ආගමනයත් සමග සිනමාවට මුහුණ දීමට සිදු ව ඇත්තේ නව අභියෝග රැසකට. පුළුල් තිරයට යම් අභියෝගයක් එල්ල කරමින් Home Cinema වැනි සිනමාපට බෙදාහැරීමේ මොඩල ද ස්ථාපිත ව ඇති අතර පරිගණකයට ඍජු ව ම බාගත කිරීමට සහ You Tube වැනි අවකාශ ඔස්සේ චිත්‍රපට නැරඹීමට යොමුව ඇති පිරිසක් ද මේ අතර සිටින බව අමතක කළ නොහැකියි. සාම්ප්‍රදායික සිනමාවට එරෙහි ඩිජිටල් කැරැල්ලක් ක්‍රියාත්මක වෙමින් ඇති අවධියක පෝල් තෝමස් ඇන්ඩර්සන් වැනි සිනමාකරුවන් කැප



වී සිටින්නේ පුළුල් තිරය නොපිහිරී පවත්වාගෙන යාමට. නැතහොත් සිනමා මාධ්‍යයේ දැවැන්ත බව තවදුරටත් පුළුල් කරමින් සෙසු මාධ්‍යවලට සිනමාව පරයා යාමේ ඉඩකඩ අහුරා දැමීමට.

උක්ත අරමුණු සාක්ෂාත් කරගැනීම උදෙසා අධ්‍යක්ෂ පෝල් තෝමස් ඇන්ඩර්සන් උත්සුක වූ අයුරු One Battleහි තාක්ෂණික භාවිතාව ඔස්සේ විමසා බැලූ විට මනාව පැහැදිලි වෙනවා. ඔහු යළිත් කරළියට ගෙනැවිත් ඇත්තේ සිනමාපටයේ Vista Vision සිනමා ඡායාරූප ශිල්පය. මෙහිදී සාමාන්‍ය 35 mm පටලයට සාපේක්ෂ ව දෙගුණයක ක්ෂේත්‍ර ඵලයක් සහ ඉහළ ගුණාත්මක බවකින් යුතු රූප ශ්‍රේණියක් ලබා දෙනවා. One Battleහි රූප රාමුවලින් 75-80%ක ප්‍රමාණයක් රූගත කර ඇත්තේ Vista Vision කැමරාව ආධාරයෙන්. මෙහිදී විශේෂත්වයක් වන්නේ හස්තගත කැමරාවෙන් ලබාගත් ගතික රූපාවලිය. චිත්‍රපටයේ එන ක්‍රියාදාම ජවනිකා (Action Scenes) සහ අවසන් වාහන ලුහුබැඳ යාම (Final Car Chase)හිදී Vista Vision රූප ශ්‍රේණිය මවන්නේ අමුතු ම සිනමාත්මක චමත්කාරයක්.

සිනමාපටය වෙනුවෙන් යොදා ගත් නළු නිළි කැල ද සුවිශේෂ වෙනවා. ප්‍රධාන චරිතය (Bob) නිරූපණය කරන්නේ හොලිවුඩයේ ජනකාන්ත නළු Leonardo DiCaprio. හමුදා නිලධාරි Lockjawගේ චරිතයට පණ පොවන්නේ තවත් විශිෂ්ට රංගන ශිල්පියෙකු වන Sean Penn. Pennට ඒ වෙනුවෙන් මේ වසරේ හොඳම සහාය නළුවාට හිමි ඇකඩමි සම්මානය හිමි වුණා. ඊට අමතර ව Benicio del Toro (Carlos), Regina Hall (Deandra), Teyana Taylor (Perfidia) සහ Chase Infiniti (Willa) සෙසු චරිත නිරූපණය කරනවා. මේ නළු නිළි කැල විමසා බැලූ විට පෙනී යන්නේ අධ්‍යක්ෂවරයා තම කතාව ඉදිරිපත් කිරීමට චරිතවලට අනුකූල ව සිනමාවේ දැවැන්ත නළු නිළි වරණයක් සිදු කර ඇති බව.

චිත්‍රපටය ප්‍රේක්ෂකාගාරය වෙත මුදාහැරීමේදී යොදා ගත් කාර්යාවලිය ද සුවිශේෂ වූවක්. මෙහි ප්‍රථම ප්‍රදර්ශනය පැවැත්වූයේ ලොස් ඇන්ජලීස් නුවර සුප්‍රකට TCL Chinese Theatreහිදී. පසුව මහජන ප්‍රදර්ශනයට මුදාහළ චිත්‍රපටය ලොස් ඇන්ජලීස්හි Vista Theatre මෙන් ම නිව් යෝර්ක්, ලන්ඩන් වැනි නගරවල පිහිටි Vista Vision ප්‍රක්ෂේපණ යන්ත්‍ර සහිත සිනමා ශාලා කිහිපයක තිරගත වූයේ ප්‍රේක්ෂකයා වෙත සුවිශේෂී අත්දැකීමක් තිළිණ කරමින්.





මේ තාක්ෂණික හරඹවලට අමතර ව One Battle යනු අධ්‍යක්ෂවරයා විසින් දියත් කරන ලද සංකල්පීය යුද්ධයක් බව ද තර්ක කළ හැකියි. සිනමාපටය මනාව නිරීක්ෂණය කරන්නෙකුට පසක් වන්නේ එය ප්‍රංශ නව රැල්ලේ ආභාසය ලැබූ බව. එහිදී අපේ මතකයට නැඟෙන්නේ 70 දශකයේ සිනමාව. 1960 දශකයේ ප්‍රංශ බිමේ උත්පත්තිය ලද නව සිනමා ධාරාව ප්‍රංශ නව රැල්ල නමින් හැඳින්වුණු අතර එහි උණුසුම හොලිවුඩය තෙක් පැතිරුණා. ඉන් අනුප්‍රාණය ලද සිනමාකරුවන් හොලිවුඩයේ එතෙක් ස්ථාපිත ව තිබූ නීති රීති කඩා බිඳ දමමින් සිනමාව වෙත ගෙන ආවේ නවමු හැඩයක්. ඉන් උපන් සිනමාව New Hollywood ලෙසයි හැඳින්වූයේ. අධ්‍යක්ෂ පෝල් තෝමස් ඇන්ඩර්සන් French 75 ලෙස ඉඟි කරන්නේ මේ අරගලය. සැබැවින් ම One Battle ඔස්සේ දිග හැරෙන්නේ වත්මන් ඒකාකාරී ඩිජිටල් ආකෘතියට එරෙහි ව ගසන ලද අතීතකාමී රැඩිකල් ප්‍රහාරයක්. මෙය සිනමා කර්තෘ න්‍යාය (Auteur Theory) මත පදනම් වෙමින් Francois Truffaut, Jean- Luc Godard වැන්නවුන් දියත් කළ සිනමා අරගලයේ ම වර්තමාන නිරූපණයක්.

පෝල් තෝමස් ඇන්ඩර්සන් ගෙන එන සංකල්පීය වෙනස ඔහු ඇසුරු කරන විෂය වස්තුව, තේමාව මෙන් ම පඨිතය (Text) ඇසුරින් ද විමසා බැලිය හැකියි. එහිදී Vineland වැනි නවකතාවක් එක එල්ලේ අනුවර්තනය කරනවා වෙනුවට එහි සාරය ගෙන ඊට තමන්ගේ කතාන්දර කොටස් ද මුසු කරමින් තිරපිටපත ලියා තිබෙනවා. කතාවේ ඇතැම් අංග සමහර විචාරකයන්ගේ දෝෂ දර්ශනයට පවා ලක් ව ඇති අතර චිත්‍රපටයට එල්ල වූ ප්‍රධාන චෝදනාවක් වන්නේ ඒ ඔස්සේ අන්තර්වාර්ගික ලිංගික සබඳතාවක් සම්බන්ධයෙන් වැරදි චිත්‍රයක් මැවීමට උත්සාහ ගෙන ඇති බව.

මෙතෙක් ගෙනහැර දක්වන ලද කරුණු අනුව පෙනී යන්නේ One Battle චිත්‍රපටය හුදු දේශපාලන කතාවක් පාදක කරගත් නිර්මාණයකට එහා යන ගැඹුරු කියවීමකට ඉඩ හසර විවර කරවන්නක් බව. එය අධ්‍යක්ෂ පෝල් තෝමස් ඇන්ඩර්සන්ගේ සිනමාවේ සංකල්පීය සහ තාක්ෂණික විප්ලවයක් බව. එම යුද බිමේදී ඔහු රැකගැනීමට උත්සාහ දරන්නේ වියැකෙමින් යන පුළුල් තිර සිනමාත්මක අත්දැකීම.

# මාධ්‍යකරණයේ ආචාරධර්මීය පදනම හා ගැටලු

ප්‍රියාන් ආර් විජේබණ්ඩාර

නූතන සන්නිවේදනයේ භූ දර්ශනය ව්‍යුහගත 'දොරටු පාලක' ආකෘතියක සිට විමධ්‍යගත, ඩිජිටල් ප්‍රමුඛකොටගත් පරිසරයක් දක්වා පරිවර්තනය වී ඇත. මෙම සංක්‍රාන්තිය මධ්‍යයේ ඇත්තේ මාධ්‍ය ආචාරධර්ම පිළිබඳ ගැටලුවයි. තොරතුරු දැන ගැනීමේ අයිතිය සහ ප්‍රකාශනයේ නිදහස මෙන් ම එහි වගකීම සහ ප්‍රජාතන්ත්‍රවාදයට පවත්නා වගවීම කිසිසේත් ම නොතකාහළ හැකි නොවේ. බොහෝ විට කරුණු සත්‍යාපනය අභිභවා යන යුගයක, ආචාරධර්ම ප්‍රමිති ප්‍රායෝගික ව යෙදීම තවදුරටත් වෘත්තීය අනුග්‍රහයක් නොව එය ක්‍රියාකාරී ප්‍රජාතන්ත්‍රවාදයක් සඳහා පැවැත්මේ අවශ්‍යතාවකි.

## මාධ්‍ය වගකීමේ දාර්ශනික පදනම්

මාධ්‍ය ආචාරධර්ම සාම්ප්‍රදායික ව ප්‍රධාන දාර්ශනික රාමු කිහිපයක පදනම් වී ඇත. දේවධර්මවාදී ආචාර ධර්ම (රාජකාරිය මත පදනම් වූ) යෝජනා කරන්නේ මාධ්‍යවේදීන්ට සහ අන්තර්ගත නිර්මාණකරුවන්ට ප්‍රතිවිපාක ඉක්මවා යන සත්‍යයට සදාචාරාත්මක යුතුකමක් ඇති බවයි.

දේවධර්මීය ආචාරධර්ම යනු ක්‍රියාවන් සහජයෙන් ම හරි හෝ වැරදි හෝ වන්නේ ප්‍රතිවිපාක මත නොව නීති, යුතුකම් සහ අභිප්‍රාය මත බව අවධාරණය කරන සදාචාරාත්මක රාමුවකි. ග්‍රීක ඩියොන් (යුතුකම) වෙතින් උපුටා ගත් මෙම න්‍යාය ප්‍රතිඵලය කුමක් වුවත් බොරු නොකියා සිටීම හෝ හානි නොකිරීම හෝ වැනි නිශ්චිත නීති අනුගමනය කිරීමට පුද්ගලයන් සදාචාරාත්මක ව බැඳී සිටින බව පවසයි.

අනෙක් අතට උපයෝගිතාවාදී ආචාරධර්ම සංකල්පයට අනුව 'බහුතරයට ශ්‍රේෂ්ඨතම යහපත' සඳහා තර්ක කරයි. එය මහජන අවශ්‍යතා සඳහා සේවය කරන්නේනම් සංවේදී තොරතුරු ප්‍රකාශයට පත් කිරීම බොහෝ විට සාධාරණීකරණය කරයි.

කෙසේ වෙතත් නූතන අභියෝගය වන්නේ 'වෛෂයික' පරමාදර්ශයේ ඛාදනයයි. ප්‍රවෘත්ති, මතය සහ විනෝදාස්වාදය අතර රේඛාව බොඳ වන විට ආචාරධර්ම වෘත්තිකයා සමාජ වගකීම් න්‍යාය තුලනය කළ යුතු අතර එය ප්‍රකාශ කරන්නේ මාධ්‍යයට දවසේ සිදුවීම් පිළිබඳ සත්‍යවාදී, පුළුල් සහ බුද්ධිමත් වාර්තාවක් සැපයීමට බැඳීමක් ඇති බවයි.

## ඩිජිටල් යුගයේ ප්‍රායෝගික ගැටලු

මූලික මූලධර්ම - නිරවද්‍යතාව, ස්වාධීනත්වය සහ හානිය අවම කිරීම නියත ව පවතින අතර ඒවායේ ප්‍රායෝගික යෙදුම පෙර නොවූවිරූ බාධකවලට මුහුණ දෙයි.

- **'වේගය එදිරි ව නිරවද්‍යතාව' උගුල**

සමාජ මාධ්‍යයෙහි නියැළීමෙන් මෙහෙය වන පැය 24 ප්‍රවෘත්ති චක්‍රයක, පළමු ව වීමට ඇති පීඩනය බොහෝ විට නිවැරදි වීමට ඇති වරම අභිභවා යයි. මෙය වැරදි තොරතුරු පැතිරීමට හේතු වන අතර එහිදී 'ක්ලික්-හරහා' මිනුම් සඳහා සදාචාරාත්මක සත්‍යාපනය කැප කෙරේ.

- **අධි-යථාර්ථය සහ ඩිජිටල් වෙනස් කිරීම**

නවීන AI මෙවලම් සහ ගැඹුරු ව්‍යාජ පැමිණීම 'අධි-යථාර්ථයේ' අර්බුදයක් නිර්මාණය කරයි. සිදුවීමක අනුකරණය, සිදුවීමෙන් වෙන් කර හඳුනාගත නොහැකි තත්ත්වයකි. සදාචාරාත්මක ව මේ සඳහා AI-ජනනය කරන ලද අන්තර්ගතය ලේබල් කිරීම සහ ඩිජිටල් සංස්කරණය දෘශ්‍ය ආඛ්‍යානයක මූලික සත්‍යය විකෘති නොකරන බව සහතික කිරීම සඳහා දැඩි ප්‍රමිතියක් අවශ්‍ය වේ.

## 03.පෞද්ගලිකත්වයේ විරුද්ධාභාසය:

අන්තර් සම්බන්ධිත ලෝකයක, 'මහජන උනන්දුව' බොහෝ විට සංවේදීවාදය සඳහා පලිහක් ලෙස භාවිත කරයි. සාමාන්‍ය පුද්ගලයෙකුගේ රාජකාරි ඉටු කිරීම සහ ඔවුන්ගේ පෞද්ගලික ජීවිතයකට ඇති අයිතිය අතර සීමාව නිර්වචනය කිරීම ක්ෂේත්‍රයේ වඩාත් ම මතභේදාත්මක ප්‍රායෝගික ගැටලුවකි.

- **ආර්ථික පීඩන සහ ස්වදේශීය වෙළෙඳ දැන්වීම්**

සාම්ප්‍රදායික ආදායම් ආකෘති අසාර්ථක වන විට 'අනුග්‍රහය දක්වන අන්තර්ගතය' හෝ 'ස්වදේශීය වෙළෙඳ දැන්වීම්' කතුවැකි ප්‍රවෘත්ති මෙන් පෙනෙන්නට නිර්මාණය කර ඇති අන්තර්ගතය, නැඹීම උනන්දුව පිළිබඳ ගැටුමක් ඇති කරයි. විනිවිදභාවය සඳහා සදාචාරාත්මක අවශ්‍යතාව බොහෝ විට පැවැත්ම සඳහා වාණිජ අවශ්‍යතාවට පටහැනි වේ.

යම් රටක මාධ්‍ය ආචාරධර්ම නොසලකා හරින විට ප්‍රතිඵලය වන්නේ මහජන විශ්වාසය බිඳ වැටීම සහ සමාජ දේශපාලනික ධ්‍රැවීකරණය ඉහළ යාමයි. එබැවින් ප්‍රායෝගික ආචාරධර්ම සඳහා වගවීම සහ විනිවිදභාවය සඳහා කැපවීමක් අවශ්‍ය වේ. ඒ, එකී මාධ්‍ය අන්තර්ගතයේ අවසාන නිෂ්පාදනයේ පමණක් නොව ක්‍රියාවලිය තුළ ම ය.

"අපේ රජයන් ජනතාවගේ මතය වීමේ පදනම, පළමු අරමුණ එම අයිතිය තබා ගැනීම විය යුතු ය; අපට පුවත්පත් නොමැති රජයක් හෝ රජයක් නොමැති පුවත්පත් තිබේද යන්න තීරණය කිරීමට මට ඉතිරි වුවහොත් දෙවැන්නට කැමති වීමට මා මොහොතක්වත් පසුබට නොවිය යුතු ය." තෝමස් ජෙෆර්සන් විසින් පවසන දෑ අරුත අප ගැඹුරින් වටහා ගත යුතු ය.

මාධ්‍ය ආචාරධර්ම යනු ස්ථිතික නීති මාලාවක් නොව ගතික, අඛණ්ඩ සංවාදයකි. තාක්ෂණය අඛණ්ඩ ව පරිණාමය වන විට

ප්‍රායෝගික ගැටලු වඩාත් සංකීර්ණ වනු ඇත, මානව ගරුත්වය සහ බුද්ධිමය අවංකභාවය පිළිබඳ මූලික මූලධර්ම වෙත නැවත පැමිණීම අවශ්‍ය වේ. අවසාන වශයෙන් යහපත් මහජන අවකාශයක පැවැත්ම රඳා පවතින්නේ වඩ වඩාත් ඛණ්ඩනය වන ලෝකයක සත්‍යයේ ස්වාධීන, සදාචාරාත්මක බේරුම්කරුවෙකු ලෙස සිටීමට මාධ්‍යයට ඇති හැකියාව මත ය.

## මාධ්‍ය ආචාරධර්ම හා මාර්ගෝපදේශ

ලෝකයේ පිළිගත් ඕනෑ ම වෘත්තියකට අදාළ ව පවත්නා ආකාරයෙන් මාධ්‍ය වෘත්තිකයන් සඳහා බලපාන ආචාරධර්ම සකස් කර තිබේ. මාධ්‍ය සංදේශ සකස් කිරීමේදී ද විෂයමූලික බව, වගකීම, සාධාරණ බව යන සාධක මුල්කරගනිමින් මේවා සකස් වී ඇත. මෙහි අරමුණ වන්නේ වගකීම්සහගත මාධ්‍ය භාවිතයෙන් යුතු  වෘත්තිකයෙකු බිහි කර ගැනීමයි.

නිරවද්‍යතාව, පුද්ගලිකත්වය, මූලාශ්‍රය හෙළි නොකිරීම සහ පිළිතුරු දීමේ අයිතිය වැනි කරුණු ආචාරධර්ම සංග්‍රහවල දක්නට ලැබෙන ප්‍රධාන වගන්ති ලෙස සැලකිය හැකි ය. ආචාරධර්ම බොහෝ විට සකස් කරනු ලබන්නේ අදාළ වෘත්තියකයන් විසිනි. එයට අනුගත ව ක්‍රියා කිරීම වෘත්තිකයන්ගේ වගකීමකි. ඇතැම් විට නීතිමය බැඳීමක් යටතේ ක්‍රියාත්මක ආචාරධර්ම ද දක්නට ලැබේ. වත්මන් සමාජයේ විවිධ වෘත්තිකයන්ගේ සංවිධානවල අදාළ සාමාජිකත්වයට බලපාන ආචාරධර්ම සංග්‍රහ සකස් කර පවත්වාගෙන යයි.

ආචාරධර්ම මෙන් ම මාධ්‍ය මාර්ගෝපදේශ (Gidelines), මාර්ග දර්ශක ලෙස ද නම් කර ඇති අවස්ථා පවතී. මාධ්‍ය ක්‍රියාවලිය කිසියම් විධිමත් ආකාරයකයට පවත්වාගෙන යාමේ අරමුණින් මාර්ගෝපදේශ සකස් කර තිබේ.

ලෝකයේ ජනමාධ්‍ය ආයතන විසින් තම ආයතනයේ විවිධ වැඩසටහන් වෙනුවෙන් සකස් කරන ලද මාර්ගෝපදේශ පවතී. වැඩසටහන්වල යොදා ගත යුතු භාෂාව, නිවේදන කාර්යභාරය, මූලාශ්‍ර සපයා ගත යුතු ආකාරය යටතේ කරුණු වාර්තා කළ යුතු ආකාරය මෙන් ම මාධ්‍යවේදීන්ගේ පුද්ගලික චර්යාවලට අදාළ කටයුතු සම්බන්ධයෙන් ද මාර්ගෝපදේශ ඉදිරිපත් කර තිබේ. මාධ්‍ය කර්මාන්තයේ පවත්නා ප්‍රවණතා මෙන් ම තාක්ෂණික වර්ධනයට ද ගැළපෙන ආකාරයෙන් මාර්ගෝපදේශ යාවත්කාලීන කෙරේ.

## පුවත්පත් ආචාරධර්ම

1973 අංක 05 දරන ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත යටතේ 1981 වසරේදී පුවත්පත් කලාවේදීන්ට ආචාරධර්ම සංග්‍රහයක් හඳුන්වා දී ඇත. එය සකස් කර ඇත්තේ එවක පුවත්පත්වල ප්‍රධාන සංස්කාරකවරුන් 25 දෙනෙකුගෙන් සමන්විත වූ මණ්ඩලයකිනි. මේ ආචාරධර්ම ගැසට් පත්‍රයක් මඟින් ප්‍රකාශයට පත් කර ඇති බැවින් ඊට නීතිමය බැඳීමක් ද තිබෙන බව පෙන්වාදිය හැකි ය. 2003 වසරේදී ශ්‍රී ලංකා කර්තෘ සංසදයෙන් ද වෘත්තිය මාර්ගෝපදේශ සංග්‍රහයක් ප්‍රකාශයට පත් කෙරිණි. අවස්ථා දෙකකදී යාවත්කාලීන කර ඇති එය පුවත්පත් කලාවේදීන් සඳහා සකස් කළ ස්වයං නියාමන ක්‍රමවේදයක් ලෙස නම් කෙරිණි.

ඊට අමතර ව විවිධ පුවත්පත් තම ආයතනයට පමණක් බලපාන අයුරින් සකස් කර ගත් විවිධ ආචාරධර්ම ක්‍රම හඳුනා ගත හැකි ය. පුවත්පත් වාර්තාකරණයේදී අනුගමනය කළ යුතු පිළිගත් දැන්වීම්, ප්‍රතිපත්ති යනාදිය ඒ අනුව තීරණය කෙරේ.

## ගුවන්විදුලි ආචාරධර්ම

පුද්ගලික ගුවන්විදුලි සේවා සඳහා ස්ථිර ආචාරධර්ම හෝ මාර්ගෝපදේශ සංග්‍රහ හෝ සකස් කර නැත. ඒ සඳහා විවිධ උත්සාහ ගත්ත ද පොදු එකඟතාවකට පැමිණීම අපහසු වීමෙන් ඒවා අතහැර දමා ඇත. 1966 අංක 25 දරන ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථා පනතේ සඳහන් වගන්තිවලට අනුව වැඩසටහන්කරණයේදී අනුගමනය කළ යුතු ක්‍රමවේදය සංස්ථාවේ ගුවන්විදුලි නාලිකාවලට අදාළ මගපෙන්වීම් ලෙස සැලකිය හැකි ය.

ඊට අමතර ව ගුවන්විදුලි වැඩසටහන් සඳහා සකස් කර ඇති හා දැන්වීම් ලබා ගැනීමේදී පිළිපැදිය යුතු පටිපාටිය ද මීට අදාළ ව සලකා බැලිය හැකි ය. ඇතැම් ගුවන්විදුලි නාලිකා තම නාලිකාවට අදාළ ව  ගුවන්විදුලි ආචාරධර්ම හා මාර්ගෝපදේශ සකස් කරගෙන ඇති බව ද හඳුනාගත හැකි ය.

## රූපවාහිනී ආචාරධර්ම

1982 ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනතේ වගන්ති අනුව වැඩසටහන්කරණයට අදාළ කොටස් කිහිපයක් මගපෙන්වීම් ලෙස භාවිත කළ හැකි ය. එමෙන් ම දැන්වීම් ලබා ගැනීමේදී අනුගමනය කරන  මාර්ගෝපදේශ සංග්‍රහයක් ද පවතී. පොදුවේ රූපවාහිනී නාලිකා සඳහා බලපාන ආචාරධර්ම පද්ධතියක අවශ්‍යතාව පවතී.

## නව මාධ්‍ය ආචාරධර්ම

නව මාධ්‍ය ආචාරධර්ම හා මාර්ගෝපදේශ පිළිබඳ ප්‍රබල සංවාදයක් පවතී. එක් එක් වෙබ් අඩවිවල හා සමාජ ජාලවල තමන්ට ගැළපෙන ලෙස සකස් කළ මාර්ගෝපදේශ දැකගත හැකි ය. ඇතැම් රටවල් නව මාධ්‍ය ආචාරධර්ම පිළිබද උනන්දුවක් දක්වයි. නව මාධ්‍ය ඉදිරියේ ආචාරධර්ම පවත්වාගෙන යාම පිළිබඳ ගැටලුවක් හටගෙන ඇත. ඊට හේතුව නව මාධ්‍ය නියාමනය අපහසු බැවිනි.




# බලය පරයන ජවය

රා. මු. නිශ්ශංක

ලෝක කුසලාන පාපන්දු තරගාවලිය ආරම්භ වීමට නියමිත ව ඇත්තේ 2016 ජූනි 11 දින සැලසුම් කර තිබෙන සමාරම්භක උත්සවයෙන්. එහෙත් තරගාවලිය සම්බන්ධයෙන් ඇත්තේ දැඩි අවිනිශ්චිතභාවයක්. ලෝක කුසලානය පැවැත්වෙන රටක් වන ඇමරිකා එක්සත් ජනපදය, ඉරානය සමඟ යුදමය ගැටුමකට මැදි ව සිටීම එම රටවල් දෙකට සීමා නොවුණු ලෝකයට ම බලපාන ගැටලුවක්.

මැදපෙරදිග ගැටුම් සහ ගුවන් ගමන් සීමා කිරීම හේතුවෙන් තරගාවලිය නැරඹීමට පැමිණෙන ජාත්‍යන්තර ප්‍රේක්ෂකයන් සංඛ්‍යාව සැලකිය යුතු ලෙස අඩු විය හැකි බව පෙන්වා දුන්නත් ඉතිහාසයේ වැඩි ම ප්‍රවේශ පත්‍ර අලෙවිය මේ වන විටත් සිදු ව ඇති බවයි ජාත්‍යන්තර පාපන්දු සම්මේලනයේ ආරංචි මාර්ග පෙන්වා දෙන්නේ. මෙතෙක් පැවති විවිධ අදියර යටතේ ටිකට්පත් මිලියන 3කට වඩා වැඩි සංඛ්‍යාවක් අලෙවි වී ඇති බව වාර්තා වෙනවා. මින් මිලියන 2ක් පමණ පසුගිය වසර අවසානයේ අලෙවි වූ අතර තවත් මිලියනයකට වඩා වැඩි සංඛ්‍යාවක් 2026 වසර මුලදී අලෙවි වී ඇති බවයි එම වාර්තා පෙන්වා දෙන්නේ. අධික ඉල්ලුම හේතුවෙන් අවසන් මහා තරගයේ ප්‍රවේශ පත්‍රයක මිල ඩොලර් 10,000 (රුපියල් ලක්ෂ 30ක් පමණ) ඉක්මවා ගොස් ඇති බව ජාත්‍යන්තර මාධ්‍ය ඔස්සේ වාර්තා වන අතර 1994 වසරේ ඇමරිකාවේ පැවති ලෝක කුසලානයේ තැබූ මිලියන 3.5ක ප්‍රේක්ෂක සහභාගිත්ව වාර්තාව මෙවර බිඳ හෙළනු ඇතැයි ද FIFA ආයතනය අපේක්ෂා කරනවා. සමස්තයක් ලෙස තරගාවලිය පුරා මිලියන 5කට අධික ප්‍රේක්ෂක පිරිසක් ක්‍රීඩාංගණ වෙත පැමිණෙනු ඇතැයි යන්නයි ඔවුන්ගේ අපේක්ෂාව.

ක්‍රිකට් ආගමක් බඳු වන අතර ක්‍රීඩා කරමින් සහ නරඹමින් එය අදහන පිරිසක් සිටිනවා. බොහෝ පාපන්දු විශිෂ්ටයන්ගේ කෝටිපති ජීවිත ආරම්භ වී ඇත්තේ දරිද්‍රතාවේ පතුලේ සිට. ඒ නිසා ජීවිතය වෙනස් කළ හැකි ශක්‍යතාවක් ඇති දර්ශනයක් තරමට ඒ ජීවිතවල ඇත්ත කතා මිනිස්සුන්ට ලබාදෙන ආදර්ශය ද නිසා පාපන්දු යනු ජීවන චක්‍රය වෙනස් කරන විප්ලවයක් ලෙස සිතිය හැකියි. මේ ගැන පෙලේ, මැරඩෝනා සිට මෙසී, රොනාල්ඩෝ දක්වා වන සියලු පාපන්දු දෙවිවරුන් ලෙස ප්‍රෙක්ෂකයන්ගේ ආදරයට පමණක් නොව භක්තියට ද බඳුන් වන ජීවිත කතාවලට එබීමෙන් තහවුරු කර ගන්නට පුළුවන්.

මේ ආශ්චර්යය සහ ආකර්ෂණය යන කාරණා පැවසුවේ පවතින තත්ත්වය තුළ වෙඩි බෝම්බ මැදින් පාපන්දුවේ බලාපොරොත්තුවලට එම ජාතික සංචිත පණ දෙමින් සිටින තත්ත්වය ද නිදසුන් ලෙස ගනිමින්. ඉරානය පමණක් නොව මැදපෙරදිග ම පිරී තිබෙන්නේ යුද්ධයේ පීඩිතයන්ගෙන්. එවැනි තත්ත්වයක මැදපෙරදිග රටවල් මෙන් ම යුද්ධයේ ආසන්න ඉලක්කයක් ව පවතින තුර්කිය ද වසර 24කට පසු ලෝක කුසලාන තරගාවලියට සුදුසුකම් ලබා තිබෙනවා.

එහිදී ඉරානය: 'G' කාණ්ඩයෙන්, ඉරාකය: 'I' කාණ්ඩයෙන් (ලෝක කුසලානයට සුදුසුකම් ලැබූ 48 වැනි සහ අවසාන කණ්ඩායම), සෞදි අරාබිය: 'H' කාණ්ඩයෙන්, කටාර්: 'E' කාණ්ඩයෙන්, ජෝර්දානය: 'J' කාණ්ඩයෙන් (මංගල ලෝක කුසලාන සහභාගිත්වය), ඊජිප්තුව: 'G' කාණ්ඩයෙන්, මොරොක්කෝව: 'C' කාණ්ඩයෙන්, ටියුනීසියාව'F' කාණ්ඩයෙන්, තුර්කිය; 'D' කාණ්ඩයෙන් තරගාවලියට එක්වෙනු ඇති.

යුද්ධයේ පාර්ශ්වකරුවෙකු වන ඉරානයට සියලු තරගවලට මුහුණදෙන්නට සිදු වී තිබෙන්නේ සිය ප්‍රතිවාදියා වන ඇමරිකාවේදී ම. මූලික තරගවලදී ඉරානය සහ නවසීලන්තය 2026 ජූනි 15 (ශ්‍රී ලංකා වේලාවෙන් ජූනි 16 අලුයම) කැලිෆෝනියාවේ ඉන්ගල්වුඩ්හි SoFi ක්‍රීඩාංගණයේදී (Los Angeles Stadium) ද ඉරානය සහ බෙල්ජියම 2026 ජූනි 21 (ශ්‍රී ලංකා වේලාවෙන් ජූනි 22 අලුයම) එම

ක්‍රීඩාංගණයේදී ම ද ඉරානය සහ ඊජිප්තුව 2026 ජූනි 26 (ශ්‍රී ලංකා වේලාවෙන් ජූනි 27 උදෑසන) වොෂින්ටන්හි සියැටල්හි Lumen Field ක්‍රීඩාංගණයේදී (Seattle Stadium) ද තරග වදිනු ඇති.

මේ සියල්ල සූදානම් ව තිබුණත් ඉරානය පැමිණෙනවාට ඇමරිකාව විරුද්ධ බවයි දැන් හඟවන්නේ. ඇමරිකානු ජනාධිපති ට්‍රම්ප් ඉරානය ගැන අකමැත්ත ප්‍රකාශ කරන්නේ මවා ගත් කරුණාවක් සහ ආදරයක් ද සහිත ව. ඒ, ඔවුන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන්. එහෙත් ලෝක පාපන්දු සභාපති ගියානි ඉන්ෆැන්ටිනෝ (Gianni Infantino) අවධාරණය කර ඇත්තේ මැදපෙරදිග පවතින යුදමය වාතාවරණය හමුවේ වුවත් ඉරාන කණ්ඩායම සැලසුම් කළ පරිදි ම 2026 ලෝක කුසලාන තරගාවලියට ඇමරිකාවේදී ම සහභාගි විය යුතු බව. ඉරාන කණ්ඩායමේ තරග ඇමෙරිකාවෙන් බැහැර කර මෙක්සිකෝවට ලබාදෙන ලෙස ඉරානය කළ ඉල්ලීම ඔහු ප්‍රතික්ෂේප කර තිබෙනවා. තරගාවලිය සඳහා ඇත්තේ එක් සැලසුමක් (Plan A) පමණක් බවත් එය නිල කාලසටහනට අනුව ඇමෙරිකාවේදී පැවැත්වෙන බවත් ඔහු පෙන්වා දී තිබෙනවා.

ඒ අනුව ඉරාන කණ්ඩායමට තරගාවලිය සඳහා සූදානම් වීමට අවශ්‍ය උපරිම පහසුකම් සැලසීමට FIFA ආයතනය කැප වී සිටින බව ගියානි ඉන්ෆැන්ටිනෝ තුර්කියේදී ඉරාන ක්‍රීඩකයන් හමුවූ අවස්ථාවේ ප්‍රකාශ කළා. FIFA ආයතනය දේශපාලන කරුණු ලුහුබැඳ නොයන බවත් ක්‍රීඩාවෙන් මිනිසුන් එක්සත් කිරීම තම අරමුණ බවත් ඔහු පෙන්වා දුන්නා. ඉරාන කණ්ඩායම ඇමෙරිකාවට පැමිණ තරග කිරීමට අවසර දෙන බවට ඇමරිකානු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් තමාට සහතික වී ඇති බවත් ගියානි ප්‍රකාශ කර තිබෙනවා.

ඔහු රටවල් 211ක පාපන්දුවේ නායකයා. ට්‍රම්ප් බලය විහිදුවා හැසිරුණ ද එක රටකට අයත් නායකයෙක්. ලෝකය ආවරණය වන සංවිධාන ව්‍යුහයක නායකයන් මේ තනි රටවල නායකයන්ට අවනත වන්නේ නැති අතර ඔවුන් සිය ඉසව්ව තමන්ගේ අවශ්‍යතාවට අනුව අදාළ රටේ නායකයා කළ යුතු බව කිව හැකි ප්‍රබල බලපෑම් සහගත මට්ටමක සිටිනවා. ට්‍රම්ප් පමණක් නොව ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුව සමඟ හැප්පෙන්නට පැමිණි රුසියානු නායක පුටින්ට ද සිට රටේ ධජය දැන් ඔලිම්පික් උලෙළ ගණනාවක ඉහළට ඔසවන්නට ඉඩ ලැබුණේ නැහැ.

ලෝකයේ බිලියන 3.5 සිට 4 දක්වා පරාසයක වැඩි ම ප්‍රේක්ෂක පිරිසක් පාපන්දු ක්‍රීඩාව සමඟ සිටින බව විශ්වාස කරන අතර එය මෙවර ලෝක කුසලානය වන විට බිලියන 6ක් පමණ වනු ඇතැයි ද විශ්වාසය පළ වී තිබෙනවා. ඒ නිසා හදවතින් ම පාපන්දුව වැලඳගත් ලෝකයේ වැඩි ම ප්‍රේක්ෂක ආදරය දිනා ගත් ක්‍රීඩාව සමඟ හැප්පෙන්න ට්‍රම්ප්ට පහසු නැහැ. ලෝක කුසලාන තරගාවලිය අසාර්ථක කළ නායකයා හැටියට ඔහුට විශාල අවමානයක් විඳින්නට ඉඩ ලැබෙනු ඇති.

> බොහෝ පාපන්දු විශිෂ්ටයන්ගේ කෝටිපති ජීවිත ආරම්භ වී ඇත්තේ දරිද්‍රතාවේ පතුලේ සිට. ඒ නිසා ජීවිතය වෙනස් කළ හැකි ශක්‍යතාවක් ඇති දර්ශනයක් තරමට ඒ ජීවිතවල ඇත්ත කතා මිනිස්සුන්ට ලබාදෙන ආදර්ශය ද නිසා පාපන්දු යනු ජීවන චක්‍රය වෙනස් කරන විප්ලවයක් ලෙස සිතිය හැකියි. මේ ගැන පෙලේ, මැරඩෝනා සිට මෙසී, රොනාල්ඩෝ දක්වා වන සියලු පාපන්දු දෙවිවරුන් ලෙස ප්‍රෙක්ෂකයන්ගේ ආදරයට පමණක් නොව භක්තියට ද බඳුන් වන ජීවිත කතාවලට එබීමෙන් තහවුරු කර ගන්නට පුළුවන්.

මේ සියලු යුද්ධ අතරේ සහභාගිත්වයේ අවිනිශ්චිතභාවයට දහසක් හේතු තිබියදීත් ඉරානය යුද්ධයෙන් පාපන්දු ක්‍රීඩකයන්ට වන බාධාව වළක්වමින් තුර්කියේ පුහුණුවේ යෙදී සිටිනවා. සිය ඥාතීන්ගේ, හිතවතුන්ගේ ජීවිත අනතුරක තිබෙන බව දැන දැනත් පුහුණුවෙන ඔවුන් සෑහෙන ශාරීරික නොවුණත් යහපත් මට්ටමක සිටින බව ඉරාන පුහුණුකරු පවසනවා. ඔවුන්ගේ සුපිරි ක්‍රීඩකයන් වන අලි රීසා ජහන්බක්ෂ් සහ මෙහ්දි තාරෙමි ද මේ වන විට පුහුණු සංචිතය සමඟ එක් ව සිටින බවයි දැන ගන්නට ලැබෙන්නේ.

ඉරානය සටන් වදින්නේ ආගමික මතවාදයක් පොරවාගෙන. ඊට විරුද්ධ වීමෙන් සහ ට්‍රම්ප්ගේ ලැදියාවෙන් ද පෙනෙන්නේ ආගමික පසුබිමක කතාවක්. එහෙත් පාපන්දු සෑම ආගමකට ම සම්බන්ධ අයට ආගමක්. ඒ නිසා ම දවස් ගණනක් දුක් විඳිමින් ඉරානය ලෝක කුසලානයට සුදුසුකම් ලැබීමේ තරගයට පැමිණ බොස්නියාව පරාජය කරමින් ලෝක කුසලාන තරගාවලිය නියෝජනය කරන්නට අවසානයට ඇතුළත් වන කණ්ඩායම වුණා. ඒ නිසා පාපන්දු ක්‍රීඩකයා යුද්ධ දහසක් තිබුණත් ලෝක කුසලාන තරගාවලියට එන අදහස අත්හැර නොගන්නා බව සහතික කරුණක්. ඒ සහතිකයට පදනම් වන වුවමනාව වෙනුවෙන් ඔවුන් පසු නොබසිනු ඇති.

යුද්ධය පරාජය කළ හැකි, වෛරය පරාජය කළ හැකි මිත්‍රත්වයේ, ආදරයේ අවිය ලෙස පාපන්දු බලකාමීත්වයට එරෙහි ව එල්ල කරන ගෝලය තද එකක් වනු ඇති. ගියානි, ට්‍රම්ප්ට වඩා ප්‍රබලයෙක් බව මේ වන විට සුදුසුකම් ලබා සිටින සියලු ම ප්‍රබලයන් ඔප්පු කළහොත් ක්‍රීඩාව ඉදිරියේ ට්‍රම්ප්ට පසු බසින්නට සිදු වීම නොවැළැක්විය හැකි වනු ඇති.



# අත් නොහැර...

ඉතා දිගු කාලයක් අවස්ථාවාදී දේශපාලනයේ ගොදුරු බවට පත් ව කුමන පාලකයා හමුවේ වුව ඇමති ධුර ලබා ගන්නා නායකයන් වෙනුවෙන් ජීවිතය ම කැප කළ මිනිසුන්ට ඉතිහාසයේ ඉහළ ම වැටුප් වර්ධකය ලබාදෙමින්, ඔවුන්ගේ ඉඩම්-නිවාස ගැටලුවලට පිළියම් යොදමින් සිටින, මිනිස්කම හඳුනන සැබෑ නායකයා හමු වූ මොහොත. නුවරඑළිය මැයි දින රැලියේ ළෙන්ගතුකම.


දෙසතිය පුවත් සඟරාව

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයක්

www.dgi.gov.lk www.news.lk

පුවත් සඟරාවක් ලෙස ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇත

Department of Government Information

news.lk

GFU Sri Lanka

Rs. 100/-